
Saturday, January 11, 2014
12:15 PM



# ආයු

මනෝරි සිලිකා වික්‍රමආරච්චි

ප්‍රථම මුද්‍රණය - 2013

ISBN : 978-955-53584-0-3

පරිගණක මෙහෙයවීම
Diwi Creators,
53/4, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ.

කවර නිර්මාණය : විවියන්ති බලංගොඩ - 0716-784785

මුද්‍රණය : RK ප්‍රින්ටර්ස්, 223/C ,ඉහළයාගොඩ,
ඉඹුල්ගොඩ.

ප්‍රකාශනය හා බෙදාහැරීම
16/1, ,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ගොරකපිටිය, පිළියන්දල.
දුර : 0771-272029

# ආයු

**සිලිකා ප්‍රකාශන**

16/1,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ගොරකපිටිය,
පිළියන්දල

The Reader's Place Novel
e-Book
The Spirit of Sri Lankan e-community
http://e-pusthakalaya.blogspot.com

## කතුවරියගේ කෘති

### නවකතා

- හමුවූයේ වෙන්වන්නද 1,2,3,4
- හන්තාන සිහිනේ 1,2
- සතහා මියගියාය
- අපිට අපි හරි ආදරෙයි
- සංසුන් ප්‍රාර්ථනා
- සුලෝචනා
- පිං මදිවද මං පිපුණේ
- පෙති නැති මල මම
- ඔබ අසම සමයි
- ඔබ සඳකි කළුවරයි මම
- සෙනෙහා
- මල් පොහොට්ටු
- නාඩං දාස්පෙති 1,2
- මුතු පබලු ඉගිරි (ළඟදීම)
- වැහි කිරිල්ලි
- රන්මුතු
- පිච්චමලී
- භූමි
- දෙනුවන් අද්දර
- ශෝබා
- නිමිතා
- ඔබ අනන්තයි
- සෙනෙහස පහනක් 1, 2
- සඳ ලබන්නී මා
- අකම්පා
- අනෝරා
- මහමෙර සේ
- පනම් දහස්වර
- දිනෙතුා
- ආලකා
- ආදර සුස්මි
- ආදරය ඔබ (ළඟදීම)
- හෝත්‍රාවී (ළඟදීම)
- දුක් ගීයක් (ළඟදීම)
- රතු (ළඟදීම)
- දුහුවිලි සේමා
- වාපි (ළඟදීම)
- ආදරෙයි තවමත්
- උපනුපන්ජාති

### කෙටිකතා

- සමාකරන් මට (2000 - යොවුන සම්මාන ප්‍රථම ස්ථානය)

කාව්‍ය - • මගේ පණ ඔබ
• ඔබට මා මිස

විශේෂාංග - • පාරමිතා

ළමා - • Beautiful Rhymes

අධ්‍යාපන - • 3, 4, 5 පරිසර ගැටලු

http://e-pusthakalaya.blogspot.com

ලේඛකයා යනු අමුතු ඇස් දෙකකින් ලෝකය දකින්නාද නොවේ නම් සත්‍ය සත්‍ය ලෙසින් දකින්නාද මම මගෙන් විමසමි. බොහෝ විට සත්‍ය ලියන්න වෙහෙසුන මම ඒ සත්‍ය දුකින් අවසන් වනවා දක්කෙමි. ලේඛකයාගේ යුතුකම ජීවන් වන්නට - ජීවිතය අලුතින් දකින්නට පාඨකයාට අලුත් මනසක් ලබාදීම බව ඇත්තය. ඒත් මගෙන් සත්‍ය නම ජීවිත අත්දැකීම් ලියා දෙන්න කී තරුණියන්ගේ ජීවිත කතා රසයෙන් නොවේ දුකෙන් අහවර විය.

ඉතිං මම මෙවර දුක සතුටකට ගේන්නට උත්සාහ කළෙමි. දේශපාලනය ගැන කිසිදු පක්ෂපාතීත්වයක් නැති ලේඛිකාවක හැටියට මට පෞද්ගලික වෛරයක් නැති බව ලියමි. මෙය හුදෙක් කතාවක්ම පමණි.

*මනෝරි සිලිකා වික්‍රමආරච්චි*
16/1,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ගොරකපිටිය,
පිළියන්දල.
0771-272029.

# පිදුම...

මහත්මා දේශපාලනයක්
නැති රටක....
තර්ජන, ගර්ජන,
පාතාල,
වෙඩි උණ්ඩ...
නැතිව...
දේශපාලනය කරනා
මහත්මා දේශපාලකයෙකුට....

http://e-pusthakalaya.blogspot.com

මහ කලුවර රෑ තියක්
මං ඇහැරං ඉන්නවාද...?
මේ සීතල කඳුළු බිංදු
ඔබට තාම දැනෙනවාද...?

හීන මතක පොතක් දිගේ
මං ඇහැරන් යනවා...
මේ හැම පිටුවක්ම අගේ
ඔබ ඇවිදින් එනවා...

මගෙ පණ නුඹ නුඹෙ පණත්
තාමත් මං නේද...?
දුරක රටක හිටියත් මං
තාමත් නුඹෙ නේද...?

ඇසිපිය සල සල සලමින්
ළඟින් හිටිය කාලේ
මා ගැන සෙවී බැලූ කෙනෙක්
සිටියද නුඹ වාගේ......

අතීතයේ දුක තිබුණත්
ඒ දුක සැපතක් නොමේද...?
සැප සම්පත් කුමටද මට
මා කැඳල්ලෙ නැතිව නේද..?

පාලුව මහ කාංසියක්
දැනෙනවා ජීවිතයේ...
තනිවම ජීවත් වෙන්නට නම්...
කිම නුඹ හමුවූයේ

හමුවූයේ වෙන්වන්නට
එහෙම නොමෙයි නේද...?
ඉක්මනටම මං එන්නං
දැන් සතුටුයි නේද...?

දහස්පෙතිය... රෝස මලට
තනි නෑ හිරු හින්දා...
පිදූ පියුම් රකියි නුඹව
හිනහෙනු මං නැතිදා...

සැනසෙන්නට නැළවෙන්නට
එක දවසක් ආයේ...
ජීවත්වෙමි නුඹ එනකං
කඳුළු තියන් දෑසේ...

හමුවීම... වෙන්වීම

අතර කාලයේ...

මම මහා දිගු ජීවිතයක් දුක්කෙමි...

ආලය...

මහා ලෝභ කමකින්

වැළඳගත් පාපය මිස...

මා

අන් පවක් කළේ නැත...

නමුත්,

කෙලෙස් නම් කෙලෙස්මය...

අත්හැර ගන්නට බැරි තරම

අල්වා ගත් වරදට...

ඉතිං මම... වන්දිගෙවීමි...

දුන් ඉතිං...

හෙට මිය ගියත් මට දුක නැත.

හේතුව...

මම අත්හලෙමි....

(01)

## "ආලයට ආයුබෝවන් ....

මම යළි වරක් ඉහළට ඇදීයන ගුවන්යානයේ සිට මගේ රටේම දෙස බැලුවෙමි. ගානුක මගේ අතැඟිලි ඔහු අත තැබුවේය. උණුසුමක් සීතලක් දැනුණේ නැති තරම්ය. දැනුනේ වේදනාවය ඉකි බිඳ බිඳ හඬන්නට සිතුනත් මම නොහැඩුවෙමි. සෙමින් ගානුකගේ උරහිස මත්තේ මම හිස තබා ගත්තෙමි.

"අහන් ඉන්න...

අහගෙන ඉන්න...

මගෙ හිත මොනවද...

මුමුණනවා...."

සියල්ල අවසන්. ඔව් සියල්ලදෙයම අවසන්. ගුවන්යානයෙන් පැන මියෙන්න මට සිතෙයි. අතැර ආවේ සුළු පටු දේ නොවේ.

http://e-pusthakalaya.blogspot.com

මගේ කුසින් වැදූ මගේ අසරණ දරු දෙන්නා... අනේ අම්මා නැති ලෝකය ඔවුනට කොහොම දැනේවිද? පව්කාර කමක් කළා වාගේ දැනේ. දරුවන් නැතිව ඊළඟ දවස ගෙවන්නේ කොහොමද? මගේ දෙඅත් දෙතොල් ගැහෙයි.

"අනේ මගේ දරුවො..."

මට කියවිණි. ශානුක කිසිවක් නොකියා මා අත තද කරගත්තා විතරය. මේ ජීවත්වීමට වඩා ජීවිතය අතහැර දමීමා නම් හොඳ නොවේදැයි මට සිතිණි. 'අම්මා' කියා හඩන පුංචි 'හිතු' සිහිව මගේ දෑස තෙත්විය.

"විදෝනව නේද."

ශානුක ඇසුවේය.

"ඔව්."

මා කියා ගත්තේ මටය.

"තීරණ ගත්තේ ඔයාමයි ආශු..."

ශානුක කීවේය. ඇත්තය. කිසිවෙකුට දොස් පවරා එලක් නැත. වරද තලේ මාමය. සියලු තීරණ මගේමය.

ඒ නිසා මේ දඬුවම් මටය. ඒත්... මගේ දරුවන් දඬුවම විඳින්නේ ඇයි? මම දෑස පියවමි... අතීතය... එය රසද... නීරසද මා දන්නේ නැත. දුකද... සතුටද එකට එක හා සමානව ලද හෙයින් අත්දැකීම් ජීවිතය උස්වූ කන්දක් මත හිඳවාලුවේය. ඒත් විනාශවී ගිය මගේ ජීවිතය උදුරාගෙන ආයේ එය ගලින් තෙලන්නට මම



http://e-pusthakalaya.blogspot.com



මේ රැගෙන යන්නෙමි. අතීතයේදී මැටියෙන් අඹා තිබූ කැබලි කැබලිවලට විනාශ වී ගිය මගේ ජීවිතය... කෙබඳු එකක්දැයි කියනු කැමැත්තෙමි.

* * * * * * *

අවුරුදු විසිදෙකක කෙල්ලක්. නැහැ වැරදුන ගෑනියක්. ඒ වයසෙදි කණවැන්දුම් වෙයි කියන බයක් හිතට ඇතුලු වුණ නිසා නෙමේ මේ අඬන්නෙ. ඇස්වලට කඳුළු වැඩිවෙලත් නෙමේ. මගෙ ශානුක. ශානුක වීරක්කොඩි. දක්ෂ... පළපුරුදු... කාගෙත් සැලකිල්ලට පාත්‍ර වුණු ශානුක. මගේ සැමියා. එයා අතුරුදහන් වෙලා.

"මේක විපක්ෂයෙ වැඩක් කියලයි හැමෝම කියන්නෙ."

"ඒත් විපක්ෂය කියන්නෙ රජයෙන් කළා කියල..."

"ඇයි භූපති සූරියපෙරුම ඇමතිතුමා කෝටිපති ව්‍යාපාරිකයෙකුත් අල්ලගෙන කරපු හොර මැර ජඩකම් ටික එළිකළානෙ..."

"ඕක තමයි විපක්ෂයත් කියන්නෙ. ඒ උනාට භූපතිගෙ විතරයැ. විපක්ෂයෙ කුමාරසිරි බණ්ඩාරගෙ ගණිකා මඩම් ටිකයි... මිනීමැරුම් ටිකයි සේරම අහුඋනානෙ. මේ සේරම ශානුකගෙ දක්ෂකම්.

ගෙදර වෙනමම දේශපාලන සාකච්ඡාවක්. අම්මා කාමරේට වෙලා අඬනවා. තාත්තා ගෙදරට එන අය එක්ක දේශපාලන කතා.

ශානුක ගැන මොකක්ම හරි තොරතුරක් ලැබෙයි කියල මං රූපවාහිනිය දාගෙන හිටියෙ. හැම චැනල් එකකම ශානුක වීරක්කොඩිගෙ අතුරු දන් වීම ගැන කතාකරනවා.

"කසාද බැඳල අවුරුද්දයි. මගෙ කොල්ල නැතිවුණා. පෙනේද තියෙන මූසලකම."

ඒ හඬ සවන්පත් දෙදරා යන තරම් උස්ව ඇසිණි. මම වහා රූපවාහිනිය ක්‍රියා විරහිත කළෙමි.

"හඳහන් ගැලපුනාට මේ කසාදෙ කරන්න එපා කියල කිරිවත්තුඩුවෙ ගුරුන්නාන්සෙ කිව්වා. පෙනේද කී දේ එහෙමම වුණා."

ඇස් වලින් කඳුළු ගැලීම වැඩිවිය. මට කියා මගේ කෙනෙක් මේ විසල් ගේ වහළය යට උන්නා නම් ඒ ඔහු විතරය. ශානුක විතරමය.

"අපේ එකාටත් දක්ක ගමන් මේකම ඕන කිව්වනෙ. නැත්නම් මොනතරම් හොඳ පවුල් වලින් යෝජනා තිබුණද."

උස් හඬවල්, ශානුකගෙ අම්මාගෙ... නැන්දගෙ... ලොකු අම්මගෙ. නෑදෑ පරපුරම එක පැත්තක්. මං තනියම. මං තනියම. ජීවිතේ දිනුවද පරාද උනාද?

ශානුක වීරක්කොඩිගේ ඇගේ එල්ලීමේ උවමනාවක් මට වුයේම නැත. මම ඔහුට පෙම්කළෙමි. ඒත් මගේ දෙමාපියන් ඔහුගේත් මගේත් ප්‍රේමය පිළිගත්තේ නැත. දෙමාපියන්ගේ එකම දුව හැටියට මම මගේ ප්‍රේමය දත් දුන්නෙමි.



http://e-pusthakalaya.blogspot.com



"මට නම් හිතා ගන්නවත් බෑ. උඹ ඔහුව අමතක කළා කියලා."

මා ඔහුව අමතක කළා නොවේ. මගේ ජීවිතය ගැන තීරණයක් ගන්නට ඔහුගේ ආර්ථික අතින් යහපත් තත්වයක උන්නේ නැත. ඉතිං මම පරාජය භාරගත්තෙමි.

ශානුක වීරක්කොඩි කෙතරම් හොඳදැයි කියන්න මා ළඟ වචන තිබුණේ නැත. ඔහු ඔහුගේ ජීවිතයේ මුල්ම ඉඩ දුන්නේ මටය. ඔහු හදවතින් මා සමඟ ජීවත් විය. අප විවාහ වී තවමත් එක් වසරකි. ඒත් ඒ වසර තුළ මම ඔහුව දැඩිව විශ්වාස කළෙමි.

"ඔබ ඔබ කෙරෙහි දැඩි විශ්වාසය තබාගත යුතුයි. හරිහැටි කෑමක් බීමක් නැතිව අනාථයකු හැටියට මහමග ඉබාගාතේ ඇවිදගිය අවධියේත් මා ලෝකයේ හොඳම නළුවන් අතරින් කෙනෙකුය යන හැඟීම මා තුළ බලපෑවා. මගේ ජයග්‍රහණයට හේතු වුයේ විධිමත්ව පෝෂණය වූ ආත්ම විශ්වාසයයි." එය චාලි චැප්ලින්ගේ කියමනකි. මේ වෙලාවේ ජීවත්වීමටත් අවටින් පැමිණෙන්නා වූ දෝෂාරෝපණත්, නින්දා අපහාස ඉවසීමට ධෛර්යයත් මම මා තුළින්ම නංවාගෙන උන්නෙමි. ගේ ඇතුළේම කාමරය අතුළේම හිඳ දෙමසකට වඩා ගෙවීණි.

"කාමරේ ඇතුලටම වෙලා ඉන්නෙ නැතුව වැඩක් කරගන්න දරුවෝ..."

මේ විසල් නිවස තුළ මා ගැන තරමක් උණුවෙන සිතක් ඇතිබව මම පසුව වටහා ගත්තෙමි. ඒ ශානුකගේ අත්තම්මාගේය. මා මිදුලට බැස්සේ ඇගේ හිත රිදවන්න බැරිකමටය.

"දුකින් නේද හොඳටම."

ඔව් කියන්න මම හිස සැලුවෙමි.

"පොඩි කාලෙ ඉඳන්ම චූටිපුතා හරිම අහිංසක දරුවා ඒ දරුව දිහා දෙවියොම බලාවි."

"හිඩිම හොරකුරක් නැතෙ අත්තම්මා."

"හ්ම..."

"මේ සේරටම වැරදි මං මංද."

"මොන... ඔය දරිවී... පිස්සු හැදිලද. අර අපේ දුව බොරුවට කියන ඒව ගන්නද හිතට. එයා දුවට හිතවත්කමක් නැතුව නෙමේ. චූටි පුතා ගැන වේදනාව... හිතට අමාරුව."

අත්තම්මා කීවාය. හිතට අමාරුව මට වඩා අම්මාවූ ඇයටද, ඇයට වඩා කිරිද වූ මටද? සෙවීම නොවටී. එය එතරම්ම වේදනාවක් බව පිළිගතයුතුය. කාලයට විසඳිය නොහැකි පැනයක් නැත. කාලය ඉදිරියේ සියල්ල විචෘතය. මේ කාලයම ශාප්‍රකව ආයේ අපට හාර දෙනු ඇතැයි මම විශ්වාස කළෙමි. ඒත් ඒ විශ්වාසය දවස ගානේම බොල්වී අහුරක් වාගේ සුනු විසුනු වී ගියේය.

"වාරිතා පිස්සියෙක් වගේ අර කොල්ල ගැන හොයනව. මං හිතන්නෙ බත් කටක් දෙකක් කන්නැ. සාස්තර කාරයො පස්සෙ දුවනවා."

"ඒව ගැන විශ්වාසක් මට නෑ අත්තම්මෙ..."





"ඒත් පුතෙ පංසලකට ගිහින් බෝධි පූජාවක් තියන්න. පුතාට ඒක කරන්න පුළුවන්."

මට ලැජ්ජ හිතුනා. මං ගැනම. කිරිදක් විදිහට ඒ තරම් දෙයක්වත් මට නොහිතුනේ ඇයි ?.

"පියේහි විප්පයෝගෝ දුක්ඛෝ."

තමා ප්‍රිය කරන පුද්ගලයින්ගෙන් ඈත්වීම දුකක්. එබඳු අවස්ථාවන්හි ධර්මානුකූලව උසස් මානසිකත්වයකින් මුහුණ දීමට නොහැකි වුවහොත් එම සිදුවීම වූ විටත් පසුවත් මානසිකව වේදනාවට පත්වෙයි. අම්මා... තාත්තා වාගේම මාද දූන් පත්ව සිටින්නේ එම තත්ත්වයටයි.

ආයු ආලෝකා අරන්ගල වූ කලී කෙබඳු යුවතියක්ව සිටියේද, ඇය අද කෙබඳු ගැහැනියක්ද ඔබ දත යුතුය. සතර පවුරකින් වටවූ එක්වැම් ගෙයක් බඳු නිවසක එකම දියණි වීමේ පාපයට මම ජීවිතය හේරුම් බේරුම් කරගැනීමේ අපහසුවක උන්නෙමි. මගේ දෙමාපියන් මේ විශ්වයටත් වඩා මට ආදරය සෙනෙහස දක්වද්දී ද මට දැනුණේ තනිකමකි. පාලුවකි. ඉගෙනීමේ ශූර වීද මම එතරම් සමාජශීලී ශිෂ්‍යාවක නොවීමි. කවදත් තාත්තාට වුවමනා වූයේ මේ අලුත් පරම්පරාව යන්නා වූ රැල්ලෙන් මා ඉවත්කර තබන්නය. එහි ආදීනව අත්විඳ නැතත් මම එය දන උන්නෙමි. සම වයසේ පිරිමි ගැහැනු ළමුන්ගෙන් මා ඈත්වී හැදුනේ ඒකය.

"හිතා ඉන්නෙ පබාවති කියල..."

http://e-pusthakalaya.blogspot.com

සමහරුන් මා පබාවතිය යන අන්වර්ථ නමින් හඳුන්වන බව මම දැන උන්නෙමි. මට උන් එකම මිතුරිය වූයේ නිමල්කාය. පාසලේ කිසිම පරිබාහිර දෙයකට මම යොමු නොවූයෙමි. වීථි දිගේ අමතර පන්ති යන උණක් උවමනා නැතැයි අපේ තාත්තා හිතා උන්නේය. උගන්නා තරමක් පාසලෙන් ඇතැයි ඔහු කීවේය. පුංචි කාලයේ පටන් නැටුමට ගායනයට එක සේ දක්ෂ වීද ඒ දක්ෂකම් මගේ අම්මාට හෝ තාත්තාට මහා දේවල් වූයේ නැත.

"නැටුම් නම් තෝරගන්න එපා කියල තාත්තා කිව්වේ. ඇන්තනෙ ඔය ජේන්නැද්ද රට යන පැත්ත. ගෑනු ළමයි රූපවාහිනියෙ බාගෙට ඇඳන් නටෝනවා. කකුල් දෙකෙන් උස්සල ගන්නෙ. තාත්තා කියනව මුලින්ම ගහන්න ඕන ඔවුන්ගේ අම්මලාටලු."

"ඒත්. අම්මා..."

"පුතා... ගායනය තෝරගන්න..."

"ඉස්කෝලෙ ඉන්න සංගීත මිස් හරිනා... උගන්නනවට වඩා තිවාඩු... ආවත් නිදි..."

"එහෙමද.... එහෙනං ඒකට හොඳ පංතියක් හොයල යමු..."

ඒ යෝජනාව අම්මාගේය. මම පුදුම වීමි. ඒත් අම්මාගේ යෝජනාවක් ඉඳ හිටවත් ප්‍රතික්ෂේප නොවන බව මම දැන උන්නෙමි. නිමල්කා සමග මට සංගීත පන්ති යන්නට අවස්ථාවක් ලැබුණේ එහෙමය. ෂෙවාන් මුණ ගැසුණේ එහිදිය.





ෂෙවාන් සරල සංවේදී පිරිමි ළමයෙකි. ඔහු කළායතනයේ උන් දක්ෂතම සිසුවා වූයේය. මගේ නිහඬ කමට ඔහුගේ නිහඬකම එකතු වී අපේ හදවත් දොඩමලු වුනා වැනිය.

හැමෝම කියන්නෙ ඔයා ආඩම්බරයි කියල. ඔයා හැදුනු වටපිටාව කවුරුත් දන්නෙ නෑ.

ෂෙවාන් මා තේරුම් ගත්තේය. අවුරුදු දෙක තුනක් අපි පෙම් කළෙමු. කොටින්ම ශානුකගේ විවාහ යෝජනාව එනතුරුම අපි පෙම් කළෙමු.

"ශානුක වගේ කෙනෙක් ඔයාට කැමති වුණ එක මට සතුටුයි. ඒ මනුස්සය හෙළින් වැඩකරන කෙනෙක්. ඔයා සතුටින් ජීවත් වෙයි".

"ඔයා මං ගැන මොනව හිතනවද ෂෙවාන්.."

"ඔයා පැහැදිලි ජලය වගේ සාධාරණයි. මට ඔයාව දන් අරන් යන්න බෑ... මං අස්ථාවරයි. තාම ඉගෙන ගන්නවා."

හදවත හඬා නොවැටුනා නොවේ. ෂෙවාන් ගැන මහා මහත කන්දරාවක් හදවත ඇතුළේ විණි. ශානුක මා දුටුවේ මගේ ඥාති සොහොයුරියකගේ විවාහ උත්සවයකදීය. ඒ වද්දී ශානුකගේ මාපියන් ඔහුට විවාහ වන්න මනාලියක සොයමින් උන් බව පසුව දැන ගත්තෙමි. ශානුක විවාහ කර ගන්න කැමති වූයේ මාවය.



http://e-pusthakalaya.blogspot.com

## 02

මම ශානුකගේ මනාලිය වූයෙමි. තාත්තා දුටුවා පිරිමියෙකු මගේ මනාලයා විය. පළමු අභියෝගය වූයේ පිරිමි ළමයෙකු කියා මා ඇසුරු කළා නම් ඒ ෂෙවාන් විතර නිසා ශානුක කුමන තත්ත්වයක පිහිටි පෞරුෂයක්දැයි තේරුම් ගැනීමය. ඇත්තම නම් ශානුක ෂෙවාන්ට වඩා හාත්පසින්ම වෙනස් ගති ඇත්තෙකු වූයේය. ඔහු මට බොහෝ පෙම් කළේය. ඔහුගේ රැකියාවද මාද සම මට්ටමක උන්නේය. එය මට සතුටක් විය. ශානුක අතුරුදන් වන තුරුම ඔහු මට නිසි තැන දුන්නේය. හිමි තැන දුන්නේය.

හිමි තැන

නිසි තැන...

ගැහැනු හිත ඒ තැනට කෙතරම් ආශා කරනවාද. තමන්ට තමන් ආදරේ කරනා පිරිමියා ගෞරව කරනවාට, ආදරය කරනවාට.





ගැහැනු කෙතරම් ප්‍රිය කරනවාද? ඒත් ශානුකගේ නිවසේදී ලැබුණු මහත් දායාද ඔහුගේ අතුරුදන් වීමත් එක්ක නැතිව ගියේය. අවලංගු කාසියක් වාගේ මම ඉවතට ගියෙමි.

විවාහයෙන් පසුව මා හා ශානුක මහගෙදර උන්නේ නැත. ශානුකගේ අලුතෙන් සැදූ නිවසට අපි ගියෙමු. ඒත් ශානුක රැකියාවට ගියේ මා මහගෙදරට ඇරලාවය. ආයේ ඔහු රාත්‍රියට ගෙදර එනතුරුම මා උන්නේ මහගෙදරය.

"දූවේ..."

මගේ කල්පනා ලොව අතැර මම බැලුවෙමි. අම්මාත් තාත්තාත් ඇවිදින් සිටිති. අම්මා මා වැළඳ ගනිද්දී මට හැඬිනි. ඇස්වල කඳුළු. උල්පතක් හැලියා වාගේ කඩා වැටිණි.

"අඬන්න එපා පුතේ.."

අම්මාද හැඬුවාය. තාත්තා සියල්ල දරා ඉන්නට උත්සාහයක යෙදුනේය.

"මගෙ පුතා මේව දරාගෙන ඉන්නෙ කොහොමද? අපියි වැරැද්ද කළේ. මේ වගේ රස්සාවක් කරන කෙනෙක්ට දූව කසාද බන්දල දුන්නෙ අපි."

"අම්ම මොනවද මේ කියන්නේ.."

මම නැති ගත්තෙමි. අම්මා කියන දෙයක් කිසිවකුට ඇසේවියැයි බියවීමි. මා කෙසේ කීවත් අම්මා නොනවත්වා කීවේ මා හා ශානුක විවාහ වීම නිසා මගේ ජීවිතය අඳුරු වූ බවකි. එය



http://e-pusthakalaya.blogspot.com

මා සමග විතරක් නොවේ. ශානුකගේ මව එක්ක කියන්නත් අම්මා නොපැකිලි වුණාය.

"ඒක හරි කතාවක්නෙ. රස්සාවට ගිහින් අවුරුදු හත අටක් වුණා. කිසිම කරදරයක් වුණාද... බැඳල අවුරුද්දෙන් මගෙ දරුව අතුරුදහන් වුණා."

"ඒක හරි කතාවක්නෙ අක්කෙ. දූන් ඒකට වැරදි මගෙ කෙල්ලද?"

"ඒක මංද... තියෙන මූසලකමනෙ."

"අනේ අනේ. අහන්න වුණානෙ මෙහෙම කතා. අපේ වරද දොස්තර කෙනෙක්ට බන්දන්න තිබුණු දරුව මේ කොහේවත් යන..."

"කොහේවත් යන උන් තමයි අපි මේ වද්ද ගත්තෙ"

වචන හුවමාරුව දුර දිග ගියේය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ අම්මාත් තාත්තාත් මට ගෙදර යන්න කතා කිරීමය.

"මං ගෙදර යන්නෙ නෑ.. මං යනව ශානුකගෙයි මගෙයි ගෙදර."

මම තරහත් දුකත් හදවතේ තබාගෙන කීවෙමි. කිසිවෙකු කිසිවක් නොකීවේය.

මා ශානුකගේ මහ ගෙදර ඉන්නවාට අකමැති අම්මාත් තාත්තාත් මා ශානුකගේ ගෙදරට ඇරලවා යන්න ගියේය. මගේ තනි නොතනියට උන්නේ ගෙදර උයන පිහන ආරියවතී විතරය.



http://e-pusthakalaya.blogspot.com



ජීවිතය හිස්ව දුනුණි. සර්ව සම්පූර්ණ නැති ජීවිතය මා ඉදිරියේ හිඳගෙන මට මැසිවිලි නගයි. කුමක් හෝ වේදනාවක් මා පෙළයි. මගේ ජීවිතය ගොඩගත නොහැකි අගාධයකට ඇද වැටී තියේ. මම අන්ත අසරණියක වාගේ ඒ අගාධයෙන් ගොඩඑන්නට දඟලමි. ශානුකගේ අතුරුදන් වීම ගැන මාධ්‍ය එකිනෙකට වෙනස් අදහස් දරයි. මම ශානුකගේ ගෙදර තනිව පියමං කරමි. දුක සතුට නැති ජීවිතයක්. කවදා හෝ නම ස්වාමි පුරුෂයා පැමිණෙන තුරු බලා ඉන්නා බිරිඳක්.

රාත්‍රී දහය පසුවී තිබේ. කිසිවෙකු දොරට ගසයි.

"බෙල් එක නොගහ දොරට ගහන්නේ." මම මටම කියා ගත්තෙමි.

"නෝනා අපේ නෝනා.."

ඇසුණේ අමරාවතිගේ කෑගැසීමය. මම සාලය වෙත දිව ගියෙමි. අව් අමෝරා ගත් තරුණයෙකි.

"කෑගැහුවොත් මරණවා..."

ඔහු කීවේ මටය. මගේ දෙපා පණ නැතිව තිබිණි. මම ඇද වැටේය බියට සෙටියට වාරුවීමි. තරුණයා අමරාවතීගේ දෑත් දෙපා බැඳ දමා මුවට රෙදි පාත්කඩ එබුවේය. ඉන්පසු ඔහු හැරුණේ මා දෙසටය. මගේ උගුරෙන් වචන පිට නොවුණි.

"අනේ..."

මට කියවිනි. මම නැගිට දෙපාවලට වාරු ගෙන කාමරයට දිව ගියෙමි. ඒත් තරුණයා මට වඩා ඉක්මන්ය. ඔහු මා අල්ලා

ගත්තේ ව්‍යාඝ්‍රයකු පුංචි සතෙකු ඩැහැ ගන්නා පරිද්දෙනි. කාමරයේ දොරවල් වැසිණි.

"මේ සේරම උඹේ මහත්තය නිසා."

සිදුවන්නේ කුමක්දැයි මා දන උන්නේ නැත. අඳුනරමේ මේ කාමාතුරයාගේ මුහුණ වත් මා දුටුවේ නැත. මම විලාප නැඟුවෙමි. ඒත් එය කිසිවකුට ඇසුණේ දැයි මා දන්නේ නැත. මගේ හඬ මටම විතරක් වදයක් විය. ගවෙමෙ කරින් ලිහුනා නොවේ. ඔහු එය ඉරා දැමුවේය. රකුසෙකුය. පාපතරයකුය. මා කළ වරදක් නැත. කළානම් නන්නාඳුනන පිරිමියෙකුගේ අහිනත ගැනීම විතරය. ශානුක මා මෙහෙම ජීවිතයක් ගැන සිතුවේ වත් නැත.

* * * * * * *

රැය පහන් වී තිබේ. කාමාතුරයා යන්න ගොස් ඇත. මම ඔහුගෙන් ජීවිතය යැද්දෙමි.

"මට කරදර කරන්න එපා... මං... මං... වරදක් කළෙ නෑ..."

මම ඔහුට කීවෙමි. ඉකි බිඳ බිඳ හැඬුවෙමි. ඒත් ඔහු ඇසුවේ නැත.

මම යහනින් නැගිට්ටෙමි. කැඩපතින් පෙනෙනා ආයු මාමද? මට පෙනෙන්නේ විකාර රූපයකි. දිග හිසකේ කඩාගත් උමතු ගැහැනිය. මා මීට ඉහත දැක නැති තරම්ය. සිරිම්... තුවාල... මගේ සොඳුරු ජීවිතය. ඉතිං ඩැහැගෙන ගොස් තියේ. ආරියවතීගේ



http://e-pusthakalaya.blogspot.com



ඉකිබිඳීම ඇසෙයි. මා දුටු ආරියවතී මගේ දෙපා බදා හඬන්න වූවාය.

"අනේ නෝනේ... මේ මොකද වුණේ. මගෙ නෝනෙට උඹ කරදර කළා නේද..."

"ආරියවතී..."

"කියන්න නෝනෙ මං මහගෙදරට ගිහින් මේ උන දේවල් කියන්නද?"

"එපා..."

"නෝනෙ..."

"ආරියවතී පොරොන්දු වෙන්න මං මැරුනත් මේ සිද්ධ වුණු දේ කාටවත් කියන්නෙ නෑ කියලා..."

"අනේ දෙයියනේ..."

"පොරොන්දු වෙන්න."

"මං කෙලබිදක් හෙලන්නෙ නෑ."

"මේ වුණු දේ දැනගත්තොත් හැම රූපවාහිනියකටම මාව අලුත් මාතෘකාවක් වෙයි. උන්ට කරන්න ඕනත් ඒක. ශානුක අතුරුදහන්. බිරිඳ කාමාතුරයෙකුට හසුවෙයි. උන්ට ඕන මේක දිගටම ගෙනියන්න."

මට හැඟිනි. ආරියවතීත් හැඬුවාය.

ජීවිතය ගැන ඉතිං පළමු වතාවට අප්පිරියාවක් දැණිනි. පිළිකුළක් දැණිනි. මගේ ශරීරය මගෙන් ගලවා තබන්නට තිබුණා නම් හොඳය. එතරම්ම මට මගේ ශරීරය පිළිකුළක් ගෙනාවේය.

"අඬනවද?" ,

මම තිගැස්සිමි. හදවත මට කතා කළේය. මම කාමරය පුරා දැස් ඇවිද්දුවෙමි. ඇස්වල කඳුළුය. මම වහා ඒවා පිස ගත්තෙමි.

"ආරියවතී..."

"නෝනෙ..."

"කවුරු ආවත් මං නෑ කියන්න. ගමනක් ගියා කියන්න."

"එහෙමයි..."

ජීවත් වීම වේදනාවක් වී තියේ. ..... මෙවන් ජීවිතයක් මා පැතුවේවත් නැත. ශාන්තකට ශාප කරන්නට බැරිය. මා වයසට කලින් විවාහ කර දුන් දෙමාපියන්ට ශාප කරන්නටත් බැරිය. කළ යුතු නොදම දෙය කුමක්ද? දූන් ඉතිං ශාන්තක අතුරුදන් කළ උන්ට සැනසීමක් ලැබේවිද?

ආයේ රැය එළඹිනි.

"හොඳට දොරවල් ලොක් කරන්න."

මම ආරියවතිට කීවෙමි. රාත්‍රි දහය එකොළහ වෙද්දී මාගේ හෘද ස්පන්දනය පවා වෙනස් වී තිබිණි. ඊයේ රාත්‍රියේ සිදුවීම අමතක කළා නොවේ. ගැහැනියක හැටියට රට ලෝකය ගැන නොදන්නා ගැහැනියක හැටියට මම අපමන වේදනා වින්දෙමි.



http://e-pusthakalaya.blogspot.com



ඒත් ශාන්තක වෙනුවෙන් ඔහු ගේ ආත්ම අභිමානය වෙනුවෙන් මා ජීවත්විය යුතු යැයි මට සිතුණේ මහා රැයේදීය. රාත්‍රියේදීය. උදයේ දහවලේ නම් ඒ අදහස වෙනස්ව පැවතිනි. කාමරයේ දොරවල්වල වසා ගෙන මා කළේ මියයන්න ක්‍රමයක් සෙවීමය. මියයන්න සූදානම් වීමය. ජීවිතය අත්හැර යාම මිස වෙන කළ හැකි දෙයක් නොවේයි සිතුවෙමි. ඒත් ජීවිතය අත්හැරීමෙන් මා ලබන දිනුම ජයග්‍රහනය කෙබඳු එකක් වේද? මම මගේ සිතින්ම ප්‍රශ්න කළෙමි. නොවේ. ජයග්‍රහනයකින් පලක් නැත. මේ ජීවිතය දැන් පිළිකුලකි. එනිසා මිය යා යුතුය. මම සිතුවෙමි. ඒත් මගේ මරණයට ශාන්තකගේ තියන පරාජයකි. එනිසා ඔහු රැකගන්න මා ජීවත් විය යුතුයැයි හිත පවසයි. හිත. මගේම හිත... මට අභියෝග කරයි. ඉතිං මම ඒ අභියෝගයෙන් පරාජය වුණෙමි. හදවත ජය ගෙන මම පරාජය වීමි. මරණය අත්හැර අලුතින්ම අලුතින්ම ජීවිතය අරඹන්න මම හිතුවෙමි. මේ ඒ රැයයි.

"බර... බරස්..."

ඒ හඬ නැගුනේ පෝරණුවෙනි. හදවත හෝස් ගෑවේය. මම වහා කාමරයේ දොර තද කළෙමි. යතුරක් කාමරයට හදන්නට උවමනා යැයි ශාන්තක කීවේය. ඒත් සාදා නිම නොකල නිවසේ නවත් සුළු සුළු වැඩ ඉතිරි කර ශාන්තක අතුරුදන් විය. මම මේසය ඇද දොරට තැබුවෙමි. පපුව තදින් ගැහෙයි.

"නෝනේ... නෝනේ..."

ඒ ආරියවතිය.

"අදත්..."

මම මටම කියා ගත්තෙමි. මේසය පෙරලාගෙන කාමරයේ දොර හරින්න ඔහුට හැකිවිය. මගේ දෙපා පණනැති වී ගියේය. ඔහු තලේ රියේ කළ දේමය. ඒත් මම වැළහින්නක සේ නොහැඬිමි. යහනේ හිස තබාගෙන මම මේ කාමාතුරයා දෙස හොඳින් බලා උන්නෙමි. මගේ ජීවිතය මගේ ජීවිතයේ සියලු යස ඉසුරු ඩැහැගත් මේ තරුණයා කවුරුන් විය හැකිද? මගේ බැල්ම එකම විදිහට එකම වේගයට ඔහුගේ බැල්මට හසුවිනි. සත්‍ය නම් ඔහු ඉතාම තරුණ ඉතාම කඩවසම් තරුණියක රැවටෙන තරමේ රූප ශක්තියකින් හෙබි අයෙකි. මා ඔහු හරි හැටි දක්කේ දන්ය.

"මේක මගේ රස්සාව නෙමෙි."

මගේ බැල්ම ඉවසා ගන්න බැරිවදෝ තරුණයා තදින් කීවේය. මම වචනයක් හෝ නොකියා ඔහේ බලා උන්නෙමි.

"ඌට මොන හයියක්ද... මගෙ තාත්ත ඇමති නමයි... ඌ සල්ලාලයෙක් කිව්වට මං ඌට මුකුත් කිව්වද. ඒත් මගෙ අහිංසක අම්මට ඌ ගණිකාවක් කිව්වා. මං ඒ ගණිකාවගෙ පුතා කිව්වා... දැන්... දැන් ඌටම තේරෙයි... ගණිකාව කියන්නෙ කව්ද කියල. හෙට උඹට මේ අපරාදෙ කරන්නෙ මං නෙමේ... මගෙ යාළුවෝ... උඹව ගණිකාවක් කරල මං පාරට දානව. උගේ මිනිහා උඹගැන ලියයි පත්තරේට එහෙමත්."

සියල්ල පැහැදිලි නැත. ඒත් තරමක් පැහැදිලිය. ඔහු බැල්මෙන් යස ඉසුරෙන් පිරුණු... එසේ හැදුනු වැඩුණු තරුණයකු බව ඔහු දැක්මෙන් මට සිහිණි. එහෙනං මේ භූපති සූරිය පෙරුමගේ අනියම් බිරිය වූ වර්ජිනාගේ පුතු අරනාය. අරනා සූරියපෙරුම. මම මටම කියා ගත්තෙමි.





දේශපාලනය ගැන මහා තේරුමක් මට වූයේ නැත. එය මට නීරස වූ අභ්‍යාසයකි. ශානුකට මීස ශානුකගේ දේශපාලනයට මා සතුටු වූයේ නැත. ඒත් ශානුක හිස කෙලින් තබාගෙන දේශපාලන අදහස් දක්වූ විවේචනය කළ අයෙකි. විශ්වකර්ම දේ ලියන්නා වාගේ ශානුක මැති ඇමතින් අතර ජනප්‍රිය වූවෙකි.

"මට මඩ ගහන්න... ඌ ඔය කෙටුවෙ කෙහෙල් ගහකට..."

භූපති සූරියපෙරුම විවිධ මාධ්‍ය ඔස්සේ ශානුකට බැණ වැදුනේය. ඒත් ඒ කිසිවකට ශානුක සෙලවුනේ නැත. මට මගේ ගේ ඉදිරියේ වූ තුග රාජයා සිහිවිණි. සවභාව ධර්මයේ කුමන විපත් ආවත් ඒ තුග ගහ පැහැදිලි අරමුණකින් අප දෙස බලාගන්නේය. කිසිදු හැල හොල්මනක් නැතිව ඉන්නා මේ මහා තුග ගස වදයක් කරදරයක් සේ සැලකුවේ මගේ තාත්තා විතරද මා දන්නේ නැත. ඒත් මම එම තුග ගසින් වින්දනයක් ලැබුවෙමි. අභ්‍යාසයක් ලැබුවෙමි. ජීවත්වන්න පන්නරයක් ලැබුවෙමි.

"ඇයි ඔහොම බලා ඉන්නෙ... මගෙන් බේරෙන්නද... මගෙ අම්ම අහංසක ගෑනියෙක්. ඇමති තාත්තගෙ අනියම් බිරිඳ වුනේ කැමැත්තෙන් නෙමේ. ඒත් මගේ අම්මා තාත්තට පණ වගේ ආදරෙයි. තාත්තට ඔව් හුඟක්.."

හිතක් පපුවක් නැතිව රාත්‍රී දෙකකදී මට වද දුන් අරනා නැගීම්බරව කතා කරයි. මගේ මුලු ජීවිතයම විනාශ කර දැමූ අරනා, ගැහැනියකගේ ජීවිතය විනාශ කර දැමූ අරනා තවත් මවක් ගැහැනියක ගැන සෙනෙහසින් කතාකරයි.

"මගෙ ඉවසීමේ සීමාව නැතිවුණා... උගේ මිනිහා... ඌ මගෙ අම්මට දිගටම මඩ ගැහුවා... ජීවිතේ එපා වෙනකම්, මගෙ

http://e-pusthakalaya.blogspot.com

අම්ම එයාගෙ ජීවිතේ අතැරල යනකම්ම එයාට මඩ ගැහුවා. දුන්නවද මගෙ අසරණ අම්මා එයා වහ බිව්ව. සදහටම යන්න ගියා."

ඔහු වියරුවෙන් කෑගැසුවේය. මගේ ගෙල තදින් අල්වා මිරිකා උන්නේය. කෙනෙරල් වේගයෙන් ඇද මගේ දෙකොල් සැපුවේය. මුවැත්තියක ව්‍යාඝ්‍රයකු ඉදිරියේ හැසිරෙන්නේ යම් සේද මම එලෙස වූයෙමි. අහෝ... ජීවිතය යනු මෙවන් ජීවත්වීමකටද?

"මං උඹව මරනවා... ඔව්... ටික ටික. උඹව විනාශ වෙද්දි අරූ උඹේ මිනිහා උං නිකම්ම විනාශ වෙනවා... මේ අහපං... උඹ මෙහේ දාල ගියොත්... වෙන්නේ..."

දෙකොල් අගින් ලේ ගලා යයි. හැඩුනේ නැත්තේ කුමන අහේතුවකටද ? අරනා‍ය මධුවිත තොල ගායි. වියරුවෙන් හැසිරෙයි. විටෙක කියවයි. විටෙක හඬාවැටෙයි. ඔහුගේ මානසික කායික හැසිරීම් වෙනස් වන මොහොතක් ගානේ ඔහු මට වදදෙයි.

අලුයම... සියල්ල අවසන්ය. ඔහු යන්න යයි. මම කාමරයේ යහන ළඟ බිම ටයිල් පොලොවේ මුනින් අතට වැටී ඉමි. මගේ ජීවිතය. එය සොයාගන්නටවත් බැරි තැනකට මා දමා යන්න ගොසිනි. ගැහැනියකට ගැහැනිය කියන්නේ මේ හින්දාද නොදන්නෙමි. නමුත් හැම ගැහැනියකම මා වාගේ නැති බව දන්නෙමි. පිරිමියෙකුට යටහත් නොවී ඉන්නට, ඒ යදම් වලින් ගැලවී යන්නට ගැහැනියකට එක් අවස්ථාවක් වත් නැතිද? උපන්දා පටන් දෙමව්පියන්ට යටහත්ව... විවාහයෙන් පසු සැමියාට යටහත්ව... ඉන්පසුව දරුවන්ට යටහත්ව... මුළු ජීවිත කාලයේම



http://e-pusthakalaya.blogspot.com



යටහත්ව ජීවත් වන්නට සිදුවේ. මේ යටහත් බව... මේ පරාධීන බව අරනා‍ය හමුවන තුරුම මට දැනී තිබුණේ නැත.

"නෝනෙ..."

ආරියවතී කාමරයට හිස හොවා හඩන්න වූවාය.

"ආරියවතී..."

"නෝනෙ... මගෙ නෝනෙ... මං යනව ශාන්ත මහත්තයගෙ ගෙදර ඒ අයට කියනව."

"කවදාවත් එපා ආරියවතී... ඒ ගොල්ලො මාව විශ්වාස කරන තත්ත්වයක නෑ..."

"කොහොමද මේක කෙළවර වෙන්නෙ..."

"ආරියවතී... මං මේ ගේ දාල ගියොත් ඒකා ශාන්තව මරණව කිව්වා... ආරියවතී එක කෙළ බිංදුවක් පිටව දාන්න එපා. මට ශාන්තව ඕනෙ. මගෙ මහත්තයව ඕනේ."

මට හැඬුනාද නොදනිමි. ඒත් ඇස්වලින් කඳුළු නොපැන්නේය. අප්පිරියාව... හිරිකිත... පිටස්තරයකු නොදන්නා මිනිසෙකුට යටවී ගත් ජීවිතය. මම නාන කාමරයට වැදී පැය දෙක තුන නාමි. කිළිටි සේදී යන්නට නාමි. කුමක් කරන්නද? ගත යුතු තීරණය..... හෙට දවස..... මේ කිසිවක්ම නොවැටහෙයි.

## 03

තුන්වෙනි රාත්‍රිය.... ඔහු ඔහුගේ මිතුරන්ට මා භාර දෙන බව කීවේය. මම කාමරය පුරා ඇවිද්දෙමි. විටෙක පලා යන්නට සිතිනි. ඒත් එය කරන්නට නොහැකි ශානුක නිසාය. මගේ ජීවිතය කැපකර හෝ ඔහු බේරා ගන්න තියෙනවා නම්... මම දනිස් මත හිස තබා ගත්තෙමි.

"ඇඬුවද..."

එය සවන් ළඟිනි. අරනෂ.. මම බියවී හිස එසවීමි. වේලපහ ඔහු ඇවිත්ය. මගේ දෑස ගියේ කාමරයේ දොර වෙතය.

"මං යාළුවො අරන් එන්න තරං අමුනුස්සයෙක් නෙමේ."

එහෙම කියා අරනෂ මා ළඟින් හිඳ ගත්තේය. පිරිසිදු නොකල ගෙබිම මා ළඟම හිඳ ගත්තේය. මම වහා නැගිට ගත්තෙමි.



http://e-pusthakalaya.blogspot.com



අරනෂ මා යහන මත හිඳවාලූයේය. අරනෂගේ විසල් බැඟය යහන මතය.

"මගෙ ඇඳුම්... අද ඉඳන් මං මෙහේ ජීවත් වෙනවා... ඔයා එක්ක..."

පපුව දැවේය. හුස්ම හිරවී තිබිණි. ජීවත් වන්න බැරි බවක් දැනිණි.

"කරන්න දෙයක් නෑ... මේක තමයි මගෙ අම්මගෙ ණය..."

මම කිසිවක් නොකීවෙමි. ඔහු තම මවගේ ණය ඉල්ලන්නේ වරදක් නොකළ තවත් ගැහැනියකගෙනි. 'අමුනුස්සයෙක් නෙමේ' ඔහු කිව ආයේ මගේ යටි සිත පහුරු ගෑවේය. ඔහු මනුස්සයෙක් වූයේද? එසේ වූයේ නම් මගේ ජීවිතයට මෙවන් විපතක් ගෙන දේවිද? මගේත් ශානුකගේත් කැදල්ල... අනේ... අහෝ කියා ඉවත ලා ගත් මගේ පවුල් ජීවිතය.

"අඬනවද හිනාවෙනවද...?"

ඔහු ඇසුවේය.

"දෙකම..."

ඒ මගේ හිතය. වදන් මුවින් පිටවූවේ නැත.

"මොනාලිසා..."

ඔහු කීවේ මටය. මම හැල්මේ ඒ නෙත් බැලීමි. ඔහු බලා උන්නේ මදෙසය. අප දෙදෙනාම උන්නේ යහන මත හිඳගෙනය.

ඒ නෙත් මග හැර යන්න උවමනා උනත් එය ලෙහෙසි නොවුනේය....

"මං අද ඉඳන් ඉන්නෙ මෙහෙ. ජීවත් වෙන්නෙ ඔයා එක්ක..."

මම තිගැස්සී ගියෙමි.

"ඔයා මෙකට කැමති නෑ කියල මං දන්නවා... ඔයා විතරක් නෙමේ මගෙ මැරුණු අම්මවත් මේකට කැමති වෙන්නෙ නෑ දන්නෙ නෑ මේ ප්‍රශ්නෙත් ගැලවෙන හැටි. මං ගෑනියෙක් ළඟට යනව තියා කෙල්ලෙක්ටවත් ආදරේ කරපු කෙනෙක් නෙමෙයි. ආයු... ප්ලීස්... දැන් මට ඔයාව ඕන..."

මේ අරනාය. මම වහා නැගී උන්නෙමි.

"මං ශානුකගේ..."

මට කියවිනි. අරනා වහා මා ඔහු තුරුලට ගත්තේය. ගැලවෙන්න එක ඉඩක්වත් නොතිබූ හැටි.

මෙයට මා කුමක් කියන්නද වැටහුණේ නැත. කුමක් කීවත් පලක් නොවන බවත් මම දන්නෙමි. අරනා හිතට හිතෙන දේ කරනා කෙනෙකි.

"ඇයි මුකුත්ම නොකියන්නෙ..."

ඔහු ඇසුවේය. ඇමති භූපතිගේ ළඟ අරනාගේ මව බිල්ලක් වන්න ඇත්තේද මෙහෙමය.



http://e-pusthakalaya.blogspot.com



"මන්ද මහ පුදුම දෙයක් පෙරේදා ඉඳන් මට වන අමුතු දේවල් දැනෙනවා. වෛරයට වඩා ආදරේ දැනෙනවා."

මම තිගැස්සී ගියෙමි.

"අනාථිනවා.."

පළමු වරට මම කෑගැසුවෙමි. ඒත් අරනා මා අත්හලේ නැත.

"තමුසෙට මං කවදාවත් සමාව දෙන්නෙ නෑ. මං මගේ ජීවිත කාලෙටම ආදරේ ශානුට විතරයි..."

මගේ කොපුල් හරහා වැරෙන් පහර කිපයක් වැදිනි. මම විසිව ගියෙමි.

"හොඳින් හරි නරකින් හරි උඹ මගෙ... දැන් මගේ...."

"මේ ගෙදර තමුසෙට ඉන්න බෑ. මේක ශානුකගෙ ගෙදර..."

"ඕකේ... යං... මගෙ ගෙදර."

"වදින්නං, දැන් තරර හතුරුකම නිවාගෙන ඉවරනෙ. ශානුක පරාදයි. ජීවිත කාලෙටම ඔයා දිනුම්. ඔයාගෙ තාත්තාගෙ දේශපාලනයත් දිනුම්. දැන්වත් යන්න."

"ප්ලීස් ආයු. කට වහගෙන ඉන්න..."

"මෙහෙන් යන්න..."

මම හැඬුවෙමි. ජීවිතයේ අවසන් වරට කියා හැඬුවෙමි. ඒත් ඔහු මගෙන් හෝ මවෙතින් හෝ මා තුරුලෙන් හෝ මිදුනේ නැත.

* * * * * * *

ඊළඟ උදයට හිරු පායනවාට මම බියවීමි. ඊළඟ උදය ගැනත් මම බිය වීමි. රාත්‍රියට වඩා දූන් හිරුට මා බියය.

"අද අපි දෙන්නා ශොපින් යනවා.'

මට අරනාථ කිවේය.

"ෂ්... එක වචනයක් වත් කියන්න එපා... මං ඔයාගෙන් උත්තර ඉල්ලුවෙ නෑ... මං යනව කියලනෙ කිව්වෙ... අද ඉඳන් ඔයාගෙ ජීවිතේ ගැන සියලු තීරණ ගන්නෙ මං..."

අරනාථ කුමන කාලයේ කුමන වර්ගයේ, කුමන ගණයේ පිරිමියෙකුද්දයි මට වටහා ගන්න බැරි විය. ඒත් ඔහුට අවනත වන්න සිදු වූයේ ශානුක නිසාය. ශානුකගේ ජීවිතය නිසාය. මම අරනාථයත් එක්ක දෙනෝදහක් ගැවසෙන මහ මග ඇවිද ගියෙමි. ශානුක හඳුනන බොහෝ අය මාද හඳුනති. කාගේත් මුහුණුවල වූ සැකය මගින ලැජ්ජාවට පත්කර තිබිණි. ගැහැනියකට ලැජ්ජාව තරම් තවත් ලොකු දඬුවමක් නැතැයි මට හිතිනි. අතුරුදන් වූ ශානුකගේ බිරිඳ මැයෙන් හෙට මාධ්‍ය ලෝකයේ දුවැන්ත පෙරලියක් වනු ඇත. ඒ පෙරලිය දෙස වේදානවෙන් හෝ අමනාපයෙන් බලා ඉන්නට මට සිදුව තිබේ.





"ආයු ආයු... හොර බැළලි වර එළියට... මගෙ කොල්ලව කොහෙද හැංගුවේ...මගෙ පුතා කොහෙද ගැනියෙ..."

ඒ පසුදා හැන්දෑවය. හැන්දම්මා මගේ ගේ ඉදිරියේ හිදගෙන මොර දුන්නේය. ඉදිරි දොර ළඟට ගියේ අරනාථය.

"ආ.. උඹද මිනිහා. ඈ යකෝ මේකි රෙදි ඇඳන්ද ඉන්නෙ. මගේ කොල්ලගෙ ගෙදර ඉඳන් මගෙ කොල්ලව අතුරුදන් කරල ඒ මදිවට හොර මිනිහව ගෙටත් දාගෙන... ගහල පන්නපිය මේකිව..."

හැන්දම්මා කෑමොර දී ගෙට පිවිසුනාය.

"තව එක අඩියක් තියන්නෙ නෑ..."

අරනාථ කෑගැසුවේය. මම කාමරයේ දොරින් එබුනෙමි. අරනාථ පිස්තෝලය පෑවේය.

"හෙන ගහපිය දහදූරා..."

හැන්දම්මා මහා නොහොබිනා දේ කියමින් යන්න ගියාය. මම ජනෙල් කූරුවල එල්ලී ඔහේ බලා උන්නෙමි. මා වවුලෙකු විදුලි රැහැනක එල්ලී කෑ ගසයි. උගේ ජීවිතය ගැන අහියන බියක් මට ඇති විය.

"ආයු..."

අරනාථ කතා කළේය. මම කතා නොකළෙමි. ඒ රාත්‍රියේ ගමේ මිනිසුන් මෙන්ම ශානුකට පක්ෂපාතී අය ගෙදරට ගල් ගැසූහ.



http://e-pusthakalaya.blogspot.com

පාන්දර වෙද්දී මුළු ගම පුරාම කැලෑ පන්තර අලවා තිබිණි. නොහොබිනා දේ බලන්න බැරි තරම්ය. පුවත්පත් වල පිටු ගණන් තිබුණේ දක්ෂ මාධ්‍යවේදී ශානුකගේ බිරිඳ යනුවෙනි. මම ඇඳ විලයට හේත්තු වී දෙපා කොරවූවකු වාගේ බලා උන්නෙමි. ඇස් වලින් එකම කඳුළක් කඩා වැටුනේ නැත. මා ඉදිරියේ වූ ජීවිතය දෙස මම බලා උන්නෙමි.

"සමාවෙන්න..."

එක වචනයකින් ඔහු කියා දමමේය. කොතරම් ලෙහෙසි වචනයක්ද?. අකුරු පහ හයක වචනයකි. ඒත් එයට පාදක වූයේ එතරම් ලෙහෙසියට සමාව ගත හැකි ඉරණම කතාවක්ද ?

සමාව... ජීවිත කාලයටම නොලැබෙනු ඇත.

"මෙහෙම වන බව නොදනයි මං මෙහෙම කලේ. තාත්තා තමයි මේකට මාව පෙළඹෙව්වේ. මගෙ අම්මා මැරුන නිසයි මං මේකට මැදිහත් වුනේ. දන් මට හැරෙන්න බෑ. ඔයාව දාල යන්න බෑ ආයු..."

"මොනවද මගෙන් බලාපොරොත්තු වෙන්නෙ."

මම ඇසුවෙමි.

"ඔයාව ඔයාවම විතරයි.."

පුදුමයත් කෝපයත් දෙකම හදවතේ දෝරෙ ගලන්නට විය.

"මගේ ජීවිතේ විනාශ කළා... ඔයාගෙ අම්මා දේශපාලනේ





කළෙත් නෑ... මං කළෙත් නෑ... ඒත් අපි දෙන්නම විනාශ වුණා.... ඒ අපි ගෑනු නිසාද? පිරිමියෙක්ට පුලුවන් ගැනියෙක් දූෂණය කරන්න. ඒත් ගැනියෙක්ට බෑ පිරිමියෙක් දූෂණය කරන්න... ඒකද වරද. මං මගේ ශානුකට ආදරෙයි. මං මලත් ආදරේ එයාට විතරමයි. තමුසේ ගැන මට තියෙන්නේ අප්පිරියාවක්... වෛරයක්..."

"ඔයාට මා එක්ක ජීවත් වෙන්නම සිද්ද වෙනවා."

අරනය කීවේය. ඇසේ කඳුළත් මුවේ වදනුත් නතර විය. මමය. මාය. මා විතරමය යන වේදනා සාගරයේ මම අතරමං වූයෙමි. මගේ වේදනාව වැඩි වූයේ මගේ අම්මාත් තාත්තාත් ගේ දොරකට දකිද්දීය.

"තාත්තා..." කියා අවසන් වන්නත් කලින් තාත්තා මගේ කොපුල් තරහා වැරෙන් පහර කිපයක් ගැසුවේය.

"නවත්තනව ඕක..."

අරනය මැදිහත් වූයේය.

"ඇයි තමුසෙ මාව මරන්නද.. මං මේකිගෙ තාත්තා... මට මං තාත්තා වුණු එකයි දුක. වෙන කිසිම දුකක් නෑ... මේ වගේ දුවෙක්ද හැදුවෙ... වල් වනචර දඟුරා දුවෙක්ද හැදුවෙ. අර රත්තරං වටින ශානුක පුතා දෙයියනේ මුළු රටම කතාවුනේ ඒ දරුවගෙ එඩිතර කම ගැන. අද මුළු රටම කතා වෙන්නෙ ඒ දරුවගෙ ගැනිගෙ වනචරකම් ගැන. අපි කොහොමද රටට මූණ දෙන්නෙ... ඔය අත්දෙකෙන් වහ ටිකක් දීල මේ අම්මවයි තාත්තවයි මරල දාපං දුවේ....."



http://e-pusthakalaya.blogspot.com

තාත්තා හඬා වැටුණේය.

මම ගහක් ගලක් වාගේ බලා උන්නෙමි.

"ලැස්ති වෙන්න දුව ගෙදර යන්න..."

අම්මා කීවාය. ඇගේ ඇස් වලත් මගේ ඇස්වල වාගේම එකම කඳුළක් වූයේ නැත.

"ලැස්ති වෙයං""

අම්මා කෑගැසුවාය.

"එයා කොහෙවත් යන්නෑ මාව දාලා..."

අරනා කීවේය.

අම්මා මගේ උරහිස් අල්ලා ගත්තාය.

"උඹ එහෙම දරුවෙක් නෙමේ. මට විශ්වාසයි දුවේ. කියපං මේ මොකද... උඹ උඹේ ජීවිතේට කරගෙන තියෙන්නේ..."

"අම්මලා යන්න..."

මම කියා ගත්තෙමි. තාත්තා මදෙස තියුණු ඇසකින් බලා උන්නේය.

"මං ප්‍රාර්ථනා කරනවා උඹට වරදින්න එපා කියලා... ඒත් ඔය හුපතිගෙ පුතා... උඹ ලොකු අමාරුවක වැටුනෙ පුතේ... අපට කරන්න දෙයක් නෑ... උඹ උඹවම විනාශ කරගත්තා..."





තාත්තා ගෙයින් මිදුලට බැස අම්මාගේ අතින් අල්ලාගෙන යනකම් මම ඔහේ බලා උන්නෙමි.

ආරියවතී රෙදි පොටෙන් කඳුළු පිස්සාය.

"අද උ අපි මෙතෙන් යනවා..."

අරනා කීවේය.

"නැහැ"

මම කීවෙමි.

"ශාන්තකගේ ජීවිතේ තියෙන්නෙ තාත්තගෙ අතේ... මට මුකුත්ම කරන්න දෙයක් නෑ දූත්, තාත්තා කියනවා මගෙ ආරක්ෂාවට ඔයාව අරන් මෙතැනින් පිට වෙන්නලු..."

"ආදර්ශමත් තාත්තෙක්..."

මම කීවෙමි. අරනා මුදු මදහසක් නැගුවේය.

"ලැස්ති වෙන්න."

එය අණකි.

"ආරියවතීව ගමට අරින්න."

මම කීවෙමි.

"හොඳයි. ආරියවතී අද රෑම ගමට යන්න. මේ කිසි දෙයක්...... කාටවත් කිව්වොත්... ඒක ආරියවතීගෙ අන්තිම දවස වේවි...."



http://e-pusthakalaya.blogspot.com

The Spirit of Sri Lankan e-community

ආරියවතී කීයෙන් ගැහෙමින් හැඬුවාය. ඇ මා හැර ගියේද හඬමිනි. අරනාජ ඔහුගේ සැප පහසු රියට මා නංවා ගත්තේය. මම තවත් ස්ැරයක් මගේත් ශානුකගේත් කැදූල්ල දෙස බැලුවෙමි. මගේත් ශානුකගේත් කැදූල්ල මා ආදරයෙන්... සෙනෙහසින් රැක බලා ගත් අපේ කැදූල්ල... මම අවසන් වරටත් එය දෙස බැලුවෙමි.



04

අලුත් ජීවිතයක්... මොනවගේ අලුත්ද... ලොකු ගෙයක්... දුසි දස්සන් එහෙම ගෙයක්ද ... ඔව් සියලු දෙයට ආවතේව කාරයින්... වෙහිලට එකට යන්න විතරයි තනියෙන් යන්න පුළුවන්... අහිස් හැම දේකටම අත් උදවු කාරයන්... ගරු සැලකිලි... අරනාජගෙ පෙම්වතියද... බිරිඳද... අනියම් බිරිඳද...... මේ කෝක හරිද මං දන්නෙ නෑ. අරනාජයි මමයි විතරයි නෝනයි මහත්තයයි වගේ හිටියෙ.... මං කාමරෙන් එළියට ආවෙත් නෑ... අපේ ගෙට වඩා ලොකු කිසිවක් අඩු නැති කාමරය... ඇඳ පුටු සෙටිය... අල්මාරිය... හැමදේම පිළිවෙලයි. අපිළිවෙල මේ පිළිවෙල කාමරය ඇතුලෙ ඉන්න මං විතරද......

"වොෂ් එකක් දාන් පහළට යං කන්න..."

අරනාජ කීවේය. මං හීලෑ කරපු පුංචි මීච්චියෙක් වගේ නාන කාමරයට ගියා. වතුර මල යටින් ඇස්වල බරට තිබුණු කඳුළු



The Reader's Place
SL E-Book
The Spirit of Sri Lanka's e-community
http://e-pusthakalaya.blogspot.com

ගලා ගෙන ගියා. ශානුක එක්ක ගෙවපු ජීවිතේ මොන තරම් සරලද? ඒ සරලකම ඇතුළෙ මොන තරං ලොකු ජීවිත කතාවක් තිබුණද?.

"යං කන්න"

අරන්‍ය නාන කාමරේ දොර තල්ලු කලා. මට වහන්න අමතක වෙලා. ඒ මගේ පළමු අමතක වීම. මගේ නග්න රූපය දිහා අරන්‍ය බලා හිටියෙ වශීවෙලා වගේ. එයාට තවත් බලා ඉන්න බැරිවුණා. එයා කගල් මාව තුරුලු කර ගන්න එක. මාව තදින් සිප ගන්න එක. සියල්ල ඔහුට කැමති අයුරෙන් සිද්ද වුණා.

"මං ඔයාට ආදරෙයි. මං ඔයාව කසාද බඳිනවා."

අරන්‍ය කිව්වා. මං මුකුත්ම කිව්වෙ නෑ. මට මාව දැනෙන්නෙ කොහොමද?. ඇත්තටම මට මාව දැනෙන්නෙ නැති තරම්. මට මාව තේරුම් ගන්න බැරි වෙලා යනව වගේ. මටම නොතේරෙන මානසික අවුලකින් මං හිටියෙ. රෝස පාට සාරියක් ඇඳල දිග කොණ්ඩය පිටට කඩා වැටෙන්න දීල, රෝස මල් කුමාරි වගේ අරන්‍යගෙ අතක එල්ලිලා මං යනවා. මේ කොහෙද අපි යන්නෙ. මං කවදාවත් ඇහුවෙ නෑ. මට හිනාත් යනව. කඳුළුත් එනවා. මාවම නොතේරෙනවයි කියන්නෙ ඒකයි.

"මට ඔයා එක්ක ටිකක් නිදහසේ ඇවිදින්න හිතුනා. අනික ගේ ඇතුළෙ කට්ටිය වැඩියි."

අරන්‍ය කීවේය. ඇත්තනේ... අපි ඇවිදගෙන යනවනේ. මට ඒකත් අමතක වුණා. සියලු දෙයින් මොහොතකට ඈත්වීම මනසට විවේකයක්. මටත් එවන් විවේකයක් අවශ්‍ය විය.





"මුලු ජීවිත කාලෙටම ඔයාව බලා ගන්නවා. ඔව්"

අරන්‍ය කීවේය.

"මොනා හරි කියන්න ආයු... මට තේරෙන්නෙ නෑ. මට මොනව වෙලාද... මට ඔයා ඕන. පුදුම තරං ඕන..."

අරන්‍ය කීවේය.

මම කිසිවක් නොකීවෙමි. අරන්‍යගේ වචන ඇසෙයි. ඒ වචනවල අර්ථය නොවැටහෙයි. සියලු දේ හිස්ව දැනී යන්නේ ඇයි ?.

"ආයු අපි අතනින් ඉඳගමු ටිකක්..."

අරන්‍ය පාර අයිනේ තිබුණු ගල් බංකුවක් පෙන්නුවේය.මම නිදහස් ඇස් පියෙමි. ඔහු එක්ක මේ ගෙවා දමන්නට පටන් ගන්නා ජීවිතයට ජීවිතයක් කියන්නේ කොහොමද?

"ඉඳගන්න."

ඔහු මගේ අතින් අල්වා මා හිඳවාලූවේය. මම හිඳගත්තෙමි.

"මං ඔයාගෙ ඇස් දෙක ඉදිරියෙ සල්ලාලයෙක්. නරක මිනිහෙක්..."

ඔහු කියවන්න ගත්තේය. මම ඒ දීප්තිමත් ඇස් දෙස බැලුවෙමි. සංවේදී සිංහල නළුවන් නැති නිසා ඔහු සංවේදී හින්දි නළුවකු වාගේයි කීම තිවැරදිය. එතරම්ම සංවේදී කමක් ඒ නෙත්වල විණි.

http://e-pusthakalaya.blogspot.com

"ඒත් ආයු මේ අවුරුදු විසි හතරටම මං කෙල්ලෙක්ට ආදරේ කරල නෑ... කෙල්ලෙක්ගෙ අතින් අල්ලල නෑ. මං මගෙ මුලු හදවතින්ම ආදරේ කළේ මගෙ අම්මට. එයා නැති වුණා. ඔයාගෙ මහත්තය නිසා. මාධ්‍යවේදියෙක්ට යුතුකමක් තියෙනවා. ඒත් පැපරාසි වගේ පෞද්ගලික ජීවිතේ දේශපාලනයට ඇදා ගන්න ඕන නෑ. මගෙ අම්මා මැරුනෙ ශානුක නිසා කියන එක විතරයි මගෙ හිතේ තිබුණෙ. ඒක වෛරයක් වුණා. ඒ වෛරය මගෙ නහර පුරා දිව්වෙ තාත්තා නිසා. මේක මේ විදිහට කරන ප්ලෑන් එක තිබුණෙ තාත්තාට. ඇත්තම කිව්වොත් ඒ ප්ලෑන් එක හොඳ හෝ නරක වෙච්චා මම පිළිගත්තා. තාත්තාගෙ වයිෆ් වසන්ති ආන්ටි. එයාට පුත්තු දෙන්නෙක් ඉන්නවා. දැන් මට හිතෙනවා මේ ගේම් එකට තාත්තා එයාගෙ අතින් පුත්තු දෙන්නව යොදවන්නෙ නැතුව මාව යෙදෙව්වෙ මගෙන් එයාට වැඩක් නැති නිසා කියලා. අපට හැම සැප සම්පතම දුන්නා තමයි.... ඒත් අනේ මංදා...."

අරනාථ කතාව මදකට නතර කර මගේ මුහුණ බැලුවේය.

"මුලින් දවස් දෙකේ ඔයාට බලහත්කාරකම් කරද්දි මගෙ හිතේ තිබුණෙ පළිගැනීම විතරයි. ශානුකව ඉවරෙටම ඉවර කරනව කියන හැඟීම විතරයි. ඒත් දෙවෙනි දවසෙ මං ඔයාගෙ ගෙදරින් පිටවෙද්දි මං දැක්කා හරියට පොඩි ළමයෙක් වගේ නයක් හතරක් නොදන්න දරුවෙක් වගේ ඔයා බයට ගුලි ගැහිලා නිදාගෙන ඉන්න හැටි. ඒ වෙලාවේ හදවතට දැනුණ දේ මං දන්නෙ නෑ. ඒත් මං ඔයාව අතරමං කරන්නෙ නෑ. මං ඔයාව විනාශ වෙන්න දෙන්නෙ නෑ කියලා මං තීරණය කළා...."

ඔහු කතාකර අවසන්ය. කළුවර හමු වූ අහස කොළඹටත් ගමට වාගේම දැඩි දුකක් එකතු කර තිබිණි. දහවලට දෙනෝදහක් ගැවසෙනා නගරය මෙතරම්ම නිරවුල් නිහඬ තැනක් කරන්නට කාලයට හැකි වීම අරුමයක් සේ මට දැනිණි.

"ඇත්තම නම් මං ඔයාට ආදරේ කරන්න පටන් අරගෙන. මට ඔයා නැතුව බැරි තරන්. අපි මේ ප්‍රශ්නෙ ලිහා ගමු. ඔයා ශානුකගෙන් ඩිවෝස් වෙන්න. මං ඔයාව කසාද බඳිනවා."

"මං මැරෙනකම්ම ශානුකගෙ"

මම කීවෙමි.

"මම බලෙන් හරි ඔයාව මං ළඟ තියා ගන්නවා..."

"බලෙන් ඕන දෙයක් ගන්න පුළුවන්. කැමැත්තෙන් කිසිම දෙයක් ගන්න බෑ..."

"මං කවුද කියලා ඔයාට තේරෙයි. අපි දැන් යං...."

අරනාථ මගේ අතක් අල්වා ගත්තේය. ඔහු වලකන්න බැරිය. සියල්ල ඔහුගේ කැමැත්තටය. මම මට හිමි නැති ශරීරය රැගෙන සක්මන් කළෙමි.

"අම්මා ඉද්දි හිටපු සර්වන්ට්ලාගෙන් කුස්සියෙ උයන කිරි අම්මයි, වැඩට උදව් වෙන වර්ජි අයියවයි කියලා අතින් සේරම යවන්න කියලා මං තාත්තට කිව්වා."

අරනාථයට මගේ අකමැත්ත තේරෙන්නා සේය. ඒත් ඇත්තම නම් කවුරු කොහොම උන්නත් මට දැන් නොඉන්නා හා සේය. මා විතරක්ම ඉන්නවා වාගේ හුදෙකලාවක් මට දැනෙයි. අපි තවත් පියවර කිහිපයක් ඉදිරියට තැබුවෙමු. සැප පහසු මෝටර් රථ කිපයක් පෙළ ගැසී ඉදිරියට ආවේය. අරනාථ නතර විය. වාහන

පෙළද නතර විය. පසුපස වූ වාහන වලින් වහා ආරක්ෂක සේවයේ උන් තරුණයින් බැස ඇමතිවරයාට ආරක්ෂාව සපයන ලදී. වහ වහා ඇමතිවරයා අප වෙත ආවේය.

''ඔළුව දාන්න කිව්වම මුළු සර්වාංගෙම දම්මා...''

ඇමතිවරයා ගුගුළේය.

''දන්ම ගිහින් බස්සපං ඔය කෙල්ලව''

''ඒක කරන්න බෑ...''

''ඇයි... උඹට විකාරද ?''

''ආයුට ඒ ගමේවත්... ඒ ගෙදරවත් ඉන්න බෑ. ඒ මිනිස්සු තරහින් ඉන්නෙ.''

''ඒක තමයි මට වෙන්නත් ඕන නැතුව උඹ මේකිව කර ගහන්නද හදන්නෙ. එතකොට මොකද වෙන්නෙ. මේ වැඩේට මාව ගෑවෙන එක විතරක් නෙමේ. රට්ටුත් මට හිනාවෙනවා.''

''භූපති සූරිය පෙරුම''

අරනාා කතා කළේය.

භූපති මොහොතකට තිගැස්සුන තරම්ය.

''ඔහේට ගැහියෙක්ගෙ ජීවිතේවත්, ආත්ම ගෞරවයවත් බිංදුවකට වටින්නෑ කියල මං දන්නනවා. ඒත් මං ඔහේගෙ ලේ වලින් උපන්නට මට මගෙ අම්මට තරම්ම ආයුවත් වටිනවා.''

"අරනාා....''



http://e-pusthakalaya.blogspot.com



භූපති ඇමතිතුමා කෑ ගැසුවේය.

"මිස්ටර් භූපති සූරියපෙරුමට තියෙන්නෙ තමන්ගෙ වැඩක් බලා ගන්න. මං ඔහේගෙ කීම අහල කළේ හරි දෙයක් නෙමෙ. ඒකෙ වන්දියත් මං ගෙවනවා....''

''එහෙමද?''

''එහෙමයි...''

''මං ඔකිව මරනවා....''

''එහෙම හිතන කෙනාටවත් හොඳක් වෙන්නෙ නෑ.''

''අරනාා මොලේ කල්පනා කරපං....''

''මං ආයුට ආදරෙයි....''

අරනාා කෑගැසුවේය. භූපති ඇමතිතුමා වහා ගොස් තම රියට නැගී පලා ගියේය. ආයේ අරනාා මගේ අතැඟිලි තදට අල්වා ගත්තේය.

''බයද?''

මම කිසිවක් නොකීවෙමි. බය මගේ ජීවිතයෙන් අයින්ව ගොසිනි. බය නොවේ ඇත්තේ ලැජ්ජාවය. ලෝකයෙන්ම ප්‍රවේශම් වී පඹාවති වාගේ හැදී වැඩුණු දියණිට මේ සිදුව තිබෙන විපත. ලෝකය ඉදිරියේ නම් අවලම් ගැහැනියකි. මේ අවලම් මැසිවිල්ල මගේ අසරණ දෙමාපියන් කොහොම දරා ගන්නද?

''මාත් එක්ක කතා කරන් නැද්ද?''

අරනාා ඇසුවේය. මම ඒත් කතා නොකළෙමි.

## 05

අනාගතයක් නැති වර්තමානය තුළ මම අරනාගේ විසල් නිවසේ විඩාබර ජීවිතයක් ගෙවූයෙමි. උවමනා වූයේ කෙසේ හෝ ශානුක සොයා ගන්නය. ශානුක ඉදිරියේ විතරක් මගේ නිදොස් බව කියන්නටය. ඉන්පසු සදහටම දෙනෙත් පියවා ගත්තත් මට දුකක් නැත. සදහටම මේ ජීවිතය අතරින්නට මට බියක් නැත.

අත්හැරීම....

සියලු දේ අත්හැරීම....

අරනා එයාට අයිති හැමදේම මං නිසා අත් ඇරගෙන තිබුණා. තාත්තා, නෑදෑයො, හිතවතුන් විතරක් නෙමේ සියලු සමීපතමයන්... ඒ අතරේ දේශපාලනය... පාතාලය ඔය හැමදේම. දේශපාලනය තියෙන තැනනෙ පාතාලෙත් තියෙන්නෙ. දේශපාලඥයා කියන්නෙ අනුන්ගෙ පිහිටෙන් තමන්ගෙ බලය





පවත්වාගෙන යන අයනෙ. මම අරනාගෙ නිවසෙ ගෙව්වෙ නිහඬ ජීවිතයක්. අරනා ගැන මහා ලොකු කාලයක් නොගෙන මට තේරුම් ගන්න පුලුවන් වුණා. අරනා කියන්නෙ ගැතියෙක් ප්‍රාර්ථනා කරන විදිහෙ සැමියෙක්. මගේ පුංචිම දේත් අරනාගෙ ඇස්වලට ග්‍රහණය වුණා. අරනා දේශපාලනයෙන් සම්පූර්ණයෙන්ම ඈත් වෙලා එයාගෙ බිස්නස් විතරයි කරගෙන ගියෙ. මොන තරම් වැඩ තිබුණත් අරනා මගෙ කන බොන දේවල්, මගේ පුංචිම පුංචි අවශ්‍යතා ගැනත් හොයල බැලුවා.

දවස්...

සති

මාස...

කාලය ගෙවිල ගියෙ කාලය. ඇසින් එකම කඳුළක් නොසොල්වා ගත කරපු කාලය. ශානුක ගැන මිහිරි මතකයක් තිබුණා. ශානුක මගෙ හිත රිදෙව්වෙනැ කවදාවත්. ඒත් ශානුක මං ගැන හොවල බැලුවද? මගෙ කෑම... මගේ ඇඳුම් පැළඳුම්... මගේ ආශාවන්... අවශ්‍යතාවයන් ගැන ශානුකට ගාණක් තිබුණද?

"අද මොනවද ඔයාට ගේන්න ඕන" කියලා ශානුක කවදාවත් මගෙන් ඇහුවද?.

"කියන්න ආයු... ඔයා මොකුත්ම කියන්නෙ නැහෙ. ඔයාට ආස දෙයක් කියන්න. මං ගේන්නං."

අරනා හැමදාම ගෙයින් එළියට බහිද්දී එහෙම අහනවා. ජීවිතේ පසුතැවිල්ලක් දනෙනවා. ඇයි මං ශානුකයි අරනායි



http://e-pusthakalaya.blogspot.com

සංසන්දනය කරන්නෙ. ශානුක මගේ සැමියා. අරනාඃ දූෂකයා. හදවත ගේන හුගක් ප්‍රශ්නවලින් මං පැනල යන්නෙ එහෙම අරනාඃගෙ අලුත් ගෙදරට ආවට පස්සෙ. ජීවිතේ හංගගෙන ජීවත් වෙන්න මට පුළුවන් වුණා. ඒත් මං ගැන... අරනාඃ ගැන...

පත්තරවල ලොකු අකුරෙන් පළවුණා. "මාධ්‍යවේදියා අතුරුදන්, බිරිඳ ඇමතිගේ පුතා එක්ක පැනයයි." එක එක පත්තරවල එක එක කතන්දර. ඇහින් දකින දේවල්, කණින් අහන දේටත් වඩා ලොකු දෙයක් ජීවිත ඇතුළෙ තියෙනවා නේද? එක දිගට ඇහුනෙ දෝෂාරෝපණය, විද්‍යුත් මුද්‍රිත හැම මාධ්‍යයකින්ම මට... මගේ මුළු ආත්මයටම මඩ ගැහුවා.

මඩ....

අරනාඃගෙ අම්මට ශානුක ගහපු මඩටත් වඩා ලොකු මඩක්... අද ශානුකගෙ බිරිඳට අරනාඃ නිසා... අරනාඃ නිසා....

යන්තං ඇස් ඇරගෙන මං දවසක් එතකං බලා ඉන්නවා. මටම කියල හුස්ම ගන්න පුළුවන් දවසක්.

"ආයු..."

අරනාඃ මගේ කාමරයෙ. මගේ කිච්චට මේක මගේ නෙමේ..

"බලන්න දවස් ගානකින් කොණ්ඩෙට අත තියල නෑ. එන්න."

මම බැහැ කියන්න හිස සැලීමි.

"මං ඔයාගෙ වැරදි කාරයා. ඇත්ත... ඒත් ප්ලීස්..."





මොකක්දෝ අහේතුවකට මට නැගිට්ටුනා. අරනාඃගෙ ඇස් සතුටින් පිරුණා. මගෙ හදවත ගැඹුර මෙහෙම කිව්වා...

"බොරුවට හරි ආදරේ කරපං... ඌරගෙ මාළු උරගේ ඇගේ තියලම කපපං. ශානුක ඉන්න තැනක් දන ගන්න ඔන නං."

ආයුට කොහොමද එහෙම් කරන්න සිතුවිලි ආවේ. ඇත්තටම් ආයු මෙහෙම අනුන් රවට්ටන්න හිතුවද?.

"ඉඳගන්න..."

අරනාඃ මාව සයනය ඉස්සරහ තිබුණු පුංචි පුටුවේ ඉන්දවල මගෙ කොණ්ඩෙට සුවඳ තෙල් ටිකක් වත්කලා. හෙමිහිට කොණ්ඩෙ පිරිමැද්ද. ඇස් දෙක පියාගෙන හිටියෙ ඇත්තටම සනීපෙට... අම්මා තෙල් ගාද්දිට වඩා අරනාඃ තෙල් ගාද්දි නින්ද යන්න ආවා. අම්මා නම් තෙල් ගාද්දි රිද්දනවා. ඒත් අරනාඃ එහෙම කළේ නෑ. පොඩි ළමයෙක්ට ආදරයෙන් සලකනවා වගේ.

"මට සමාවෙන්න ආයු... මං විඳෝනවා..."

අරනාඃ කිව්වේ හෙමින් මගෙ හිසකේ පනාවෙන් පීරමින්.

"නියපොතු.."

අරනාඃ මගෙ වැඩුණු නියපොතු දක්කා. කොණ්ඩෙ ගොතන එක නතර කරල අරනාඃ මගෙ නියපොතු කැපුවා. අනේ වීතරක් නෙමේ කතුලෙන්... හදවතට කවුද තට්ටුවක් දැම්මා. කොතැනකද කවදාදා මෙහෙම ආදරෙන් සැලකුවේ. බොරු මේ මාව අල්ල ගන්න දාන පුංචි පුංචි ට්‍රික්ස්. මං හදවතට පැහැදුවා.



http://e-pusthakalaya.blogspot.com

තියපොතු කපල ආමය අරනාෘ මගෙ කොණ්ඩෙ පීරුවා. දිග කොණ්ඩෙ කරලකට ගෙතුවා. හොඳටම ගෙතුවා.

"අම්මගෙන් ඉගෙන ගත්තෙ"

මම කොණ්ඩෙ දිහා බලා ඉද්දි අරනාෘ කිව්වා. වෙලාවකට අරනාෘගෙ ආදරේ පිස්සුවක් කියල හිතුනා. ඇස්වලට කඳුළුත් ආවා. මං කෑවෙ නැත්නම් අරනාෘ බත් ගුලි හදල මට කැව්වා. දෙයියනේ මේ අරනාෘගෙ අම්මා අරනාෘට උගන්නපු ජීවිතේ නේද?.

"මේ කටත් කන්න ඕන"

"ඇති"

"අනේ ආයු..."

අරනාෘ බල කලා. වාහන කීපයක් ගේට්ටුව ළඟ නතර වුනෙත් ගේට්ටු ඇරුනෙත් එකම වෙලාවක. අරනාෘ ගණනක් නැතුව මට බත් කැවුවා. සාලෙට ඉදිරි දොරෙන් මතුවුණේ භූපති ඇමතිතුමා. මට බත් කවනවා දකලා ලැජ්ජා හිතුනේ භූපති ඇමතිතුමාට. භූපති ඇමතිතුමා අඩිය ටයිල් පොළොවේ හැප්පුවා.

"අවලම් බල්ලා... ජාතකේ වරද? උඹ මේකිව ගෑනි කර ගත්තද?"

අරනාෘ කතා කළේ නෑ.

"ඒයි... මෙහෙ වරෙල්ලා... මේකිව ඇදලා දාපං දොට්ට..."

භූපති ඇමතිතුමා කෑගැහුවා.



http://e-pusthakalaya.blogspot.com



"අත තියන්න එන්න එපා..."

අරනාෘ අතින් බත් පත වැටුණා. මාව එදා දූෂනය කළේ මේ තරම් බයගුල්ලෙක්ද කියලයි හිතුණේ. ඒ එඩිතර කමේ හැටියට මෙතන ඉන්න දහ දොළොස් දෙනෙකුට ඇනගෙන ඇනගෙන යන්න තිබුණා. ඒත් අරනාෘයට ඒ තරම් ශක්තියක් නැති වුණා.

"දාපං මේකිව එළියට. රට්ටු මට හිනාවෙනවා. මාව කෑවා..."

අරනාෘයට කවුරුත් ගැහුවෙ නෑ. ඒත් අරනාෘව හැඩි දැඩි මිනිස්සු උස්සල අරන් තදට අල්ල ගත්තා. තවත් කීප දෙනෙක් මාව අල්ලා ගත්තා.

"ඇදලා දාපං..."

"ගෙනියන්නද ?..."

එකෙක් ඇහුවා.

"ඒයි ආයුට අත තිබ්බොත් උඹල කපලා දානවා... සේරම මරල දානවා. ඉස්රම විනාශ කරල දානවා..."

අරනාෘ කෑගැහුවා.

දේශපාලන බලය... හැමදේම යටයි දේශපාලන බලයට...

"ඒ ගෑනිට යන්න ඇරපං යන අතක. ඔය ගෑනි ගඟක මුහුදක පනියි.... පනින්න දීපං... උඹල ඔය පවට හවුල් වෙන්න එපා..."

භූපති ඇමතිතුමා කිව්වා.

"තමුසෙ තාත්තා කෙනෙක්ද? ඒ පවට හවුල් කරගත්තෙ මාව. මාව නේද?"

අරනාෂ කෑගැහුවා.

"උඹ කොල්ලෙක්. මං උඹට කිව්වෙ නාල ගෙට එන්න. නැතුව මඩ නාගෙන ගෙට එන්න නෙමේ. ඊත් උඹ කලේ ඒක. දාපං ඕකිව ගෙයින් එළියට. ඇයි බලා ඉන්නෙ දාපාල්ලා..."

ඒ මිනිස්සු මාව අල්ලලා ගෙයින් එළියට විසික් කළා. තාප්පෙන් එළියට යනකං, වැහිපොද වැටෙන රාත්‍රිය... ඇඳන් හිටපු ගවුම පිටින්... මහ මග... තාත්තෙ අම්මෙ ඔයාලා දන්නවනං මේ දුවට වුන දේ... කොහතින් කොහේට ජීවිතේ අරගෙන ගියාද?...මට කරන්න ඕන මුකුත්ම තේරුණේ නෑ. රටට ලෝකෙට මූණ දෙන්න බෑ. අම්මලා තාත්තලා ළඟට යන්න බෑ... ඒ මිනිස්සුන්ට අවසන් කාලෙදිත් මං නිසා අපහාස විඳින්න දෙන්න බෑ... ඇත්තටම මට ඇඬුනා. යන්තං වැටුණ වැස්ස මුරුගසන් වැස්සක් වුණා. මං බස් නැවතුමට වුණා. අනේ සතයක් නෑ. ඇත්තටම භූපති කිව්ව වගේ මට දැන් තියෙන්නෙ මැරෙන්න විතරයි. ශානුක ගැන දුකක් ඇති වුණා... එයා ජීවත් වෙනවද... මරල දාලද... කාත් කවුරුවත් නැති වුණු ජීවිතේ අරන් මං කොහනකට යන්නද?...

"ඇයි නංගී... සපෝට් එකක් ඕනද?"

යතුරු පැදියක තරුණයො දෙන්නෙක් හොඳටම බීගෙන.

"නැහැ".





"අඬල...? ගෙදරින් පැන්නුවද? එන්න අපි උදව්වක් දෙන්නං..."

එකෙක් බයිසිකලෙන් බැස්සා. මට කරන්න තිබුණෙ දුවන එක. මං මුරුගසන් වැස්සෙ අඬ අඬා දිව්වා. බයිසිකලේ එනවා. ඊත් බයිසිකලේ පසුකරගෙන ඇවිත් මගේ දෙපා ළඟ නතර වුණේ. අරනාෂගෙ කාර් එක.

"ආශු..."

මං දෙපාරක් නොහිතම අරනාෂගෙ කාර් එකට නැංගා. මාව දැකලා අරනාෂට ඇඬුනා. ඒ ඇස්වලින් කඳුළු ගැලුවා. වාහනේ ගෙදරට ඇවිත් ගේට්ටු ලොක් කලත් අරනාෂ වාහනේම හිටියා.

"හොඳටම තෙමිලා..."

එහෙම කියලා එයා පොඩි ළමයෙක් වගේ අඬන්න ගත්තා.

"හොඳින් ජීවත් වෙන්න බෑ ආශු... මං ඊළඟට ඕන දේකට ලෑස්ති වෙනවා. ඔයාට අතක් තියන්න දෙන්නෑ ආශු"

අරනාෂ හයියෙන් මාව තුරුළු කර ගත්තා. මං සීතල වෙලයි හිටියෙ. අරනාෂ මාව කාමරයට එක්ක ගියෙ උස්සගෙන ඇත්තටම මගෙ දෙපා පණ නැතුව ගිහින් තිබුණා.

"මං කොහොමද සමාව ගන්නෙ... කොහොමද ආශු..."

එහෙම කියල අරනාෂ මගේ කකුල් දෙක ළඟ ඇද වැටුනා. මගේ කකුල් අල්ලලා වැන්දා. මං ඇද උඩින් වාඩි වුණා. හදවත සෙලවුණා. ඇතතටම එහෙම වුණා.



http://e-pusthakalaya.blogspot.com

මහ ඊ සීතල දැනුණා. අත පය සීතල වෙලා මාව ගැහෙන්න ගත්තා. තදට උණත් අරගත්තා. ඊ එළිවෙනකම්ම අරනා මං ළඟට වෙලා නිදා නොගෙන හිටියා. මට පෙනඩෝල් දුන්නා. ඊ එළිවෙනකම්ම නළලෙ ඕඩිකොලොන් තැවරුවා. මට මතක් වුණා මං දවසක් ශානුකගෙ ගෙදරිදි අසනීප වුණා. ගැහි ගැහි උණ ගත්තා.

"ශානුක මට හොදටම උණ"

"මං පොඩි වැඩ වගයක. ඔයා අපෙ අම්මවත් ගෙන්න ගෙන බෙහෙත් ගේන්න යන්න."

පනුවදා උදේවත් ශානුක මාව බලන්න ආවෙ නැ. ශානුකට ඒ තරම් වැඩ තිබුණා.

"සොරි ආයු.. ඔයා තරහද?"

ශානුක ඇහුවා. මං හිස වුණුවා 'නැ' කියන්න.

"ආයු..."

අරනා හෙමින් කතා කරනවා.

"ගිහින් නිදාගන්න අරනා"

මං කිව්වා.

"නැහැ අපි පාන්දරම ඩොක්ටර් ළඟට යං..."

"එපා ඔයා ඔයාගෙ වැඩක් කරගන්න. ඔයාගෙ බිස්නස් වැඩ අවුල් වෙයි..."





"විකාර... ඔව මොනවද? මට ඔයා තරං ඔය මුකුත් වටිනවද?"

ආයෙත් ගිත තිගැස්සුනා. හදවතේ සැරින් සැරේට දෝංකාරය දුන්නෙ අරනා කියපු දේවල්.

ගැහියෙක්ව තමන්ට නතු කරගන්න පිරිමි ළඟ ආයුධ තියෙනවා. පිරිමි කියන්නෙ වෙලාවකට වේදිකාවක රඟපාන නළුවන්වගේ. ඒත් අරනාට එහෙම අදහසක් තිබුණෙ නෑ කියන එක මං දන්නවා. අරනා කියන්නෙ හැම දේම සර්ව සම්පූර්ණ කොල්ලෙක්. එයාට ලස්සන ගෑනු ළමයෙක් කසාද බඳින්න පුළුවන්. මං මන්නෙ නැහෙන්නෙ ඇයි? සමහර විට එයාගෙන් මට වුණු වැරදි නිසා වෙන්න ඇති.

"ඔයාට දැන් සනීපද?"

දවස් දෙකකට පස්සෙ මට ඔළුව උස්සන්න පුළුවන් වුණා. මං උස වීදුරු ජනේලයෙන් පිටත බලාගෙන හිටියා. අරනා ඇවිත් මගෙ ඉස්සරහින් පුටුවක් ඇදගෙන වාඩි වුණා.

"කැවද?"

මම ඔව් කියන්න හිස වැනුවා...

"ටිකක් එළියට යන්ද? ක්ම්මැලි නේද?"

මම "බැහැ කියන්න හිස සැලුවා.

"ජීවිත කාලෙම මෙහෙම ඉන්නවද. නාඳුනන අය වගේ"

මං කතා කළේ නැහැ.



http://e-pusthakalaya.blogspot.com

ගන්නේ ව්‍යාඝ්‍රයකු පුංචි සතෙකු ඩැහැ ගන්නා පරිද්දෙනි. කාමරයේ දොරවල් වැසිණි.

"මේ සේරම උඹේ මහත්තය නිසා."

සිදුවන්නේ කුමක්දැයි මා දැන උන්නේ නැත. අඳුනරමේ මේ කාමාතුරයාගේ මුහුණ වත් මා දුටුවේ නැත. මම විලාප නැඟුවෙමි. ඒත් එය කිසිවකුට ඇසුණේ දැයි මා දන්නේ නැත. මගේ හඬ මටම විතරක් වදයක් විය. ගවෙමෙ කරින් ලිහුනා නොවේ. ඔහු එය ඉරා දැමුවේය. රකුසෙකුය. පාපතරයකුය. මා කළ වරදක් නැත. කළානම් තත්තාදනත පිරිමියෙකුගේ අභිනත ගැනීම විතරය. ශානුක මා මෙහෙම ජීවිතයක් ගැන සිතුවේ වත් නැත.

* * * * * * *

රැය පහන් වී තිබේ. කාමාතුරයා යන්න ගොස් ඇත. මම ඔහුගෙන් ජීවිතය යැද්දෙමි.

"මට කරදර කරන්න එපා... මං... මං... වරදක් කළෙ නෑ..."

මම ඔහුට කීවෙමි. ඉකි බිඳ බිඳ හැඬුවෙමි. ඒත් ඔහු ඇසුවේ නැත.

මම යහනින් නැගිට්ටෙමි. කැඩපතින් පෙනෙනා ආයු මාමද? මට පෙනෙන්නේ විකාර රූපයකි. දිග හිසකේ කඩාගත් උමතු ගැහැනිය. මා මීට ඉහත දැක නැති තරම්ය. සීරීම්... තුවාල... මගේ සොඳුරු ජීවිතය. ඉතිං ඩැහැගෙන ගොස් තියේ. ආරියවතිගේ





ඉකිබිඳිම ඇසෙයි. මා දුටු ආරියවතී මගේ දෙපා බදා හඬන්න වූවාය.

"අනේ නෝනේ... මේ මොකද වුණේ. මගෙ නෝනෙට උඹ කරදර කළා නේද..."

"ආරියවතී..."

"කියන්න නෝනෙ මං මහගෙදරට ගිහින් මේ උන දේවල් කියන්නද?"

"එපා..."

"නෝනෙ..."

"ආරියවතී පොරොන්දු වෙන්න මං මැරුනත් මේ සිද්ධ වුණු දේ කාටවත් කියන්නෙ නෑ කියලා..."

"අනේ දෙයියනේ..."

"පොරොන්දු වෙන්න."

"මං කෙලබිදක් හෙලන්නෙ නෑ."

"මේ වුණු දේ දැනගත්තොත් හැම රූපවාහිනියකටම මාව අලුත් මාතෘකාවක් වෙයි. උන්ට කරන්න ඕනත් ඒක. ශානුක අතුරුදහන්. බිරිඳ කාමාතුරයෙකුට හසුවෙයි. උන්ට ඕන මේක දිගටම ගෙනියන්න."

මට හැඟිනි. ආරියවතීත් හැඬුවාය.



http://e-pusthakalaya.blogspot.com

ජීවිතය ගැන ඉතිං පළමු වතාවට අප්පිරියාවක් දැණිනි. පිළිකුළක් දැණිනි. මගේ ශරීරය මගෙන් ගලවා තබන්නට තිබුණා නම් හොඳය. එතරම්ම මට මගේ ශරීරය පිළිකුළක් ගෙනාවේය.

"අඩනවද?"

මම තිගැස්සිමි. හදවත මට කතා කළේය. මම කාමරය පුරා දැස් ඇවිද්දුවෙමි. ඇස්වල කඳුළුය. මම වහා ඒවා පිස ගත්තෙමි.

"ආරියවතී..."

"නෝනෙ..."

"කවුරු ආවත් මං නෑ කියන්න. ගමනක් ගියා කියන්න."

"එහෙමයි..."

ජීවත් වීම වේදනාවක් වී තියේ. ..... මෙවන් ජීවිතයක් මා පැතුවේවත් නැත. ඝාතුකට ශාප කරන්නට බැරිය. මා වයසට කලින් විවාහ කර දුන් දෙමාපියන්ට ශාප කරන්නටත් බැරිය. කළ යුතු හොඳම දෙය කුමක්ද? දුන් ඉතිං ඝාතුක අතුරුදන් කළ උන්ට සැනසීමක් ලැබේවිද?

ආයේ රැය එළඹිනි.

"හොඳට දොරවල් ලොක් කරන්න."

මම ආරියවතීට කීවෙමි. රාත්‍රී දහය එකොළහ වෙද්දී මාගේ හෘද ස්පන්දනය පවා වෙනස් වී තිබිණි. ඊයේ රාත්‍රියේ සිදුවීම අමතක කළා නොවේ. ගැහැනියක හැටියට රට ලෝකය ගැන නොදන්නා ගැහැනියක හැටියට මම අපමන වේදනා වින්දෙමි.



http://e-pusthakalaya.blogspot.com



ඒත් ඝාතුක වෙනුවෙන් ඔහු ගේ ආත්ම අභිමානය වෙනුවෙන් මා ජීවත්විය යුතු යැයි මට සිතුණේ මහා රැයේදීය. රාත්‍රියේදීය. උදයේ දහවලේ නම් ඒ අදහස වෙනස්ව පැවතිනි. කාමරයේ දොරවල්වල වසා ගෙන මා කළේ මියයන්න ක්‍රමයක් සෙවීමය. මියයන්න සූදානම් වීමය. ජීවිතය අත්හැර යාම මිස වෙන කළ හැකි දෙයක් නොවේයි සිතුවෙමි. ඒත් ජීවිතය අත්හැරීමෙන් මා ලබන දිනුම ජයග්‍රහනය කෙබඳු එකක් වේද? මම මගේ සිතින්ම ප්‍රශ්න කළෙමි. නොවේ. ජයග්‍රහනයකින් පලක් නැත. මේ ජීවිතය දැන් පිළිකුලකි. එනිසා මිය යා යුතුය. මම සිතුවෙමි. ඒත් මගේ මරණයට ඝාතුකගේ නියත පරාජයකි. එනිසා ඔහු රැකගන්න මා ජීවත් විය යුතුයැයි හිත පවසයි. හිත. මගේම හිත... මට අභියෝග කරයි. ඉතිං මම ඒ අභියෝගයෙන් පරාජය වුණෙමි. හදවත ජය ගෙන මම පරාජය වීමි. මරණය අත්හැර අලුතින්ම අලුතින්ම ජීවිතය අරඹන්න මම හිතුවෙමි. මේ ඒ රැයයි.

"බර... බරස්..."

ඒ හඬ නැගුනේ පෝරණුවෙනි. හදවත හෝස් ගෑවේය. මම වහා කාමරයේ දොර තද කළෙමි. යතුරක් කාමරයට හදන්නට උවමනා යැයි ඝාතුක කීවේය. ඒත් සාදා නිම නොකල නිවසේ නවත් සුළු සුළු වැඩ ඉතිරි කර ඝාතුක අතුරුදන් විය. මම මේසය ඇද දොරට තැබුවෙමි. පපුව තදින් ගැහෙයි.

"නෝනේ... නෝනේ..."

ඒ ආරියවතිය.

"අදත්..."

මම මටම කියා ගත්තෙමි. මේසය පෙරලාගෙන කාමරයේ දොර හරින්න ඔහුට හැකිවිය. මගේ දෙපා පණනැති වී ගියේය. ඔහු තලේ රීයේ කළ දේමය. ඒත් මම වැලහින්නක සේ නොහැඬීමි. යහනේ හිස තබාගෙන මම මේ කාමාතුරයා දෙස හොඳින් බලා උන්නෙමි. මගේ ජීවිතය මගේ ජීවිතයේ සියලු යස ඉසුරු ඩැහැගත් මේ තරුණයා කවුරුන් විය හැකිද? මගේ බැල්ම එකම විදිහට එකම වේගයට ඔහුගේ බැල්මට හසුවිනි. සත්‍ය නම් ඔහු ඉතාම තරුණ ඉතාම කඩවසම් තරුණියක රැවටෙන තරමේ රූප ශක්තියකින් හෙබි අයෙකි. මා ඔහු හරි හැටි දුක්ගේ දන්ය.

"මේක මගේ රස්සාව නෙමේ."

මගේ බැල්ම ඉවසා ගන්න බැරිවදෝ තරුණයා තදින් කීවේය. මම වචනයක් හෝ නොකියා ඔහේ බලා උන්නෙමි.

"ඌට මොන හයියක්ද... මගෙ තාත්ත ඇමති නමයි... ඌ සල්ලාලයෙක් කිව්වට මං ඌට මුකුත් කිව්වද. ඒත් මගෙ අහිංසක අම්මට ඌ ගණිකාවක් කිව්වා. මං ඒ ගණිකාවගෙ පුතා කිව්වා... දැන්... දැන් ඌටම තේරෙයි... ගණිකාව කියන්නෙ කව්ද කියල. හෙට උඹට මේ අපරාදෙ කරන්නෙ මං නෙමේ... මගෙ යාළුවො... උඹව ගණිකාවක් කරල මං පාරට දානව. උඹේ මිනිහා උඹගැන ලියයි පත්තරේට එහෙමත්."

සියල්ල පැහැදිලි නැත. ඒත් තරමක් පැහැදිලිය. ඔහු බැල්මෙන් යස ඉසුරෙන් පිරුණු... එසේ හැදුනු වැඩුණු තරුණයකු බව ඔහු දැක්මෙන් මට සිතිණි. එහෙනං මේ භූපති සූරිය පෙරුමගේ අනියම් බිරිය වූ වර්ජිනාගේ පුතු අරනාය. අරනා සූරියපෙරුම. මම මටම කියා ගත්තෙමි.



http://e-pusthakalaya.blogspot.com



දේශපාලනය ගැන මහා තේරුමක් මට වූයේ නැත. එය මට නීරස වූ අභ්‍යාසයකි. ශාත්‍රකට මීස ශාත්‍රකගේ දේශපාලනයට මා සතුටු වූයේ නැත. ඒත් ශාත්‍රක හිස කෙලින් තබාගෙන දේශපාලන අදහස් දක්වූ විවේචනය කළ අයෙකි. විශ්වකර්ම දේ ලියන්නා වාගේ ශාත්‍රක මැති ඇමතින් අතර ජනප්‍රිය වූවෙකි.

"මට මඩ ගහන්න... ඌ ඔය කෙටුවෙ කෙහෙල් ගහකට..."

භූපති සූරියපෙරුම විවිධ මාධ්‍ය ඔස්සේ ශාත්‍රකට බැණ වැදුනේය. ඒත් ඒ කිසිවකට ශාත්‍රක සෙලවුනේ නැත. මට මගේ ගේ ඉදිරියේ වූ තුග රාජයා සිහිවිණි. සවභාව ධර්මයේ කුමන විපත් ආවත් ඒ තුග ගහ පැහැදිලි අරමුණකින් අප දෙස බලාලන්නේය. කිසිු හැල හොල්මනක් නැතිව ඉන්නා මේ මහා තුග ගස වදයක් කරදරයක් සේ සැලකුවේ මගේ තාත්තා විතරද මා දන්නේ නැත. ඒත් මම එම තුග ගසින් වින්දනයක් ලැබුවෙමි. අභ්‍යාසයක් ලැබුවෙමි. ජීවත්වන්න පත්තරයක් ලැබුවෙමි.

"ඇයි ඔහොම බලා ඉන්නෙ... මගෙන් බේරෙන්නද... මගෙ අම්ම අහංසක ගෑනියෙක්. ඇමති තාත්තගෙ අනියම් බිරිඳ වුනේ කැමැත්තෙන් නෙමේ. ඒත් මගේ අම්මා තාත්තට පණ වගේ ආදරෙයි. තාත්තට ඕව් හුඟක්..."

ගිනක් පපුවක් නැතිව රාත්‍රී දෙකකදී මට වද දුන් අරනා හැඟීම්බරව කතා කරයි. මගේ මුලු ජීවිතයම විනාශ කර දැමූ අරනා, ගැහැනියකගේ ජීවිතය විනාශ කර දැමූ අරනා තවත් මවක් ගැහැනියක ගැන සෙනෙහසින් කතාකරයි.

"මගෙ ඉවසීමේ සීමාව නැතිවුණා... උඹේ මිනිහා... ඌ මගෙ අම්මට දිගටම මඩ ගැහුවා... ජීවිතේ එපා වෙනකම්, මගෙ

අම්ම එයාගෙ ජීවිතේ අතැරල යනකම්ම එයාට මඩ ගැහුවා. දන්නවද මගෙ අසරණ අම්මා එයා වහ බිව්ව. සදහටම යන්න ගියා.''

ඔහු වියරුවෙන් කෑගැසුවේය. මගේ ගෙල තදින් අල්වා මිරිකා උන්නේය. කෙනෙරල් වේගයෙන් ඇද මගේ දෙතොල් සැපුවේය. මුවැත්තියක ව්‍යාග්‍රයකු ඉදිරියේ හැසිරෙන්නේ යම් සේද මම එලෙස වූයෙමි. අහෝ... ජීවිතය යනු මෙවන් ජීවත්වීමකටද?

''මං උඹව මරනවා... ඔව්... ටික ටික. උඹව විනාශ වෙද්දි අරූ උගෙ මිනිහා උං නිකම්ම විනාශ වෙනවා... මේ අහපං... උඹ මෙහේ දාල ගියොත්... වෙන්නේ...''

දෙතොල් අගින් ලේ ගලා යයි. හැඬුනේ නැත්තේ කුමන අහේතුවකටද ? අරනා මධුවිත තොල ගායි. වියරුවෙන් හැසිරෙයි. විටෙක කියවයි. විටෙක හඬාවැටෙයි. ඔහුගේ මානසික කායික හැසිරීම් වෙනස් වන මොහොතක් ගානේ ඔහු මට වදදෙයි.

අලුයම... සියල්ල අවසන්ය. ඔහු යන්න යයි. මම කාමරයේ යහන ළඟ බිම ටයිල් පොළොවේ මුනින් අතට වැටී ඉමි. මගේ ජීවිතය. එය සොයාගන්නටවත් බැරි තැනකට මා දමා යන්න ගොසිනි. ගැහැනියකට ගැහැනිය කියන්නේ මේ හින්දාද නොදන්නෙමි. නමුත් හැම ගැහැනියකම මා වාගේ නැති බව දන්නෙමි. පිරිමියෙකුට යටහත් නොවී ඉන්නට, ඒ යදම් වලින් ගැලවී යන්නට ගැහැනියකට එක් අවස්ථාවක් වත් නැතිද? උපන්දා පටන් දෙමව්පියන්ට යටහත්ව... විවාහයෙන් පසු සැමියාට යටහත්ව... ඉන්පසුව දරුවන්ට යටහත්ව... මුළු ජීවිත කාලයේම



http://e-pusthakalaya.blogspot.com



යටහත්ව ජීවත් වන්නට සිදුවේ. මේ යටහත් බව... මේ පරාධීන බව අරනා හමුවන තුරුම මට දැනී තිබුණේ නැත.

''නෝනෙ...''

ආරියවතී කාමරයට හිස හොවා හඩන්න වූවාය.

''ආරියවතී...''

''නෝනෙ... මගෙ නෝනෙ... මං යනව ශාන්තුක මහත්තයගෙ ගෙදර ඒ අයට කියනව.''

''කවදාවත් එපා ආරියවතී... ඒ ගොල්ලො මාව විශ්වාස කරන තත්ත්වයක නෑ...''

''කොහොමද මේක කෙළවර වෙන්නෙ...''

''ආරියවතී... මං මේ ගේ දාල ගියොත් ඒකා ශාන්තුකව මරණෙව කිව්වා... ආරියවතී එක කෙළ බිංදුවක් පිටව දාන්න එපා. මට ශාන්තුකව ඕනෙ. මගෙ මහත්තයව ඕනේ.''

මට හැඬුනාද නොදනිමි. ඒත් ඇස්වලින් කඳුළු නොපැන්නේය. අප්පිරියාව... හිරිකිත... පිටස්තරයකු නොදන්නා මිනිසෙකුට යටවී ගත් ජීවිතය. මම නාන කාමරයට වැදී පැය දෙක තුන නෑමි. කිළිටි සේදී යන්නට නෑමි. කුමක් කරන්නද? ගත යුතු තීරණය..... හෙට දවස..... මේ කිසිවක්ම නොවැටහෙයි.

## 03

තුන්වෙනි රාත්‍රිය... ඔහු ඔහුගේ මිතුරන්ට මා භාර දෙන බව කීවේය. මම කාමරය පුරා ඇවිද්දෙමි. වීදුරු පලා යන්නට සිතිනි. ඒත් එය කරන්නට නොහැකි ශාරීක නිසාය. මගේ ජීවිතය කැපකර හෝ ඔහු බේරා ගන්න තියෙනවා නම්... මම දනිස් මත හිස තබා ගත්තෙමි.

"ඇඬුවද..."

එය සවන් ළඟිනි. අරනාය.. මම බියවී හිස එසවීමි. වේලපහ ඔහු ඇවිත්ය. මගේ දෑස ගියේ කාමරයේ දොර වෙතය.

"මං යාළුවෝ අරන් එන්න තරං අමුනුස්සයෙක් නෙමේ."

එහෙම කියා අරනාය මා ළඟින් හිඳ ගත්තේය. පිරිසිදු නොකල ගෙබිම මා ළඟම හිඳ ගත්තේය. මම වහා නැගිට ගත්තෙමි.



http://e-pusthakalaya.blogspot.com



අරනාය මා යහන මත හිදවාලූවේය. අරනායගේ විසල් බැගය යහන මතය.

"මගෙ ඇඳුම්... අද ඉඳන් මං මෙහේ ජීවත් වෙනවා... ඔයා එක්ක..."

පපුව දැවේය. හුස්ම හිරවී තිබිණි. ජීවත් වන්න බැරි බවක් දැනිණි.

"කරන්න දෙයක් නෑ... මේක තමයි මගෙ අම්මගෙ ණය..."

මම කිසිවක් නොකීවෙමි. ඔහු තම මවගේ ණය ඉල්ලන්නේ වරදක් නොකළ තවත් ගැහැනියකගෙනි. 'අමුනුස්සයෙක් නෙමේ' යැයි කිව ආයේ මගේ යටි සිත පහුරු ගෑවේය. ඔහු මනුස්සයෙක් වූයේද? එසේ වූයේ නම් මගේ ජීවිතයට මෙවන් විපතක් ගෙන දේවිද? මගේත් ශාරීකයේත් කැදැල්ල... අනේ... අහෝ කියා ඉවත බලා ගත් මගේ පවුල් ජීවිතය.

"අඩනවද හිනාවෙනවද...?"

ඔහු ඇසුවේය.

"දෙකම..."

ඒ මගේ හිතය. වදන් මුවින් පිටවූවේ නැත.

"මොනාලිසා..."

ඔහු කීවේ මටය. මම හැල්මේ ඒ නෙත් බැලීමි. ඔහු බලා උන්නේ මදෙසය. අප දෙදෙනාම උන්නේ යහන මත හිඳගෙනය.

ඒ නෙත් මග හැර යන්න උවමනා උනත් එය ලෙහෙසි නොවුනේය....

"මං අද ඉඳන් ඉන්නෙ මෙහෙ. ජීවත් වෙන්නෙ ඔයා එක්ක..."

මම තිගැස්සී ගියෙමි.

"ඔයා මේකට කැමති නෑ කියල මං දන්නවා... ඔයා විතරක් නෙමේ මගෙ මැරුණු අම්මවත් මේකට කැමති වෙන්නෙ නෑ දන්නෙ නෑ මේ ප්‍රශ්නෙත් ගැලවෙන හැටි. මං ගෑනියෙක් ළඟට යනව නියා කෙල්ලෙක්ටවත් ආදරේ කරපු කෙනෙක් නෙමෙ. ආයු... ප්ලීස්... දැන් මට ඔයාව ඕන..."

මේ අරන්‍යය. මම වහා නැගී උන්නෙමි.

"මං ශානුකගේ..."

මට කියවිනි. අරන්‍ය වහා මා ඔහු තුරුලට ගත්තේය ගැලවෙන්න එක ඉඩක්වත් නොතිබූ හැටි.

මෙයට මා කුමක් කියන්නද වැටහුණේ නැත. කුමක් කීවත් පලක් නොවන බවත් මම දන්නෙමි. අරන්‍ය හිතට හිතෙන දේ කරනා කෙනෙකි.

"ඇයි මුකුත්ම නොකියන්නෙ..."

ඔහු ඇසුවේය. ඇමති හූපතිගේ ලග අරන්‍යගේ මව බිල්ලක් වන්න ඇත්තේද මෙහෙමය.



http://e-pusthakalaya.blogspot.com



"මන්ද මහ පුදුම දෙයක් පෙරේදා ඉඳන් මට වන අමුතු දේවල් දැනෙනවා. වෛරයට වඩා ආදරේ දැනෙනවා."

මම තිගැස්සී ගියෙමි.

"අනාථිනවා.."

පළමු වරට මම කැගැසුවෙමි. ඒත් අරන්‍ය මා අත්හලේ නැත.

"තමුසෙට මං කවදාවත් සමාව දෙන්නෙ නෑ. මං මගේ ජීවිත කාලෙටම ආදරේ ශානුව විතරයි..."

මගේ කොපුල් හරහා වැරෙන් පහර කීපයක් වැදිනි. මම වීසිව ගියෙමි.

"හොඳින් හරි නරකින් හරි උඹ මගෙ... දැන් මගේ...."

"මේ ගෙදර තමුසෙට ඉන්න බෑ. මේක ශානුකගෙ ගෙදර..."

"ඕකේ... යං... මගෙ ගෙදර."

"වඩින්නං. දැන් තරහ නතුරුකම නිවාගෙන ඉවරනෙ. ශානුක පරාදයි. ජීවිත කාලෙටම ඔයා දිනුම්. ඔයාගෙ තාත්තාගෙ දේශපාලනයත් දිනුම්. දැන්වත් යන්න."

"ප්ලීස් ආයු. කට වහගෙන ඉන්න..."

"මෙහෙන් යන්න..."



Unfiled Notes Page 36

මම හැඬුවෙමි. ජීවිතයේ අවසන් වරට කියා හැඬුවෙමි. ඒත් ඔහු මගෙන් හෝ මවෙතින් හෝ මා තුරුලෙන් හෝ මිදුනේ නැත.

* * * * * * *

ඊළඟ උදයට හිරු පායනවාට මම බියවීමි. ඊළඟ උදය ගැනත් මම බිය වීමි. රාත්‍රියට වඩා දූන් හිරුට මා බියය.

"අද අපි දෙන්නා ෂොපින් යනවා."

මට අරනාථ කීවේය.

"ෂ්... එක වචනයක් වත් කියන්න එපා... මං ඔයාගෙන් උත්තර ඉල්ලුවෙ නෑ... මං යනව කියලනෙ කිව්වෙ... අද ඉඳන් ඔයාගෙ ජීවිතේ ගැන සියලු තීරණ ගන්නෙ මං..."

අරනාථ කුමන කාලයේ කුමන වර්ගයේ, කුමන ගණයේ පිරිමියෙකුදැයි මට වටහා ගන්න බැරි විය. ඒත් ඔහුට අවනත වන්න සිදු වූයේ ශානුක නිසාය. ශානුකගේ ජීවිතය නිසාය. මම අරනාථයත් එක්ක දෙනෝදහක් ගැවසෙන මහ මග ඇවිද ගියෙමි. ශානුක හඳුනන බොහෝ අය මාද හඳුනති. කාගේත් මුහුණුවල වූ සැකය මගින ලැජ්ජාවට පත්කර තිබිණි. ගැහැනියකට ලැජ්ජාව තරම් තවත් ලොකු දඬුවමක් නැතැයි මට හිතිනි. අතුරුදන් වූ ශානුකගේ බිරිඳ මැයෙන් හෙට මාධ්‍ය ලෝකයේ දුවැන්න පෙරලියක් වනු ඇත. ඒ පෙරලිය දෙස වේදනාවෙන් හෝ අමනාපයෙන් බලා ඉන්නට මට සිදුව තිබේ.



http://e-pusthakalaya.blogspot.com



"ආයු ආයු... හොර බැළලි වර එළියට... මගෙ කොල්ලව කොහෙද හැංගුවේ...මගෙ පුතා කොහෙද ගැනියෙ..."

ඒ පසුදා හැන්දෑවය. නැන්දම්මා මගේ ගේ ඉදිරියේ හිදගෙන මොර දුන්නේය. ඉදිරි දොර ළඟට ගියේ අරනාථය.

"ආ.. උඹද මිනිහා. ඇ යකෝ මේකි රෙදි ඇඳන්ද ඉන්නෙ. මගේ කොල්ලගෙ ගෙදර ඉඳන් මගෙ කොල්ලව අතුරුදන් කරල ඒ මදිවට හොර මිනිහව ගෙටත් දාගෙන... ගහල පන්නපිය මේකිව..."

නැන්දම්මා කෑමොර දී ගෙට පිවිසුනාය.

"තව එක අඩියක් තියන්නෙ නෑ..."

අරනාථ කෑගැසුවේය. මම කාමරයේ දොරින් එබුනෙමි. අරනාථ පිස්තෝලය පෑවේය.

"ගෙන ගහපිය දහදුරා..."

නැන්දම්මා මහා නොහොබිනා දේ කියමින් යන්න ගියාය. මම ජනෙල් කුරුවල එල්ලී ඔහේ බලා උන්නෙමි. මා වවුලෙකු විදුලි රැහැනක එල්ලී කෑ ගසයි. උගේ ජීවිතය ගැන අතියත බියක් මට ඇති විය.

"ආයු..."

අරනාථ කතා කළේය. මම කතා නොකළෙමි. ඒ රාත්‍රියේ ගමේ මිනිසුන් මෙන්ම ශානුකට පක්ෂපාතී අය ගෙදරට ගල් ගැසූහ.

පාන්දර වෙද්දී මුළු ගම පුරාම කැලෑ පත්තර අලවා තිබිණි. නොහොබිනා දේ බලන්න බැරි තරම්ය. පුවත්පත් වල පිටු ගණන් තිබුණේ දක්ෂ මාධ්‍යවේදී ශානුකගේ බිරිඳ යනුවෙනි. මම ඇඳ විලයට හේත්තු වී දෙපා කොරවූවකු වාගේ බලා උන්නෙමි. ඇස් වලින් එකම කඳුළක් කඩා වැටුනේ නැත. මා ඉදිරියේ වූ ජීවිතය දෙස මම බලා උන්නෙමි.

"සමාවෙන්න..."

එක වචනයකින් ඔහු කියා දැම්මේය. කොතරම් ලෙහෙසි වචනයක්ද?. අකුරු පහ හයක වචනයකි. ඒත් එයට පාදක වූයේ එතරම් ලෙහෙසියට සමාව ගත හැකි ඉරණම් කතාවක්ද ?

සමාව... ජීවිත කාලයටම නොලැබෙනු ඇත.

"මෙහෙම වන බව නොදැනයි මං මෙහෙම කලේ. තාත්තා තමයි මේකට මාව පෙළඹෙව්වේ. මගෙ අම්මා මැරුන නිසයි මං මේකට මැදිහත් වුනේ. දැන් මට හැරෙන්න බෑ. ඔයාව දාල යන්න බෑ ආයු..."

"මොනවද මගෙන් බලාපොරොත්තු වෙන්නෙ."

මම ඇසුවෙමි.

"ඔයාව ඔයාවම විතරයි.."

පුදුමයත් කෝපයත් දෙකම හදවතේ දෝරෙ ගලන්නට විය.

"මගේ ජීවිතේ විනාශ කළා... ඔයාගෙ අම්මා දේශපාලනේ



http://e-pusthakalaya.blogspot.com

කළෙත් නෑ... මං කළෙත් නෑ... ඒත් අපි දෙන්නම විනාශ වුණා.... ඒ අපි ගෑනු නිසාද? පිරිමියෙක්ට පුලුවන් ගැනියෙක් දූෂණය කරන්න. ඒත් ගැනියෙක්ට බෑ පිරිමියෙක් දූෂණය කරන්න... ඒකද වරද. මං මගේ ශානුකට ආදරෙයි. මං මලත් ආදරේ එයාට විතරමයි. තමුසේ ගැන මට තියෙන්නේ අප්පිරියාවක්... වෛරයක්..."

"ඔයාට මා එක්ක ජීවත් වෙන්නම සිද්ද වෙනවා."

අරනාථ කීවේය. ඇසේ කඳුළත් මුවේ වදනුත් නතර විය. මමය. මාය. මා විතරමය යන වේදනා සාගරයේ මම අතරමං වූයෙමි. මගේ වේදනාව වැඩි වූයේ මගේ අම්මාත් තාත්තාත් ගේ දොරකට දකිද්දීය.

"තාත්තා..." කියා අවසන් වන්නත් කලින් තාත්තා මගේ කොපුල් තරහා වැරෙන් පහර කිපයක් ගැසුවේය.

"නවත්තනව ඕක..."

අරනාථ මැදිහත් වූයේය.

"ඇයි තමුසෙ මාව මරන්නද.. මං මේකිගෙ තාත්තා... මට මං තාත්තා වුණු එකයි දුක. වෙන කිසිම දුකක් නෑ... මේ වගේ දුවෙක්ද හැදුවෙ... වල් වනචර දඟුරා දුවෙක්ද හැදුවෙ. අර රත්තරං වටින ශානුක පුතා දෙයියනේ මුළු රටම කතාවුනේ ඒ දරුවගෙ එඩිතර කම ගැන. අද මුළු රටම කතා වෙන්නෙ ඒ දරුවගෙ ගෑනිගෙ වනචරකම් ගැන. අපි කොහොමද රටට මූණ දෙන්නෙ... ඔය අත්දෙකෙන් වහ ටිකක් දීල මේ අම්මවයි තාත්තවයි මරල දාපං දුවේ....."

තාත්තා හඬා වැටුණේය.

මම ගහක් ගලක් වාගේ බලා උන්නෙමි.

"ලැස්ති වෙන්න දුව ගෙදර යන්න..."

අම්මා කීවාය. ඇගේ ඇස් වලත් මගේ ඇස්වල වාගේම එකම කඳුළක් වූයේ නැත.

"ලැස්ති වෙයං"'

අම්මා කෑගැසුවාය.

"එයා කොහෙවත් යන්නෑ මාව දාලා..."

අරනා කීවේය.

අම්මා මගේ උරහිස් අල්ලා ගත්තාය.

"උඹ එහෙම දරුවෙක් නෙමේ. මට විශ්වාසයි දුවේ. කියපං මේ මොකද... උඹ උඹේ ජීවිතේට කරගෙන තියෙන්නේ..."

"අම්මලා යන්න..."

මම කියා ගත්තෙමි. තාත්තා මදෙස තියුණු ඇසකින් බලා උන්නේය.

"මං ප්‍රාර්ථනා කරනවා උඹට වරදින්න එපා කියලා... ඒත් ඔය හූපතිගෙ පුතා... උඹ ලොකු අමාරුවක වැටුනෙ පුතේ... අපට කරන්න දෙයක් නෑ... උඹ උඹවම විනාශ කරගත්තා..."





තාත්තා ගෙයින් මිදුලට බැස අම්මාගේ අතින් අල්ලාගෙන යනකම් මම ඔහේ බලා උන්නෙමි.

ආරියවතී රෙදි පොටෙන් කඳුළු පිස්සාය.

"අද ඊ අපි මෙතෙන් යනවා..."

අරනා කීවේය.

"නැහැ"

මම කීවෙමි.

"ශාත්‍රකගේ ජීවිතේ තියෙන්නෙ තාත්තගෙ අතේ... මට මුකුත්ම කරන්න දෙයක් නෑ දූනේ, තාත්තා කියනවා මගෙ ආරක්ෂාවට ඔයාව අරන් මෙතැනින් පිට වෙන්නලු..."

"ආදර්ශමත් තාත්තෙක්..."

මම කීවෙමි. අරනා මුදු මදහසක් නැගුවේය.

"ලැස්ති වෙන්න."

එය අණකි.

"ආරියවතීව ගමට අරින්න."

මම කීවෙමි.

"හොඳයි. ආරියවතී අද ඊම ගමට යන්න. මේ කිසි දෙයක්..... කාටවත් කිව්වොත්... ඒක ආරියවතීගෙ අන්තිම දවස වේවි...."



http://e-pusthakalaya.blogspot.com

ආරියවතී කියෙන් ගැහෙමින් හැඬුවාය. ඈ මා හැර ගියේද හඬමිනි. අරනය ඔහුගේ සැප පහසු රියට මා නංවා ගත්තේය. මම තවත් සැරයක් මගේත් ශානුකගේත් කැදැල්ල දෙස බැලුවෙමි. මගේත් ශානුකගේත් කැදැල්ල මා ආදරයෙන්... සෙනෙහසින් රැක බලා ගත් අපේ කැදැල්ල... මම අවසන් වරටත් එය දෙස බැලුවෙමි.



04

අලුත් ජීවිතයක්... මොනවගේ අලුත්ද... ලොකු ගෙයක්... දුසි දස්සන් එහෙම ගෙයක්ද ... ඔව් සියලු දෙයට ආවතේව කාරයින්... වොසිලට් එකට යන්න විතරයි තනියෙන් යන්න පුළුවන්... අනිත් හැම දේකටම අත් උදවු කාරයන්... ගරු සැලකිලි... අරනයගෙ පෙම්වතියද... බිරිඳද... අනියම් බිරිඳද...... මේ කෝක හරිද මං දන්නෙ නෑ. අරනයයි මමයි විතරයි නෝනයි මහත්තයයි වගේ හිටියෙ.... මං කාමරෙන් එළියට ආවෙත් නෑ... අපේ ගෙට වඩා ලොකු කිසිවක් අඩු නැති කාමරය... ඇඳ පුටු සෙටිය... අල්මාරිය... හැමදේම පිළිවෙලයි. අපිළිවෙල මේ පිළිවෙල කාමරය ඇතුලෙ ඉන්න මං විතරද......

"වොෂ් එකක් දාන් පහළට යං කන්න..."

අරනය කීවේය. මං හීලෑ කරපු පුංචි මීච්චියෙක් වගේ නාන කාමරයට ගියා. වතුර මල යටින් ඇස්වල බරට තිබුණු කඳුළු



The Reader's Paradise E-Book
The Spirit of Sri Lankan e-community
http://e-pusthakalaya.blogspot.com

ගලා ගෙන ගියා. ශානුක එක්ක ගෙවපු ජීවිතේ මොන තරම් සරලද? ඒ සරලකම ඇතුළෙ මොන තරං ලොකු ජීවිත කතාවක් තිබුණද?.

"යං කන්න"

අරන්‍ය නාන කාමරේ දොර තල්ලු කළා. මට වහන්න අමතක වෙලා. ඒ මගේ පළමු අමතක වීම. මගේ නග්න රූපය දිහා අරන්‍ය බලා හිටියෙ වශීවෙලා වගේ. එයාට තවත් බලා ඉන්න බැරිවුණා. එයා කගල් මාව තුරුලු කර ගන්න එක. මාව තදින් සිප ගන්න එක. සියල්ල ඔහුට කැමති අයුරෙන් සිද්ද වුණා.

"මං ඔයාට ආදරෙයි. මං ඔයාව කසාද බඳිනවා."

අරන්‍ය කිව්වා. මං මුකුත්ම කිව්වෙ නෑ. මට මාව දැනෙන්නෙ කොහොමද?. ඇත්තටම මට මාව දැනෙන්නෙ නැති තරම්. මට මාව තේරුම් ගන්න බැරි වෙලා යනව වගේ. මටම නොතේරෙන මානසික අවුලකින් මං හිටියෙ. රෝස පාට සාරියක් ඇඳල දිග කොණ්ඩය පිටට කඩා වැටෙන්න දීල, රෝස මල් කුමාරි වගේ අරන්‍යගෙ අතක එල්ලිලා මං යනවා. මේ කොහෙද අපි යන්නෙ. මං කවදාවත් ඇහුවෙ නෑ. මට හිතාත් යනව, කඳුළුත් එනවා. මාවම නොතේරෙනවයි කියන්නෙ ඒකයි.

"මට ඔයා එක්ක ටිකක් නිදහසේ ඇවිදින්න හිතුනා. අනික ගේ ඇතුළෙ කට්ටිය වැඩියි."

අරන්‍ය කීවේය. ඇත්තනේ... අපි ඇවිදගෙන යනවනේ. මට ඒකත් අමතක වුණා. සියලු දෙයින් මොහොතකට ඈත්වීම මනසට විවේකයක්. මටත් එවන් විවේකයක් අවශ්‍ය විය.





"මුලු ජීවිත කාලෙටම ඔයාව බලා ගන්නවා. ඔව්"

අරන්‍ය කීවේය.

"මොනා හරි කියන්න ආයු... මට තේරෙන්නෙ නෑ. මට මොකව වෙලාද... මට ඔයා ඕන. පුදුම තරං ඕන..."

අරන්‍ය කීවේය.

මම කිසිවක් නොකීවෙමි. අරන්‍යගේ වචන ඇසෙයි. ඒ වචනවල අර්ථය නොවැටහෙයි. සියලු දේ හිස්ව දැනී යන්නේ ඇයි ?.

"ආයු අපි අතනින් ඉඳගමු ටිකක්..."

අරන්‍ය පාර අයිනේ තිබුණු ගල් බංකුවක් පෙන්නුවේය.මම නිදහස් ඇස් පෑවෙමි. ඔහු එක්ක මේ ගෙවා දමන්නට පටන් ගන්නා ජීවිතයට ජීවිතයක් කියන්නේ කොහොමද?

"ඉඳගන්න."

ඔහු මගේ අතින් අල්වා මා හිඳවාලූවේය. මම හිඳගත්තෙමි.

"මං ඔයාගෙ ඇස් දෙක ඉදිරියෙ සල්ලාලයෙක්. නරක මිනිහෙක්..."

ඔහු කියවන්න ගත්තේය. මම ඒ දීප්තිමත් ඇස් දෙස බැලුවෙමි. සංවේදී සිංහල නළුවන් නැති නිසා ඔහු සංවේදී හින්දි නළුවකු වාගේයි කීම නිවැරැදිය. එතරම්ම සංවේදී කමක් ඒ නෙත්වල විණි.

http://e-pusthakalaya.blogspot.com

"ඒත් ආයු මේ අවුරුදු විසි හතරටම මං කෙල්ලෙක්ට ආදරේ කරල නෑ... කෙල්ලෙක්ගෙ අතින් අල්ලල නෑ. මං මගෙ මුලු හදවතින්ම ආදරේ කළේ මගෙ අම්මට. එයා නැති වුණා. ඔයාගෙ මහත්තය නිසා. මාධ්‍යවේදියෙක්ට යුතුකමක් තියෙනවා. ඒත් පැපරාසි වගේ පෞද්ගලික ජීවිතේ දේශපාලනයට ඇදා ගන්න ඕන නෑ. මගෙ අම්මා මැරුණෙ ශානුක නිසා කියන එක විතරයි මගෙ හිතේ තිබුණෙ. ඒක වෛරයක් වුණා. ඒ වෛරය මගෙ නහර පුරා දිව්වෙ තාත්තා නිසා. මේක මේ විදිහට කරන ප්ලෑන් එක තිබුණෙ තාත්තාට. ඇත්තම කිව්වොත් ඒ ප්ලෑන් එක හොඳ හෝ නරක වේවා මම පිළිගත්තා. තාත්තාගෙ වයිෆ් වසන්ති ආන්ටි. එයාට පුත්තු දෙන්නෙක් ඉන්නවා. දැන් මට හිතෙනවා මේ ගේම් එකට තාත්තා එයාගෙ අතින් පුත්තු දෙන්නව යොදවන්නෙ නැතුව මාව යෙදෙව්වෙ මගෙන් එයාට වැඩක් නැති නිසා කියලා. අපට හැම සැප සම්පතම දුන්නා තමයි.... ඒත් අනේ මංදා...."

අරනාය කතාව මදකට නතර කර මගේ මුහුණ බැලුවේය.

"මුලින් දවස් දෙකේ ඔයාට බලහත්කාරකම් කරද්දි මගෙ හිතේ තිබුණෙ පළිගැනීම විතරයි. ශානුකව ඉවරෙටම ඉවර කරනව කියන හැඟීම විතරයි. ඒත් දෙවෙනි දවසෙ මං ඔයාගෙ ගෙදරින් පිටවෙද්දි මං දැක්කා හරියට පොඩි ළමයෙක් වගේ නයක් හතරක් නොදන්න දරුවෙක් වගේ ඔයා බයට ගුලි ගැහිලා නිදාගෙන ඉන්න හැටි. ඒ වෙලාවේ හදවතට දැනුණ දේ මං දන්නෙ නෑ. ඒත් මං ඔයාව අතරමං කරන්නෙ නෑ. මං ඔයාව විනාශ වෙන්න දෙන්නෙ නෑ කියලා මං තීරණය කළා...."

ඔහු කතාකර අවසන්ය. කළුවර හමු වූ අහස කොළඹටත් ගමට වාගේම දැඩි දුකක් එකතු කර තිබිණි. දහවලට දෙනෝදහක් ගැවසෙනා නගරය මෙතරම්ම නිරවුල් නිහඬ තැනක් කරන්නට කාලයට හැකි වීම අරුමයක් සේ මට දැනිණි.

"ඇත්තම නම් මං ඔයාට ආදරේ කරන්න පටන් අරගෙන. මට ඔයා නැතුව බැරි තරන්. අපි මේ ප්‍රශ්නෙ ලිහා ගමු. ඔයා ශානුකගෙන් ඩිවෝස් වෙන්න. මං ඔයාව කසාද බඳිනවා."

"මං මැරෙනකම්ම ශානුකගෙ"

මම කීවෙමි.

"මම බලෙන් හරි ඔයාව මං ළඟ තියා ගන්නවා..."

"බලෙන් ඕන දෙයක් ගන්න පුළුවන්. කැමැත්තෙන් කිසිම දෙයක් ගන්න බෑ..."

"මං කවුද කියලා ඔයාට තේරෙයි. අපි දැන් යං...."

අරනාය මගේ අතක් අල්වා ගත්තේය. ඔහු වලකන්න බැරිය. සියල්ල ඔහුගේ කැමැත්තටය. මම මට හිමි නැති ශරීරය රැගෙන සක්මන් කළෙමි.

"අම්මා ඉද්දි හිටපු සර්වන්ට්ලාගෙන් කුස්සියෙ උයන කිරි අම්මයි, වැඩට උදව් වෙන වර්නි අයියවයි තියලා අනිත් සේරම යවන්න කියලා මං තාත්තට කිව්වා."

අරනායයට මගේ අකමැත්ත තේරෙන්නා සේය. ඒත් ඇත්තම නම් කවුරු කොහොම උන්නත් මට දැන් නොඉන්නා හා සේය. මා විතරක්ම ඉන්නවා වාගේ හුදෙකලාවක් මට දැනෙයි. අපි තවත් පියවර කිහිපයක් ඉදිරියට තැබුවෙමු. සැප පහසු මෝටර් රථ කිපයක් පෙළ ගැසී ඉදිරියට ආවේය. අරනාය නතර විය. වාහන


http://e-pusthakalaya.blogspot.com

පෙළද නතර විය. පසුපස වූ වාහන වලින් වහා ආරක්ෂක සේවයේ උන් තරුණයින් බැස ඇමතිවරයාට ආරක්ෂාව සපයන ලදී. වහ වහා ඇමතිවරයා අප වෙත ආවේය.

"ඔළුව දාන්න කිව්වම මුළු සර්වාංගෙම දම්මා..."

ඇමතිවරයා ගුගුලේය.

"දන්ම ගිහින් බස්සපං ඔය කෙල්ලව"

"ඒක කරන්න බෑ..."

"ඇයි... උඹට විකාරද ?"

"ආයුට ඒ ගමේවත්... ඒ ගෙදරවත් ඉන්න බෑ. ඒ මිනිස්සු තරහින් ඉන්නෙ."

"ඒක තමයි මට වෙන්නත් ඕන නැතුව උඹ මේකිව කර ගහන්නද හදන්නෙ. එතකොට මොකද වෙන්නෙ. මේ වැඩේට මාව ගැවෙන එක විතරක් නෙමේ. රටවුන් මට හිනාවෙනවා."

"භූපති සූරිය පෙරුම"

අරනා කතා කළේය.

භූපති මොහොතකට නිගැස්සුන තරම්ය.

"ඔහේට ගැහියෙක්ගෙ ජීවිතේවත්, ආත්ම ගෞරවයවත් බිංදුවකට වටින්නෑ කියල මං දන්නනවා. ඒත් මං ඔහේගෙ ලේ වලින් උපන්නට මට මගෙ අම්මව තරම්ම ආයුවත් වටිනවා."

"අරනා....."



http://e-pusthakalaya.blogspot.com



භූපති ඇමතිතුමා කෑ ගැසුවේය.

"මිස්ටර් භූපති සූරියපෙරුමට තියෙන්නෙ තමන්ගෙ වැඩක් බලා ගන්න. මං ඔහේගෙ කීම අහල කළේ හරි දෙයක් නෙමේ. ඒකෙ වන්දියත් මං ගෙවනවා...."

"එහෙමද?"

"එහෙමයි..."

"මං ඔකිව මරනවා...."

"එහෙම හිතන කෙනාටවත් හොඳක් වෙන්නෙ නෑ."

"අරනා මොලේ කල්පනා කරපං...."

"මං ආයුට ආදරෙයි..."

අරනා කෑගැසුවේය. භූපති ඇමතිතුමා වහා ගොස් තම රියට නැගී පලා ගියේය. ආයේ අරනා මගේ අතැඟිලි තදට අල්වා ගත්තේය.

"බයද?"

මම කිසිවක් නොකීවෙමි. බය මගේ ජීවිතයෙන් අයින්ව ගොසිනි. බය නොවේ ඇත්තේ ලැජ්ජාවය. ලෝකයෙන්ම ප්‍රවේගම් වී පබාවතී වාගේ හැදී වැඩුණු දියණිට මේ සිදුව තිබෙන විපත. ලෝකය ඉදිරියේ නම් අවලම් ගැහැනියකි. මේ අවලම් මැසිවිල්ල මගේ අසරණ දෙමාපියන් කොහොම දරා ගන්නද?

"මාත් එක්ක කතා කරන් නැද්ද?"

අරනා ඇසුවේය. මම ඒත් කතා නොකළෙමි.

## 05

අනාගතයක් නැති වර්තමානය තුළ මම අරනාගේ විසල් නිවසේ විඩාබර ජීවිතයක් ගෙවූයෙමි. උවමනා වූයේ කෙසේ හෝ ශානුක සොයා ගන්නය. ශානුක ඉදිරියේ විතරක් මගේ නිදොස් බව කියන්නටය. ඉන්පසු සදහටම දෙනෙත් පියවා ගත්තත් මට දුකක් නැත. සදහටම මේ ජීවිතය අතරින්නට මට බියක් නැත.

අත්හැරීම....

සියලු දේ අත්හැරීම....

අරනා එයාට අයිති හැමදේම මං නිසා අත් ඇරගෙන තිබුණා. තාත්තා, නෑදෑයො, හිතවතුන් විතරක් නෙමේ සියලු සම්පතමයන්... ඒ අතරේ දේශපාලනය... පාතාලය ඔය හැමදේම. දේශපාලනය තියෙන තැනනෙ පාතාලෙත් තියෙන්නෙ. දේශපාලඥයා කියන්නෙ අනුන්ගෙ පිහිටෙන් තමන්ගෙ බලය





පවත්වාගෙන යන අයනෙ. මම අරනාගෙ නිවසෙ ගෙව්වෙ නිහඬ ජීවිතයක්. අරනා ගැන මහා ලොකු කාලයක් නොගෙන මට තේරුම් ගන්න පුලුවන් වුණා. අරනා කියන්නෙ ගැනියෙක් ප්‍රාර්ථනා කරන විදිහෙ සැමියෙක්. මගේ පුංචිම දේත් අරනාගෙ ඇස්වලට ග්‍රහණය වුණා. අරනා දේශපාලනයෙන් සම්පූර්ණයෙන්ම ඈත් වෙලා එයාගෙ බිස්නස් විතරයි කරගෙන ගියෙ. මොන තරම් වැඩ තිබුණත් අරනා මගෙ කන බොන දේවල්, මගේ පුංචිම පුංචි අවශ්‍යතා ගැනත් හොයල බැලුවා.

දවස්...

සති

මාස...

කාලය ගෙවිල ගියෙ කාලය. ඇසින් එකම කඳුළක් නොසොල්වා ගත කරපු කාලය. ශානුක ගැන මිහිරි මතකයක් තිබුණා. ශානුක මගෙ හිත රිදෙව්වෙනෑ කවදාවත්. ඒත් ශානුක මං ගැන හොවල බැලුවද? මගෙ කැම... මගේ ඇඳුම් පැළඳුම්... මගේ ආශාවන්... අවශ්‍යතාවයන් ගැන ශානුකට ගාණක් තිබුණද?

"අද මොනවද ඔයාට ගේන්න ඕන" කියලා ශානුක කවදාවත් මගෙන් ඇහුවද?.

"කියන්න ආයු... ඔයා මොකුත්ම කියන්නෙ නෑනෙ. ඔයාට ආස දෙයක් කියන්න. මං ගේන්නං."

අරනා හැමදාම ගෙයින් එළියට බහිද්දී එහෙම අහනවා. ජීවිතේ පසුතැවිල්ලක් දනෙනවා. ඇයි මං ශානුකයි අරනායි



http://e-pusthakalaya.blogspot.com

සංසන්දනය කරන්නෙ. ශානුක මගේ සැමියා. අරනා දූෂකයා. හදවත ගේන හුගක් ප්‍රශ්නවලින් මං පැනල යන්නෙ එහෙම අරන්‍යගෙ අලුත් ගෙදරට ආවට පස්සෙ. ජීවිතේ හංගගෙන ජීවත් වෙන්න මට පුළුවන් වුණා. ඒත් මං ගැන... අරන්‍ය ගැන...

පත්තරවල ලොකු අකුරෙන් පළවුණා. "මාධ්‍යවේදියා අතුරුදන්, බිරිඳ ඇමතිගේ පුතා එක්ක පැනයයි." එක එක පත්තරවල එක එක කතන්දර. ඇහින් දකින දේවල්, කණින් අහන දේටත් වඩා ලොකු දෙයක් ජීවිත ඇතුළෙ තියෙනවා නේද? එක දිගට ඇහුනෙ දෝෂාරෝපණය, විද්‍යුත් මුද්‍රිත හැම මාධ්‍යයකින්ම මට... මගේ මුළු ආත්මයටම මඩ ගැහුවා.

මඩ....

අරන්‍යගෙ අම්මට ශානුක ගහපු මඩටත් වඩා ලොකු මඩක්... අද ශානුකගෙ බිරිඳට අරන්‍ය නිසා... අරන්‍ය නිසා....

යන්තං ඇස් ඇරගෙන මං දවසක් එතකං බලා ඉන්නවා. මටම කියල හුස්ම ගන්න පුළුවන් දවසක්.

"ආයු..."

අරන්‍ය මගේ කාමරයෙ. මගේ කිව්වට මේක මගේ නෙමේ...

"බලන්න දවස් ගානකින් කොණ්ඩෙට අත තියල නෑ. එන්න."

මම බැහැ කියන්න හිස සැලීමි.

"මං ඔයාගෙ වැරදි කාරයා. ඇත්ත... ඒත් ප්ලීස්..."





මොකක්දෝ අහේතුවකට මට නැගිට්ටුනා. අරන්‍යගෙ ඇස් සතුටින් පිරුණා. මගෙ හදවත ගැඹුර මෙහෙම කිව්වා...

"බොරුවට හරි ආදරේ කරපං... ඌරගෙ මාළු උරගේ ඇගේ තියලම කපපං. ශානුක ඉන්න තැනක් දන ගන්න ඕන නං."

ආයුට කොහොමද එහෙම් කරන්න සිතුවිලි ආවේ. ඇත්තටම ආයු මෙහෙම අනුන් රවට්ටන්න හිතුවද?.

"ඉඳගන්න..."

අරන්‍ය මාව සයනය ඉස්සරහ තිබුණු පුංචි පුටුවේ ඉන්දවල මගෙ කොණ්ඩෙට සුවඳ තෙල් ටිකක් වත්කලා. හෙමිහිට කොණ්ඩෙ පිරිමැද්ද. ඇස් දෙක පියාගෙන හිටියෙ ඇත්තටම සතුටෙට... අම්මා තෙල් ගාද්දිට වඩා අරන්‍ය තෙල් ගාද්දි නින්ද යන්න ආවා. අම්මා නම් තෙල් ගාද්දි රිද්දනවා. ඒත් අරන්‍ය එහෙම කළේ නෑ. පොඩි ළමයෙක්ට ආදරයෙන් සලකනවා වගේ.

"මට සමාවෙන්න ආයු... මං විඳෝනවා..."

අරන්‍ය කිව්වේ හෙමින් මගෙ හිසකේ පනාවෙන් පීරමින්.

"තියපොතු.."

අරන්‍ය මගෙ වැඩුණු නියපොතු දක්කා. කොණ්ඩෙ ගොතන එක නතර කරල අරන්‍ය මගෙ නියපොතු කැප්පුවා. අනේ වීතරක් නෙමේ කකුලෙත්... හදවතට කවුද තට්ටුවක් දම්මා. කොතැනකද කවදාදා මෙහෙම ආදරෙන් සැලකුවේ. බොරු මේ මාව අල්ල ගන්න දාන පුංචි පුංචි ට්‍රික්ස්. මං හදවතට පැහැදුවා.



http://e-pusthakalaya.blogspot.com

තියෙපොතු කපල ආමෙය අරනා මගෙ කොණ්ඩෙ පිරුවා. දිග කොණ්ඩෙ කරලකට ගෙතුවා. හොඳටම ගෙතුවා.

"අම්මගෙන් ඉගෙන ගත්තෙ"

මම කොණ්ඩෙ දිහා බලා ඉද්දි අරනා කිව්වා. වෙලාවකට අරනාගෙ ආදරේ පිස්සුවක් කියල හිතුනා. ඇස්වලට කඳුළුත් ආවා. මං කෑවෙ නැත්නම් අරනා බත් ගුලි හදල මට කැව්වා. දෙයියනේ මේ අරනාගෙ අම්මා අරනාට උගන්නපු ජීවිතේ තේද?.

"මේ කටත් කන්න ඕන"

"ඇති"

"අනේ ආයු..."

අරනා බල කලා. වාහන කීපයක් ගේට්ටුව ළඟ නතර වුනෙත් ගේට්ටු ඇරුනෙත් එකම වෙලාවක. අරනා ගණනක් නැතුව මට බත් කැවුවා. සාලෙට ඉදිරි දොරෙන් මතුවුණේ භූපති ඇමතිතුමා. මට බත් කවනවා දකලා ලැජ්ජා හිතුනේ භූපති ඇමතිතුමාට. භූපති ඇමතිතුමා අඩිය ටයිල් පොලොවේ හැප්පුවා.

"අවලම් බල්ලා... ජාතකේ වරද? උඹ මේකිව ගෑනි කර ගත්තද?"

අරනා කතා කළේ නෑ.

"ඒයි... මෙහෙ වරෙල්ලා... මේකිව ඇදලා දාපං දොට්ට..."

භූපති ඇමතිතුමා කෑගැහුවා.



http://e-pusthakalaya.blogspot.com



"අත තියන්න එන්න එපා..."

අරනා අතින් බත් පත වැටුණා. මාව එදා දූෂනය කළේ මේ තරම් බයගුල්ලෙක්ද කියලයි හිතුණේ. ඒ එඩිතර කමේ හැටියට මෙතන ඉන්න දහ දොලොස් දෙනෙකුට ඇනගෙන ඇනගෙන යන්න තිබුණා. ඒත් අරනායට ඒ තරම් ශක්තියක් නැති වුණා.

"දාපං මේකිව එළියට. රට්ටු මට හිනාවෙනවා. මාව කෑවා..."

අරනායට කවුරුත් ගැහුවෙ නෑ. ඒත් අරනාව හැඩි දැඩි මිනිස්සු උස්සල අරන් තදට අල්ල ගත්තා. තවත් කීප දෙනෙක් මාව අල්ලා ගත්තා.

"ඇදලා දාපං..."

"ගෙනියන්නද ?..."

එකෙක් ඇහුවා.

"ඒයි ආයුට අත තිබ්බොත් උඹල කපලා දානවා... සේරම මරල දානවා. ඉස්රම විනාශ කරල දානවා..."

අරනා කෑගැහුවා.

දේශපාලන බලය... හැමදේම යටයි දේශපාලන බලයට...

"ඒ ගැනිව යන්න ඇරපං යන අතක. ඔය ගෑනි ගඟක මුහුදක පනියි.... පනින්න දීපං... උඹල ඔය පවට හවුල් වෙන්න එපා..."

හූපති ඇමතිතුමා කිව්වා.

"තමුසෙ තාත්තා කෙනෙක්ද? ඒ පවට හවුල් කරගන්නෙ මාව. මාව නේද?"

අරනාය කෑගැහුවා.

"උඹ කොල්ලෙක්. මං උඹට කිව්වෙ නාල ගෙට එන්න. නැතුව මඩ නාගෙන ගෙට එන්න නෙමේ. ඒත් උඹ කලේ ඒක. දාපං ඕකිව ගෙයින් එළියට. ඇයි බලා ඉන්නෙ දාපාල්ලා..."

ඒ මිනිස්සු මාව අල්ලලා ගෙයින් එළියට විසික් කළා. තාප්පෙන් එළියට යනකං, වැහිපොද වැටෙන රාත්‍රිය... ඇඳන් හිටපු ගවොම පිටින්... මහ මග... තාත්තෙ අම්මෙ ඔයාලා දන්නවනං මේ දූවට වුන දේ... කොහතින් කොහේට ජීවිතේ අරගෙන ගියාද?...මට කරන්න ඕන මුකුත්ම තේරුණේ නෑ. රටට ලෝකෙට මූණ දෙන්න බෑ. අම්මලා තාත්තලා ළඟට යන්න බෑ... ඒ මිනිස්සුන්ට අවසන් කාලෙදිත් මං නිසා අපහාස විඳින්න දෙන්න බෑ... ඇත්තටම මට ඇඬුනා. යන්තං වැටුණ වැස්ස මුරුගසන් වැස්සක් වුණා. මං බස් නැවතුමට වුණා. අනේ සතයක් නෑ. ඇත්තටම හූපති කිව්ව වගේ මට දැන් තියෙන්නෙ මැරෙන්න විතරයි. ශානුක ගැන දුකක් ඇති වුණා... එයා ජීවත් වෙනවද... මරල දාලද... කාත් කවුරුවත් නැති වුණු ජීවිතේ අරන් මං කොහනකට යන්නද?...

"ඇයි නංගී... සපෝට් එකක් ඕනද?"

යතුරු පැදියක තරුණයො දෙන්නෙක් හොඳටම බීගෙන.

"නැහැ".





"අඩල...? ගෙදරින් පැන්නුවද? එන්න අපි උදව්වක් දෙන්නං..."

එකෙක් බයිසිකලෙන් බැස්සා. මට කරන්න තිබුණෙ දුවන එක. මං මුරුගසන් වැස්සෙ අඬ අඬා දිව්වා. බයිසිකලේ එනවා. ඒත් බයිසිකලේ පනුකරගෙන ඇවිත් මගේ දෙපා ළඟ නතර වුණේ. අරනායගෙ කාර් එක.

"ආයු..."

මං දෙපාරක් නොහිතම අරනායගෙ කාර් එකට නැංගා. මාව දැකලා අරනායට ඇඬුනා. ඒ ඇස්වලින් කඳුළු ගැලුවා. වාහනේ ගෙදරට ඇවිත් ගේට්ටු ලොක් කළත් අරනාය වාහනේම හිටියා.

"හොඳටම තෙමිලා..."

එහෙම කියලා එයා පොඩි ළමයෙක් වගේ අඬන්න ගත්තා.

"හොඳින් ජීවත් වෙන්න බෑ ආයූ... මං ඊළඟට ඕන දේකට ලෑස්ති වෙනවා. ඔයාට අතක් තියන්න දෙන්නෑ ආයු"

අරනාය හයියෙන් මාව තුරුලු කර ගත්තා. මං සීතල වෙලයි හිටියෙ. අරනාය මාව කාමරයට එක්ක ගියෙ උස්සගෙන ඇත්තටම මගෙ දෙපා පණ නැතුව ගිහින් තිබුණා.

"මං කොහොමද සමාව ගන්නෙ... කොහොමද ආයූ..."

එහෙම කියල අරනාය මගේ කකුල් දෙක ළඟ ඇද වැටුනා. මගේ කකුල් අල්ලලා වැන්දා. මං ඇද උඩින් වාඩි වුණා. හදවත සෙලවුණා. ඇත්තටම එහෙම වුණා.

http://e-pusthakalaya.blogspot.com

මහ රෑ සීතල දැනුණා. අත පය සීතල වෙලා මාව ගැහෙන්න ගත්තා. තදට උණත් අරගත්තා. රෑ එළිවෙනකම්ම අරනා මං ළඟට වෙලා නිදා නොගෙන හිටියා. මට පෙනඩෝල් දුන්නා. රෑ එළිවෙනකම්ම නළලෙ ඕඩිකොලොන් තැවරුවා. මට මතක් වුණා මං දවසක් ශානුකගෙ ගෙදරිදි අසනීප වුණා. ගැහි ගැහි උණ ගත්තා.

"ශානුක මට හොඳටම උණ"

"මං පොඩි වැඩ වගයක. ඔයා අපෙ අම්මවත් ගෙන්න ගෙන බෙහෙත් ගේන්න යන්න."

පනුවදා උදේවත් ශානුක මාව බලන්න ආවෙ නෑ. ශානුකට ඒ තරම් වැඩ තිබුණා.

"සොරි ආයු.. ඔයා තරහද?"

ශානුක ඇහුවා. මං හිස වුණුවා 'නෑ' කියන්න.

"ආයු..."

අරනා හෙමින් කතා කරනවා.

"ගිහින් නිදාගන්න අරනා"

මං කිව්වා.

"නැහැ අපි පාන්දරම ඩොක්ටර් ළඟට යං..."

"එපා ඔයා ඔයාගෙ වැඩක් කරගන්න. ඔයාගෙ බිස්නස් වැඩ අවුල් වෙයි..."





"විකාර... ඕව මොනවද? මට ඔයා තරං ඔය මුකුත් වටිනවද?"

ආයෙත් ගිත තිගැස්සුනා. හදවතේ සැරින් සැරේට දෝංකාරය දුන්නෙ අරනා කියපු දේවල්.

ගැනියෙක්ව තමන්ට නතු කරගන්න පිරිමි ළඟ ආයුධ තියෙනවා. පිරිමි කියන්නෙ වෙලාවකට වේදිකාවක රඟපාන නළුවන්වගේ. ඒත් අරනාට එහෙම අදහසක් තිබුණෙ නෑ කියන එක මං දන්නවා. අරනා කියන්නෙ හැම දේම සර්ව සම්පූර්ණ කොල්ලෙක්. එයාට ලස්සන ගෑනු ළමයෙක් කසාද බඳින්න පුළුවන්. මං මන්නෙ නැතෙන්නෙ ඇයි? සමහර විට එයාගෙන් මට වුණු වැරදි නිසා වෙන්න ඇති.

"ඔයාට දැන් සනීපද?"

දවස් දෙකකට පස්සෙ මට මළව උස්සන්න පුළුවන් වුණා. මං උස වීදුරු ජනේලයෙන් පිටත බලාගෙන හිටියා. අරනා ඇවිත් මගෙ ඉස්සරහින් පුටුවක් ඇදගෙන වාඩි වුණා.

"කැවද?"

මම ඔව් කියන්න හිස වැනුවා...

"ටිකක් එළියට යන්ද? කම්මැලි නේද?"

මම "බැහැ කියන්න හිස සැලුවා.

"ජීවිත කාලෙම මෙහෙම ඉන්නවද. නාඳුනන අය වගේ"

මං කතා කළේ නැහැ.



http://e-pusthakalaya.blogspot.com

"මං ඔයාට හුඟක් ආදරෙයි."

ආයෙ අරනා කිව්වා.

"මං කසාද බැඳපු ගෑනියෙක්. ජීවිතේ අවුල් වෙලා තමයි. මට රටකට යන්න උදව් කරන්න. ඒත් ඊට කලින් එකම එක සැරයක් ශානුකව පෙන්නන්න. එච්චරයි ඕන..."

මං කිව්වා. අරනා මං දිහා බලාගෙන හිටියා. එයාගෙ ඇස් වලට කඳුළු ආවා.

"ඔයා කවදාවත් මට ආදරේ කරන්නෙ නෑ. මං දන්නවා... ඒත් මට ඔයා නැතුව බෑ..."

"මට සිද්ද වුණ දේවල් නිසා ඔයා මං ගැන වද වෙන්න එපා අරනා. මාව අමතක කරල අලුත් ජීවිතයක් පටන් ගන්න..."

"මට කවදාවත් එහෙම කරන්න බෑ. මට ඔයා නැතුව එක දවසක්වත් ජීවත් වෙන්න බෑ. මාව තේරුං ගන්න. මං ඔයාට ඇත්තටමයි ආදරෙයි. ඔයාට මගෙන් වුණු කරදර නිසා නෙමේ. මං ඔයාට ආදරේ කරනවා...."

අරනා කිව්වා. මං අරනා දිහා බලාගෙන හිටියෙ එහෙම වෙන්න පුළුවන්ද කියල මට හිතුන නිසයි.

"තාත්තා දන්නෙ නෑ ඔයා මං ගාව කියලා. මං ඔයාව බලා ගන්නවා. ශානුක ජීවත් වෙනවද නැද්ද කියලා මං දන්නෑ. ආයු මේ ඇත්තමයි..."

එවෙලේ තමී මට ඇඬුනා. මහා ලෝහ කම්බින් රැකගත් දෙයක් අහිමි වුණා වගේ මං ඇඬුවා.



http://e-pusthakalaya.blogspot.com

## 06

ශානුක ජීවත් වන බවට කිසිදු තොරතුරක් ලැබුණේ නැත. මාධ්‍ය වලින් ඔහු ගැන කතා කිරීම නතර කර දමමේය. ඔහු අතුරුදන් වී තිබේ. ප්‍රේමදාස පාලන කාලයේ වාගේ ඔහු අතුරුදන් වී තිබේ. දේශපාලනයට කෙතරම් දේ කළ හැකිද? කළ නොහැකි දෙයක් නැත. ආයේ ශානුක කිසි දිනෙක ඒ යැයි ඇදහිය නොහේ. එය හීනයක් විතරය.

"ආයු..."

අරනා සුදු කමිසය කලු කලිසමට යටකර නැම්පත් ලෙසින් මදෙස බලා හිඳියි. ඒ නෙත් ව්‍යාකූලය. කුමක්දෝ අඳුරක් මෙන් මට දූනේ.

"ඇයි"

මම ඇසුවෙමි.

"ගමනක් යන් ඇඳගන්න..."

"කොහෙද?..."

"යන ගමන් කියන්නං"

කුමක්දෝ මූසල හැඟීමක් හදට දැනිණි. මම අරන්‍ය මට තෑගි දුන් බොහෝ ඇඳුම් අතරේ සුදට හුරු ඇඳුමක් සෙවීමි. සුදුසු සුදු ගවොමක් ගත්තෙමි. දිග කොණ්ඩය කරලකට ගෙතීමි. කැඩපත ඉදිරියට ගියේ බොහෝ කලකට පසුය. මගේ ජීවිතය මෙතනට ගෙනාවේ මගේ දෙමාපියන්ය යන අභූත චෝදනාව මෙවෙලේ හදවත හඬ ගැවේය. තවමත් මගේ සමවයස් මිතුරියන් අධ්‍යාපනයේ යෙදෙයි. සරසවියක ඉගෙනුම ලබයි. ඒත් අවුරුදු විසිතුනක වයසේදී මගේ ජීවිතය ඉබාගතයේ ගියේ ඇයි? කාගේ වරදකින්ද?...

"ආයු..."

අරන්‍ය... ඔහු කතා කරයි.

මම ඔහු දෙස බලා උන්නෙමි.

"ලස්සනයි... පිං පාටයි..."

ඒ ඇසට කඳුළු ආවේය. මේ තරම් සංවේදී කමක් ඇයි. මා වෙතට පැමිණි අරන්‍ය මගේ උරහිස තදට අල්වා ගත්තේය.

"ඔයාව නැති කරගන්නෑ මං කවදාවත්"

මම කතා නොකළෙමි. වාහනයට නැගුනත් යන්නේ කොහේදැයි මම නැසුවෙමි. ඒත් සුපුරුදු සමන්පිච්ච සුවඳ,





බෝවිටියා සුවඳ මේ මගේ නිවසට යන පාරයි. මගේ දෑස දිගුවන්න ඇත. ඇත්තටම හෘද ස්පන්දනය වැඩි වන්න ඇත. සුදුසු කොඩි වැල් මහා සෙනග පිරිවරා ගත් මගේ විසල් නිවස... මම රියෙන් නතරවන ගමන්ම බැස්සෙමි. බැස්සාද පැන්නාද මා නොදන්නා තරම්ය. දිවගියේ විදුලි වේගයෙනි. දෙවියනි.. කිසිම දූවකගේ නෙත්වලට මෙවන් වේදනාත්මක අවස්ථාවක් දක ගන්න නොලැබේවා!. මගේ අම්මාත් තාත්තාත් මිනී පෙට්ටි දෙකකය. පහන් දල්වෙයි.... සුදු වියන් සර සර ගා සෙලවෙන්නා වාගේ මට දනෙයි. කෑගසා හඬා ගන්නට තිබුණා නම් හොඳය. ඒත් කඳුළක් ආයේ පිටවූයේ නොවේ.

"ආවද.... අවලන් කෙල්ල... දඩාවතේ ගිය බැල්ලි... තමන්ගෙ අම්මටයි තාත්තටයි වස දුන්නා.."

"වහ"

මම මටම කියා ගත්තෙමි. ලොකු අම්මා මා තල්ලු කර දැම්මාය.

"උඹට මිනියවත් පෙන්නන්න එපා කියලයි අවසන් මොහොත කිව්වෙ. බැහැපං දොට්ට මොකට ආවද?"

ලොකු අම්මා විලාප දෙයි. මම බලෙන් මා ඉවතලන ලොකු අම්මාගේ දෙඅත් අල්වා ගත්තෙමි.

"ඒගොල්ලො වස බිව්වද?"

"ඔව්.... මගෙ නංගියි මල්ලියි වස බිව්වා. රටට ලෝකෙට මූණ දෙන්න බැරුව දෙන්නම කතා වෙලා වහ බීලා. අනේ



The Spirit of Sri Lankan e-community
http://e-pusthakalaya.blogspot.com

අසරණයො දෙන්නා... හැදුවෙ එකම දුවයි.... කොහොමද හැදුවේ...''

මළගෙදර උන් කවුරුත් මදෙස බැලුවේ යකෙකු පෙරේතයෙකු දෙස බලනා තාලෙනි. මට හැඬුනේ නැත. මම අම්මාගේත් තාත්තාගේත් දෙපා අල්වා වැන්දෙමි. තවත් ලොකු අම්මා බැන වැදුනාය.

''පලයං උඹ යන්න මෙතනින්''

ඈ මා එළෙව්වාය.

''අපි යං...''

බලා ඉන්නට බැරිව අරනය දෙතුන් වර කීවේය. මම වාහනයට දිව ගියෙමි. අරනය රිය පනගන්වා ගත්තේය. මගේ සිහිය විකල් වූවා වාගේ මට දැනිණි. මම හිසට ගසා ගත්තෙමි.

''ආයු.... ආයු....''

මගේ හිස කැරකෙන්නට විය. කිසිවක් ඉන්පසු මතකයේ රැඳුනේ නැත. සියල්ල සැනින් නතර වී තියේ. ලෝකය එකතැනක මා කේන්ද්‍ර ගතකොට නතර වූවා වාගේ දුණේ. එක්කෝ පෘථිවියට පරිභ්‍රමණය වන්නට අමතක වන්න ඇත. නැතිනම් පෘතුවිය සූර්යාගේ උදහසට ලක් වන්න ඇත.

''ආයු...''

මම සිහි ලදිමි. සුව පහසු සුපුරුදු මෙට්ටයේ, යහනේ සුදු සිවිලිම, සුදු විදුලි පංකාව. සියල්ල හුරු පුරුදු ඒවාය. වෛද්‍යවරයා සානුකම්පිතව මදෙස බලා හිඳියි.





''සංසුන් වෙන්න. හිත කලබල නැතුව ටිකක් නිදාගන්න.''

''අම්මයි තාත්තයි දෙන්නම මැරිල.... හිත හදා ගන්නෙ කොහොමද?''

මම කීවෙමි. වෛද්‍යවරයා දෑස හැකිලුවේය.

''වේදනාව තේරෙනවා. ඒත් මේ වෙලාවෙ ඔයා ඔහොම අඬලා බෑ.... ඔයා අම්මා කෙනෙක් වෙන්නයි යන්නෙ....''

''මොකක්...''

''ඔව් සතුටු වෙන්න.... මං අරනයට කිව්වා සතුටින් ඉන්න කියලා...''

වෛද්‍යවරයා කාමරයෙන් එළියට ගියේය. මගේ දෑස තවමත් විසල් වී ගෙනය. ඔළුව හප්පා ගන්න ඕනෑ කළු ගලකය. ජීවිතය එතනින් නිමවී යන්නටය. එය කළ යුතුය. මම කෑගැසුවෙමි. හූ තබා කෑගැසුවෙමි. හැඬුවේ නැත. කෑගැසුවෙමි. අරනය දිව ආවේය.

''ආයු....''

ඔහු මා වැළඳ ගන්න හැදුවේය. මම ඔහු ඉවතට තල්ලු කර දමා වියරුවෙන් කෑගැසුවෙමි.

''මං ඔයාව බඳිනවා. ඇයි කලබල වෙන්නෙ...''

''මට තමුසෙව බඳින්න ඕන නෑ. මේ ළමයා ඕනත් නෑ...''

''එහෙම කියන්න එපා ආයු....''



http://e-pusthakalaya.blogspot.com

"මාව මේ බමරෙන් නිදහස් කරනවා. මට තමුසෙගෙ ළමයි ඕන නෑ."

මම කෑ ගැසුවෙමි. අතට හසුවන හැමකින්ම අරන්‍යට දමා ගැසුවෙමි. ඒත් අරන්‍ය කලබල වූයේ නැත.

"මගෙ ජීවිතේ කෑවා.. මාව විනාශ කළා. දෙයියනේ මං මං කොහොමද ජීවත් වෙන්නේ.."

මම අරන්‍ය වෙතට කඩා පැන්නෙමි.

"ඕන දෙයක් කියන්න... ඒත් දරුවා එපා කියන්න එපා...."

"මට එපා.... එපාමයි.... මේ දරුවා. මං මගේ බඩින් නං හදන්නෙ නෑ මේ දරුවාව...."

මම කෑගැසුවෙමි. අරන්‍ය නිහඬව උන්නේය.

"ඔයා කියන ඕන දෙයක් කරන්නම්. කෑගහන්න එපා.... ඔයා අසනීප වෙයි...."

"තමුසෙයි මගෙ අම්මගෙයි තාත්තගෙයි මිනී මරුවා.... තමුසෙ නිසයි මේ දේවල් සේරම උනේ...."

අරන්‍ය කාමරයෙන් එළියට ගියේය. තත්පර ගණනකදී භූපති සූරියපෙමගේ හඬ ඇසිනි. මම වහා නැගිට කාමරයේ දොර ළඟට වීමි.

"උඹ ලැජ්ජා නැතිව ආයෙ ඒකිව ගෙනාව නේද? මං කියන දේ තණේකට මායිම් කළාද?"



http://e-pusthakalaya.blogspot.com



භූපති සූරියපෙරුම ඇමතිතුමා ගුගුලේය.

"බොරුවට බුරන්න එපා. ආයුගේ අම්මයි තාත්තයි දෙන්නම නැති වෙලා."

"ඉතිං උඹ මට කියන්නෙ.... උන්ගේ භූමදාන වැඩ කරන්නද?"

"හිතක් පපුවක් නැතුව කතා කරන්න එපා... මේ සේරම උනේ ඔහේ නිසා...."

"අරන්‍ය"

"ඔව්.... තමුසෙ මට පුතෙක් විදිහට සැලකුව නම් ඒ වගේ අපරාධයක් මට කියල කරවනවද? අර අහිංසක කෙල්ලගෙ ජීවිතේ මං නිසා විනාශ වුණා."

"අගෙයි අගෙයි ඇමතිගෙ පුතෙක් කතා කරන විදිහ...."

භූපති ඇමතිතුමා හිනැහුණේය.

"ඇමතිතුමාට රට වටේම ළමයි නිසා මං තව තුරුම්පුවක් විතරයි..."

අරන්‍ය කිවේය. භූපති ඇමතිතුමා කතා කළේ නැත. ඒ මුහුණේ පෙර වූ සරදම් සිනාවද මැකී ගියේය.

* * * * *

කඳුළු... කඳුළු වලට ආයුබෝවන්. මම හිතුවෙමි. ආයේ ඇස් දෙකෙන් එකම කඳුළක් වුව ගලන්නේ නැති බව හදවත සාක්ෂි දෙයි. පුංචිම කාලයේදීවත් දුකක් නොවිඳි දුක යනු කුමක්දැයි කියාවත් නොදනෙන්නට මා හැදූ වැඩූ මගේ දෙමාපියන්, ඒ සතුටට සැළට හැදූ, එකම දියණී නිසා දුකින් මියගියා නොවේද? ඉතිං මම මගේ හදවත, ඒ හදවතේ දුකත්, සමගම පිටතට විසිකර දමමි. මම මගෙන් හදවත පිටමං කරමි. හිතක් පපුවක් නැති ගැහැනියක වන්නට නම් හදවත පිටමං කළ යුතුමයි.

"ආයු... එයා ගියා..."

අරනා කීවේය. එයා සතු භූපති සූරියපෙරුමය. භූපති ඇමතිතුමා යන්න ගියේ ඊළඟ පියවරට මීට වඩා ක්‍රියාත්මක වන්නට වන්න ඇත. සමහර විට ඊළඟ අරමුණ මාද ඝාතුක වාගේ අතුරුදන් කරවීම හෝ මරා දැමීම වන්න ඇත. මට බියක් නොදනේ. මම මගේ කුසට අත තැබුවෙමි.

"අවජාත"

"සුජාත"

මේ කුමන ජාතයකයක්ද?... මට පිළිතුරක් නැත. අරනා මේ දරු පිළිසිඳ ගැනීම ගැන උද්ධාමයෙනි. මහමායා දේවිය කුස පිළිසිඳගත් දරු ගැබ වාගේ ඔහුට මේ දරුගැබ වටින්නේය. ඔහු මා උදයේ අවධි කරන්නේ නැත. මහ ය.ය වනතුරු ඇහැරන් ඉන්න දෙන්නේද නැත. ගෙයි මුලුතැන්ගෙය, කෑම මේසය පුරා



http://e-pusthakalaya.blogspot.com

වන්නේ ගැබිනි මවකට අවශ්‍ය පෝෂ්‍ය ගුණයෙන් සපිරි ආහාර පානය. සියල්ල ගුණත්වයකින් යුතු ඒවාය. කාමරය පුරා ඔහු සෙල්ලම් බඩු වලින් පුරවයි. රෝස පාට, සෙල්ලම් බඩු, නිල් පාට සෙල්ලම් බඩු සියල්ල ඉතා අගනේය. ඔහු මා පෙමින් පුරවා මා විවාහ වූ මගේ සැමියා වූවා නම් මෙලොව හොඳම සැමියා ද හොඳම තාත්තාද ඔහුය කියමි.

අවාසනාව...

දරු ගැබ මෝරයි....

මට උවමනා දරුවා වදන්න හදනන්ට නොවේ... මෙයින් නිදහස් වන්නටය. මුලදී උමතුවෙන් පිස්සුවෙන් කෑ මොර දී මම මගේ දරු ගැබ විනාශ කරන්නට යැයි කියා ඔහුට බල කළෙමි. ඒත් ඔහු එය කරන්නට අනුබල දෙන්නේවත් නැත. ඔහු කරන්නේ මට දරුවාට ආදරය උපදවන දෑ මගේ නෙතු ඉදිරියේ තැබීමය.

"මට ඕන මේ දරුවා හදන්න නෙමේ...."

මම කෑගසමි.

"ඔයාට කෑගහන්න හොඳ නෑ...."

ඔහු කියයි.

"මේ දරුවා මට හදන්න බෑ.... තේරුණාද?"

අරනා අසරණව මදෙස බලා හිඳියි. ඔහුට හුස්ම නොවැටෙන ගානය.

''මං මේ උපදින්න ඉන්න දරුවට හුඟක් ආදරෙයි.''

ඔහු කියයි.

''මං ආදරේ නෑ....''

''ආයු....''

''මං හොඳින් කියන්නෙ අරනා. ඔයා දන් හොඳ මනුස්සයෙක් උනත් මගේ මුළු ජීවිතේම කෑවෙ ඔයා. ඔයාගෙ දරුවෙක් හදන්න තරම් මට මොලේ අමාරුවක් නෑ....''

''ආයු....''

අරනාට හැඬිනි. ඔහු යහනේ හිඳගෙන කිරි දරුවෙකු වාගේ හඬන්න වූයේය.

''ඔය වගේම මාත් ඇඬුවා. තමුසෙ කිසි ගාණක් නැතුව මගේ ජීවිතේ විනාශ කළා නේද? මට දුකක් දනෙන්නෙ නෑ දන්. මට තව මොනවද වෙන්න තියෙන්නෙ?''

''ආයු මං වෙනුවෙන් මේ දේ විතරක් කරන්න.''

''කවදාවත් බෑ....''

මම නිරාහාරව උන්නෙමි. මුළු ගෙයම ආහාර සුවඳින් පිරී ගොසිනි. කුසගින්න ඕනෑවටත් වඩා දනෙයි. ඒත් මම කුසගින්නේ උන්නෙමි. අරනාද කිසිවක් නොකයි. ඔහු රෑ එළිවන තුරුත් නොනිදයි.

''මට මේ දරුව හදන්න බෑ....''





මම ඔහුට කීවෙමි. ආයේ ආයේ කීවෙමි.

''මට මේ දරුව නැති කරන්න බෑ.... මං දන්නෙ එච්චරයි. මට කවුරුවත්ම නෑ අඩුගානෙ....''

ඔහුට වචන පැටලිනි. ඔහු කාමරයෙන් එළියට යන්න ගියේය. තවත් ඔහුට කියා පලක් නැත මම පහුවදා ඔහු නැති අතරේ ගෙයින් එළියට බැස්සෙමි. මා ගියේ වෛද්‍යවරියක වෙතය. මම ඇයට සැබෑ තතු නොකීවෙමි. ඒත් දරුවා හදන්න බැරි තත්වය පැහැදිලි කළෙමි.

''මාස තුනටත් ළඟයි.... මං ඔයාගෙ තත්ත්වය ගැන බලල බෙහෙක් ටිකක් දෙන්නං.... හරියයි...''

මම හදවතින්ම වෛද්‍යවරියට පිං දුන්නෙමි. ගෙදර ඇවිත් කලේ දිනපතාම ඒ බෙහෙත් බීමය. වෙනදා වාගේ දුකක් නැතිව මම උන්නෙමි.

''ආයු...''

''හ්ම්....''

''අපි ඩොක්ටර් කෙනෙක් ළඟට යන්න ඕන නේද? දන් මාස තුනක් නෙ.. බබාගෙ ස්කෑන් එකක් කරන්න ඕන නේද?''

''මට බැහැ....''

මම කීවෙමි.

''ඇයි මුරණ්ඩු.....''



http://e-pusthakalaya.blogspot.com

"ඕනනං මරල දාන්න.... මං එන්නෑ...."

මම තරහින් කීවෙමි. අරනා්‍ය මෘදු මදහසක් නංවා මහිස අත ගෑවා විතරය. මම සතුටින් බෙහෙත් බීවෙමි.

ඝාතුකගෙන් මිස වෙන පිරිමියෙකුගෙන් දරුවන් හදන්නට මා ආශාවෙන් උන්නේ නැත. දිවි හිමියෙන්ම එකම පිරිමියෙකුට බිරිද වී සතුටින් ජීවත් වන්න තිබූ ආශාව, ඒ ගැහැනු ආශාව නැතිකර දැමීම, අරනා්‍ය ගැන ලතෙත් සිතක් ඇති කර ගැනීමට මට ලෙහෙසි වූයේ නැත. අවසන් බෙහෙත් අහුර අතට ගෙන මම එය මුවට හලා ගන්න හැදුවෙමි.

"ආයු...."

අරනා්‍ය වහා මා අතට ගැසුවේය. බෙහෙත් පෙති සී සී කඩව ගියේත් අරනා්‍ය මගේ කොපුල් හරහා වැරෙන් පහර දුන්නේත් එකම විටය. මට දවල් තරු පෙනුනා වගේ ඇස් නිලංකාර විය. සිහිසුන් වූයේ කෙලෙසදැයි මට සිහියක් තිබුණේ නැත. ආයේ සිහිය ලබද්දී මම පෞද්ගලික රෝහල උන්නෙමි.

"ආයු...."

කතා කළේ වෛද්‍යවරයාය.

"ඔයාගෙ හස්බන්ඩ් අඬනවා. ඒත් ඔයා ඇයි මෙහෙම දෙයක් කළේ...."

"දරුවා නැති වෙලා නේද? මම නිදහස් නේද?...."

මම ඇසුවෙමි. සතුටින් ඇසුවෙමි. වෛද්‍යවරයාගේ මුහුණ අඳුරු වී ගියේය.





"ඒ තරං දෙයක් වෙලත් දරුවා ජීවත් වෙනවා.... කිසිම දෙයක් වෙලා නෑ.... දන්නවද? දරුවා තාම හොඳින්.... මොන අම්මටද මෙහෙම දෙයක් ගැන හිතන්නවත් පුළුවන්.... ඔයා කොහොම අම්මා කෙනෙක්ද?...."

එහෙම කියූ වෛද්‍යවරයා ආයේ මා ස්කෑන් එකකට ලක් කළේය. කළලයේ රූප තිරයේ වැටිණි.

"මේ බලන්න.... මේ දරුව තාම ජීවත් වෙනවා...."

මම බලා උන්නෙමි. ඒ බොඳවූ සිතුවම කිසිවක්ම මට වැටහුණේ නැත. ඒත් කුමක්දෝ මහා වේදනාවකින් මම පැටලී ගියෙමි.

"මගෙ කළලය...."

"මගෙ දරුවා...."

මගේ මුවින් කියවිනි. ඇත්ත නම් මේය. මා හදවත නැති ගැහැනියකි. හදේ මහා හැඟීම් ගොන්නක් තිබියදීත් ඒ හැඟීම් එක්ක මැරිගිය හදවත නැති ගැහැනිය මාය. මගේ දරුවා ගැන මගේ දරු ගැබ ගැන මට සංවේදනා නැති වීම ඉතිං අරුමයක්ද? ඒත් දැන් මට වේදනාව දැනෙන්නේ ඇයි? මේ තරම් බෙහෙත් බීලාත් මා හැර නොගිය ඒ දරුවා මා වෙත එන්නේ ඇයි....?

"අනික ඔයාට එක දරුවෙක් නෙමෙයි.... දරුවෝ දෙන්නෙක්.... නිවුන් දරු උපතක්..."

වෛද්‍යවරයා කීවේය. හදවත නතර වූයේය. මා කිනම් පාපයකට අත ගැසුවාද? අනිවාර්යෙන්ම මිනී මැරීමද මැරීමට



http://e-pusthakalaya.blogspot.com

නැත් කිරීමද පාපයකි. එම පාය මාද කළා නොවේද? ඉතිං මට කවදා කොහොම සමා ලැබේවිද?.

"ආයේ මේ වගේ මෝඩ තීරණ ගන්න එපා.... අරන්‍ය නිසයි මේක ගොඩින් බේරුණේ..."

වෛද්‍යවරයා තවත් පැහැදිලි කළේය. මම හුස්ම නොවැටෙන නමුත් ජීවත්වෙන ජීවියෙකු වාගේ තව තදින් හුස්ම ගත්තෙමි.



(07)

අරන්‍ය මගේ මුහුණ බැලුවේවත් නැත. කිසිම ලෙසක මට මුහුණ දුන්නේද නැත. ඔහු සියලු ඕනෑ එපාකම් මා වෙනුවෙන් ඉටු කළද ගෙදර රැඳුනේ නැත. කිරි අම්මාට සියලු දේ පවරා ඔහු ඔහුගේ ව්‍යාපාර වැඩ වල යෙදුනේය. මට මහා පාලුවක් දුකක් දැනෙමින් තිබිණි. අරන්‍ය නොදක පාලුවක්.... එය එහෙම වන්නේ කොහොමද? නොවේ. මෙය වෙනත් පාලුවකි. මම සිතුවෙමි. ඒත් එය අරන්‍ය නැති පාලුව මැයි මට වැටහුනේ ඔහු දුටු විසින් සැනසෙන මගේ හදවත දුටු පසුය. මම හදවතට දැන් තබා ගත්තෙමි. හදවත උමතුවෙන්ද? එය විය හැකි නොවේ තේද?....

අරන්‍ය ගෙදර එන්නේ බී මතිනි. කෙලින් හිටගන්නවත් බැරි තරමට ඔහු මත්පැන් බී ගෙදර එයි. පුදුම බීමකි.

"මගෙ දරුවා.... මගෙ දරුවා නැති කරන්න හැදුවා.... මට කවුරුත් නෑ...."



http://e-pusthakalaya.blogspot.com

"ඇයි අම්මෙ... ඇයි මාව දාලා ගියේ.."

"ආයුට මං කොච්චර ආදරේ කළාද?"

"එයා මගෙ දරුවා නැති කරන්න හැදුවා... එයාට හිතක් පපුවක් නෑ අම්මේ.... තමන්ගෙ දරුවෙක්ව නෙමෙ පිට දරුවෙක්වත් මට එහෙම කරන්න බෑ...."

ඔහු කියවයි. ඔහුගේ හදවත එළියට දමයි. ඉදහිට ගෙදර එන ඔහු මෙහෙම බීමතින් එන්නේ මට මුහුණ දෙන්න බැරි නිසාය. මම මට බනින්නටත් මා පිළිගන්නටත් බැරි නිසාය. සියල්ල ඔහුට වේදනාවක් වී තියේ.

"කිරිඅම්මා.... මගේ කිරි එක ගේනවද?"

මා දිවි හිමියෙන්ම මගේ දරුවා ගැන සිතුවේ ඉන් පසුවයි.

"ආ බේබි.... ආ සුදූ බේබි.... බොන්න නෝනේ. අනේ මගෙ නෝනෙ.... බඩගින්නෙ ඉන්න හොඳ නෑ නොවැ. දරුවට හොඳ නෑ...."

කිරි අම්මාගේ ඇස්වල කඳුළුය. මම කිරි එක, එක හුස්මට බීවෙමි. නාන කාමරයේ සිට කාමරයට ආ අරනය කණ්ණාඩි මේසය අසල හිටගෙන බලා උන්නේ මදෙසය. ඒත් ඔහු මවෙතට එකම බැල්මක් හෙලුවේ නැත. ඔහු කලේ මා ඉදිරියෙන් වූ බිත්තියට සවිවූ රූපවාහිනිය දැමීමය.

"මට වෛද්‍යවරයෙක් හැටියට එහෙම දෙයක් කියන්න අමාරුයි. විශේෂයෙන් ගැබිනි සමයේදී මට විසින් ගනු ලබන





ඇතැම් පෙති දරුගැබට හානි නොවූවත් දරුවාගේ වර්ධනයට කිනම් හෝ බලපෑමක් කරන්නට හැකියාව තියෙනවා."

අරනය එහා රූපවාහිනිය ක්‍රියා විරහිත කළේය. මම තිගැස්සීමකට ලක්විමි. අරනය මා වෙතට.... මා ළඟටම ආවේය.

"දරුවා නැති කරමු.... ඔයාව ඒ බරෙන් නිදහස් කරන්නම්.... මං ඩොක්ටර් කෙනෙක් එක්ක කතා කළා. ඇඳගන්න...."

අරනය එහෙම කියා කාමරයෙන් පිට වූවේය. හදවත හෝස් ගෑවේය. පපුවේ හුස්ම පිටතට දමෙන තරම් විය. මම නොසෙල්වී යහනටම වී උන්නෙමි. අරනය ආයේ කාමරයට ආවේය.

"ඇඳගන්න..."

අරනය කීවේය.

"මට එන්න බෑ...."

එම කීවෙමි. අරනය මා වෙතට ආවේය.

"දූන් මුකුත් කියන්න එපා. ඔය දරුවට අනාගතයක් නෑ. මං වගේ මට වගේ.... අනාගතයක් නැති දරුවෙක් බිහි කරන්න කැමති නෑ. ඔයා අසාධාරණ නෑ.... මං වැරදි.... ඔයා මේකෙන් නිදහස් වෙන්න. තවත් බලෙන් ඔයාව තියාගන්නෙ නෑ.... ඔයාට ඊට පස්සෙ පුලුවන් ඔයා කැමති තීරණයක් ගන්න.... ඔයා ඔයාගේ ජීවිතේ සතුටින් ඉන්න පුළුවන් තීරණයක් ගන්න...."

අරනය යන්න ගියේය. මම යහනෙන් නැගිට ළා පාට ගවොමක් හැන්දෙමි. දෙපා ගැහෙන්නේ ඇයි? මේ මා ප්‍රාර්ථනා

http://e-pusthakalaya.blogspot.com

කළ දේය. ශානුකගේත් මගේත් ජීවිතය මැදට කිසිවෙකුට එන්නට බැරිය. ඉන්නේ අප දෙදෙනා විතරය. අප දෙදෙනාගේ දරුවන්ය. ඉතිං අරනාගේ මේ තීරණය නිවැරදිය.

"යං...."

මම අරනා එක්ක වාහනයට නැංගෙමි. අරනා රිය පැදවූයේ හෙමිනි. කැඩුනු බිඳුනු පාරේ ඔහු වළවල්වල නොවැටෙන්නට රිය ගෙන යයි. මට හිල්ලිනි. මොකක්දෝ නොවැටහෙනා වේදනාවක් මා පාරවයි. මහා එඩිතරකමකින් මගේ ගර්භාෂයෙන් අයින් කර දමන්නට බලා උන් කළලය මා බදා හිර කර ගන්නවා වාගේ දනෙයි. "අම්මේ" කියා දරුවා මා අමතන්නා වාගේ දනෙයි. මම තදින් දෑස පියවමි. මේ වේදනාව ජීවිත කාලයටම දනේවිද? කුළුදුලේ මා සොයා ආ මගේ පුංචි දරු සිඟිත්තන්.... මා කුමන වර්ගයේ අම්මා කෙනෙකුද?...

"බහින්න...."

රිය එක් පෞද්ගලික රෝහලක නතර කර තිබිණි. මම අරනාගේ මුහුණ බැලුවෙමි.

"යං...."

ඔහු හිතක් පපුවක් නැතිව වාගේ හැසිරෙයි. වෛද්‍යවරයා වෙත මා භාර දුන් හෙතෙම එයින් පිටවූයේය. මම කලබල වීමි. වෛද්‍යවරයා හිනැහිනි.

"ඔයගෙ මහත්තයා මගෙන් ඉල්ලීමක් කළා.... මේක ලේඩි ඩොක්ටර්.කෙනෙක් ලව්ව කරවන්න කියල.... ඒක එහෙම වෙයි...."





මගේ හදවත තව තවත් රිදෙයි. ඇස් දෙක පියවා මම මගේම ජීවිතය දෙස බලා ඉමි. මා ආදරේ නොකළද අරනා මට ආදරේ කරයි. එය කොහොම කෙලෙස වුවත් ඔහු පන වාගේ මට ආදරේ කරයි. මගෙන් තොර ලෝකයක් ඔහුට නැත. ඔහු ජීවත් වන්නේ මා වෙනුවෙන්ය. සියලු කැප කිරීම් මා වෙනුවෙන්ය. මගෙන් තොරවූ ලෝකයක් ඔහුට නැත්තේය. මම නැගිට ගත්තෙමි.

"ඇයි..."

කිසිවක් නොකියා මම එම සුවපහසු කාමරයෙන් එළියට ආවෙමි. රෝහලෙන් පිටතට ආ කළ මට තදින් හුස්ම ගැනෙන්න ඇත. මම කෙළින්ම වාහනයට ආවෙමි. අරනා රියේ සුක්කානමට හිස තබා හඬමින් උන්නේය. මම වහා අනෙක් පසින් විත් රියට නැංගෙමි. අරනා සෙලවී ගියේය.

"ආශු...."

"යං...."

"ඇයි.... මං සල්ලිත් ගෙවල...."

"ගිහින් සල්ලි ගන්න. මං දරුවා නැති කරන්න කැමති නෑ"

"ඒත්"

"යං දරුවා නෙමේ දරුවෝ...."

මට කියවිනි.

http://e-pusthakalaya.blogspot.com

අරනාය රිය පන ගැන්වූයේ හඩමින් ම වාගේම මුදු සිනාද ඇතිව්ය. ඒත් ඔහු මා එක්ක එක වචනයක් කතා කළේ නැත. අපරම්ග රිය නතර කෙරිනි. එය ළමා උද්‍යානයකි. හැන්දෑවේ ළමයි සතුටින් සෙල්ලම් කරති. අරනාය එදෙස බලා උන්නේය. කතා බහක් නැතිව කළේ බොහෝ වේලා එදෙස බලා හිඳීමය.



08

ශානුක ගැන මතක මාගේ හදවත දකට පත් නොකලා නොවේ. ඔහු සොයා ගැනීමට හදවතේ වූ උනන්දුව හීන වී ගියාත් නොවේ. ඒත් ශානුක ජීවත් වන්නේ නැතැයි අරනාය විශ්වාස කළ නිසාත් අරනාය මේ කිසිවක් ගැන කිසිම තොරතුරක් නොදන උන් නිසාත් මට ශානුක ගැන සොයන්නට තිබුණු අවස්ථාවන් නැතිවී ගියේය. මේ සියලු දෙයෙහි සත්‍ය දන උන්නේ භූපති ඇමතිතුමා විතරය.

"අරනාය..."

"කියන්න ආයු..."

"මට ශානුකට වුණ දේ දන ගන්න ඕන"

අරනාය උන්නේ ඔහුගේ ව්‍යාපාර කටයුත්තකට එළියට



http://e-pusthakalaya.blogspot.com

යන්න සූදානම්නි. ඒත් මගේ කතාවට ඔහු මගේ යහන අබියස හිඳ ගත්තේය.

"අපේ තාත්තා ගැන මං දන්නවා."

"ඒ කිව්වේ"

"තාත්තා අතුරුදහන් කරපු එකම මිනිහා ශානුක නෙමේ. ඒ අතුරුදහන් කරපු කවුරුවත් ආයේ ආවේ නෑ. තාත්තා ඒ මිනිස්සුන්ව සාක්ෂි නැතුවම මරල දැම්මා..."

"අරනය..."

"ශානුකටත් කළේ ඔය විකමයි..."

මම දොතොල් ආපිට පෙරලවාගෙන ඉවත බැලුවෙමි.

"සිද්ද වුණ කිසිම දෙයක් හොඳයි කියන්නෙ නෑ මං"

අරනය නැගිට ගත්තේය. උස් ජනෙල් වල එල්ලී ඔහුගේ රිය ඉගිලෙනවා මම බලා උන්නෙමි. අරනයගේ රිය ඉගිලී ගිය ගමන් තව රියක් එන්නේ නතර විය. ඒ භූපති සූරිය පෙරුමගේය. කිරිඅම්මා කාමරයට දිව ආවාය.

"කාමරේ ලොක් කරගන්න... මං කියන්නං... බේබිත් ගියා කියලා අරනය මහත්තයා එක්ක..."

කිරි අම්මා පවුය. මම හිතන්නත් කලින් ඇ දොර වසා එළියට ගියාය. ඒත් කුමක්දෝ අහේතුවකට මට ශක්තියක් ලැබිණි. ආවේගයක් දැනිණි. මම කාමරයේ දොර හැරගෙන එළියට ගියෙමි.





"දැන් කිව්වා නේද පුතා එක්ක ගියා කියලා...... මෙ ඉන්නෙ......"

භූපති ඇමතිතුමා කිරිඅම්මා දෙස බැලුවේ උදහස් විය. ඇ වහ වහා ගෙතුලට දිව ගියාය.

"ඇයි..."

මම ඇසුවෙමි.

"ළමාතැනී වගේ කතා කරන්නෙ. දඩාවතේ ගිහින් මගේ පුතාව අහුකරන් ළමයි වදන්නද හදන්නෙ... මේ තාත්තා ඉන්නකං නම් ඒවා බොරු..."

මට හිනා නැගිණි.

"ඇයි උඹ හිනාවෙන්නෙ..."

"හිනා යන්නැද්ද ඇමතිතුමා... ඇමතිතුමාට උනෙත් මාර වැඩේනෙ. මගෙ මහත්තයම රටට ලැජ්ජ කරන්න, ඔයාගෙ පුතාව... තමන්ගෙ පුතාව එව්වා. මං ගාවට මාව දූෂණය කරන්න. අන්තිමට මොකද වුනේ... ඇමතිතුමාගෙ පුතා මට ආදරේ කළා. දැන් මට දරුවො දෙන්නෙක් ලැබෙන්නෙ ඉන්නවා..."

"අවජාතක දරුවො... මගෙ පුතාගෙ වාසගම ලැබෙන්නෑ පුතෝ උඹෙ අවජාතකයින්ට..."

"බලමු ඇමතිතුමා..."

'මට තඩු දෙකක් තියෙනවා... නැත්නං මං උඹව මේ වෙලාවෙම ඉවරයක් කරනවා."



http://e-pusthakalaya.blogspot.com

හූපති ඇමතිතුමා ගුගුලේය. ඔහු ළඟ ඔහු අභියස සිටින ආරක්ෂක නිලධාරීන්ද තිගැස්සී බලා උන්නේය. මම මුදු මදහසක් නංවාගෙන කාමරයට ගියෙමි.

හදවත ඇතුලාන්තය......

ඔව්... හදවත... හදවතේ ගැඹුර එක්ක මට කතා කරන්න ඕන... හිතට සැනසීමක් දනෙනවා... මගෙයි ශානුකගෙයි පවුල් ජීවිතේ අපායක් කරපු භූපති සූරියපෙරුම ආදෙකු වාගේ ලිස්සලා යන්න ගිය හැටි දැක්කම ඒ මූණෙ තිබුණු බිය... ලැජ්ජාව, කම්පාව දැක්කම මට දැනුනෙ සතුටක්. දේශපාලනය අතකොලුවක් කරන් අහිංසක ජීවිත එක්ක දාම් අදින්න යන දේශපාලඥයන්ට මේ උත්තරය ඇති, මං විනාශ උනත් කියලයි මට හිතුනෙ. පුංචි කාලෙ වගේ ලැබීමේ සතුට භුක්ති විඳින්න, උඩ පැන පැන නටන්නයි මට හිතුනෙ. මං මගෙ කුසට අත තියාගත්තා. මංද... දරුවො මොන හිතකින්ද මං මගෙ මේ දරුවන් නැති කර දමන්න හිතුවෙ... නෑ... මට සිද්ධ වුණ අසාධාරණයට මගෙ දරුවො දෙන්නා කවද හරි උත්තර දේවි කියල මට හිතුණා. ඒ දෙන්නා මේ කුසින් බිහිකරනව මං. මොන බාධක ආවත්... මොන හාඩන පීඩන ආවත් මගෙ දරුවා මං හදනවා... රකිනවා.

ජීවිතේ, එක එක කාලවලදී එක එක දඬුවම් දෙනවා අපට. පුංචි කාලෙ ඉඳන්ම මං එහෙම දඬුවම් විඳලා තිබුණෙ නෑ. ඒත් මගෙ විවාහය මට දඬුවමක් වුණා. ජීවිතේ සියලු සැප සම්පත් ලැබිලත්, සියලු යස ඉසුරු ලැබිලත් කරපු නැති වරදකට මට දඬුවම් ලබන්න සිද්ධ වුණ. ඒ දඬුවම දඬුවමක්ම කරගන්නවද? නැත්නම් අවියක් කර ගන්නවද?.





අරනාෂ මා සමඟ දෙඩුවේම නැත. කුමක්දෝ දෙයක් හිතේ තබාගෙන ඔහු දුක් විඳිනවා යැයි මට සිතිනි.

"අරනාෂ..."

මම අරනාෂට කතා කළෙමි.

"කියන්න..."

"මොකක් හරි ප්‍රශ්නයක්ද ඔයාට ?"

"නෑ........"

"නෑ නෙමෙයි අරනාෂ... මං ඉන්න එක ප්‍රශ්නයක් නං මං යන්නං..."

"මං එහෙම කිව්වද?"

"ඔයාගෙ මනුස්සකමට මං පිං ඉල්ලනවා. ඒත් ඔයා කරපු සේරම මට අමතක කරල දාන්න බෑ..."

මම කීවෙමි. අරනාෂ මා ඉදිරියට ආවේය.

"ඒක ඇත්ත... මං දන්නවා... ඔයාට මට සමාව දෙන්න බෑ ඒක මට හොඳටම තේරෙනවා. දන්... ඒ වගේම ඔයා කළ දේටත් මට සමාව දෙන්න බෑ..."

"මං කළ දේ..."

"ඔව්..."

"මොකක්ද මං කළේ..."



http://e-pusthakalaya.blogspot.com

"ඔයා මගේ දරුවෝ දෙන්නා මරල දාන්න හැදුවා... ඒකට බෙහෙත් බිව්වා... මං ඔයා ගැන කළකිරුණා...ඔයාට සිද්ධ වුණු දේවල් වටල ඔයා මට කවදාවත් සමාව දෙන්නෙ නැති එක හරි... මටත් ඔයාට සමාව දෙන්න බෑ. මං ඔයාට ආදරෙයි... මං මැරෙන තුරුත් ආදරේ ඔයාට විතරයි... ඒත්... ඔයා කරපු වරද මට මහ ලොකුවට දනෙනවා. ඇත්තම කියනවනම් ඔයාගෙ බඩේ ඉන්න දරුවෝ දෙන්න ඔයාගෙ බෙහෙත් නිසා විරූපී වෙයිද, මානසික ආබාධයකට ලක්වෙයිද මොකක් හරි ඒ දෙන්නට කරදරයක් වෙයිද කියල මට බය හිතෙනවා...."

අරනාගේ ඇස්වල කඳුළුය. මම ඒ මුහුණ දෙස බලා උන්නෙමි. අවංක කමත් ආදරයත් මිස එහි අන් කිසිවක්ම මම නොදුටුවෙමි.

"ඔයාව හොයාගෙන භූපති ඇමතිතුමා ආවලු නේද?"

ඊළඟට අරනා ඇසුවේය. මම කිසිවක් නොකීවෙමි.

"මං එයාව හම්බවෙන්න ගියා... ආයේ මේ ගෙදර පස් පාගන්න එපා කියල ආවෙ... මොකද මේ ගේ මගේ නිසා... එයාගෙ සල්ලි වලට... බලයට යට වෙලා හිටියෙ මගෙ අම්මා මිසක් මං නෙමේ..."

අරනා යන්න ගියේය. මොකක්දෝ හේතුවකට මම අරනායට බැඳෙමින් උන්නෙමි. අරනා හිත ගැඹුර අත පත ගායි. ඔහු හදවතේ සුවිශේෂී වෙමින් හිඳියි. ඇත්තටම මා ශාත්‍රකට මගේ සැමියා හැටියට ගරු කළා මිසක, ආදරය කළේ නැතැයි මට හිතෙන්නේ දන්ය. අරනා සැබෑ පෙම්වතකුගේ චරිතය රඟපෑ මගේ හදවත සොරකම් කළා වත්ද?

මගේ හදවතට ප්‍රේමය... මහා ලොකුවට දනෙන්න අරන් තිබිනි. මම කාමරයෙන් පිටතට ආවෙමි. මුලු ගේ පුරාම ඇවිද ගියෙමි. අරනා මගේ උපදින්න ඉන්න දරුවන් වෙනුවෙන් වෙන් කළ කාමරයේ පුරවාලූ සෙල්ලම් බඩු අත පත ගෑවෙමි. කෑම බීම ගැන උවමනාවටත් වඩා සැලකිලිමත් වීමි.

"අරනා එද්දී මට ගස්ලබු ගේන්න"

අරනා කතා නොකලත් මම කීවෙමි.

අරනා මගේ දෙපතුලේ සිට ඉහ දක්වා බැලුවේය.

"මට හුඟක් පළතුරු ගේන්න"

මම ආයේ කීවෙමි. අරනා මොහොතක් බලා හිඳ යන්න ගියේය.

"තියෙන ආඩම්බරේ..."

මම මටම කියාගත්තෙමි.

දින සති මාස ගෙවී ගියේ මා සම්පූර්ණයෙන් වෙනස් ගැහැනියක් කරමිනි. බෙරකාරයකු වාගේ මම මහත්වී උන්නෙමි. මගේ දෙපා ඉදිමී තිබිණි.

"කකුල් දෙක උඩ තියාගන්න. එල්ලං ඉන්න එපා..."



http://e-pusthakalaya.blogspot.com

අරනාා එවිට කියයි. ඒත් මම නැසුනාසෙ එලෙසම ඉමි. අරනාා එවිට ඇවිත් පුංචි පුටුව උඩින් මගේ දෙපා තබයි.

"කකුල් ඉදිමිලා..."

ඔහු කියවෙයි.

"එහෙම තමයි.:"

මම සිනාසී කීවෙමි.

අරනාා මදෙස බලා උන්නේය.

"ඇයි..."

මම ඇසුවෙමි.

"ඔයා ලස්සන වෙලා..ආපු බබාලා හම්බ වෙද්දි හැම අම්මම ලස්සන වෙනවලු... ඒත්... ඒ හැම අම්මා කෙනෙක්ගෙම හිත ලස්සන නැ තේද?..."

අරනාා ඇසුවේය. මම මුදු මදහසක්වත් නැතිව ඒ මුහුණ බලා උන්නෙමි.

"මං බොරුද කිව්වෙ..."

අරනාා ඇසුවේය.

"ඔයා බොරුත් නැති ඇත්තකුත් නැති දේකුයි කිව්වෙ..."

"ඇයි..."



http://e-pusthakalaya.blogspot.com



"බබාලා හම්බ වෙද්දි හැම අම්මාම ලස්සන වෙනව... ඇත්ත, ඒත් හැම අම්ම කෙනෙක්ගෙම හදවත ලස්සන නොවෙන්න හැම තාත්තා කෙනෙක්ම ඒ අම්මට සාධාරණේ ඉෂ්ට කළාද? හැම අම්මා කෙනෙක්ම ආදරෙන් දරුවෙක් බිහි කරන්න, ඒ අම්මට දරුව දුන්න තාත්තා ඒ දරුවා සමහර විට භාර ගන්න ලෑස්ති වුණාද? නැත්නම් ඒ අම්මා දාලා පැනල ගියාද? එහෙමත් නැත්නම් ඒ අම්මට දරුවා නැති කරන්න බල කළාද? එහෙමත් නැත්නම් ඒ දරුවා බඩට ආවෙ ඒ අම්මව දූෂණය කළ නිසාද?.

මගේ වචන ගිලිනි. ඇස්වලින් කඳුළු පිට පැන්නේය. හඩන්නේ නැහැමයි මටම වූ පොරොන්දු මොහොත. බොරුව ගිලේය. අරනාා සියලු වැඩ නතර කර මගේ මුහුණ බලා උන්නේය. එතරම්ම හැඟිම්බර මුහුණක් මා මීට ඉහත දැක නොතිබුණු තරම්ය. ඉහළට ගත් හුස්ම ඔහු පහලට හෙළුවේ නැති තරම්ය. මේ පෘථිවි පරිභ්‍රමණය හා භ්‍රමණය මොහොතකට නතර වූයේ නම් මේ මිනිස් දියණිවරුන්ගේ ළයෙහි ගැස්මේ වේගයෙන් සියලු සංසිද්ධීන් යථාර්ථයක් කරන්නට තිබුණා නොවේද?.

අනේ දෙවියනේ පිරිමින්ට කයක්

සහ ගැහැනුන්ට ළයක් තුමට මැව්වාදැයි මට සිතිනි.

සියලු පුරුෂ ශක්තීන් කයට මුසු කර ගන්නා පෞරුෂයෙන් හෙබි පිරිමින් ගැහැනියකගේ ළයෙහි වන දුක් අදෝනා දුටුවේම්ද? ශක්තිය වනාහි මෙතරම්ම ප්‍රබල වූවක්ද? මා අරනාාට අතීතයේදී හසුවී විනාශ වී ගියේ මේ ශක්තිය නිසා නොවේද?.

කාලය ළයෙහි වේදනාවට වෙද දුරෙකු වුවත් අතීතයේ දී

විනාශ වී ගිය මගේ ආත්ම පෞරුෂය ආත්ම අභිමානය... ගොඩනංවන්නට අරන්‍යගේ මේ ප්‍රේමයට හැකිද? මගේ දෙමාපියන්ගේ මරණවලට වග කිව යුත්තා අරන්‍ය වීම, එසේ නොවුනායැයි හදවතට ඒත්තු ගන්වන්නට මට හැකිද? මේ කුසට ආ දරුවන් එක් වෛරයක ප්‍රතිඵලයක්යැයි නොඅදහන්නට හැකිද?.

අරන්‍ය පිළිතුරු නොදී යන්න ගියේය. පිළිතුර අරගෙන ඔහු රාත්‍රියේ ආවේ බීමතිනි.

පිරිමින්... දුකටත් මත්පැන් බොයි...

සතුටටත් මත්පැන් බොයි...

ඒත් ගැහැනු හදවතට මේ දුක සතුට දරා ගන්නට වන්නේ හදවතිනි. දුක ආවේග වලින්ද සතුට අභිමානයෙන්ද ඕමට තබන්නට ගැහැනිය සූදානමිය.

"මං ආයෙ බොන්නෙ නෑ..."

"දුකට බිව්ව කියන්නෙ නෑ ආශු... ඒත් මං බිව්වා... මං දන්නවා මං මේ දරුවන්ට ඔයාගෙන් ජීවිතේ ඉල්ලන එක සම්පූර්ණ වැරදියි. මට අයිතියක් නෑ. මං ඔයාව කසාද බැඳල නෑ.... මං ඔයාට ආදරේ කරලද මේ දරුවො හැදුවෙ.... ඒත් නෑ.... අමු අමුවෙ මස් මරන්නෙක් වගේ මං දූෂණය කළා.... අසරණ ගැහියෙක්.... දේශපාලනයට කිසිම සම්බන්ධයක් නැති ගැහියෙක්ව.. මං දූෂණය කළා. මට ලැජ්ජයි. මගෙ අම්මා කොයි තැනක හිටියත් මට වෛරය කරනවා ඇති.....

අරන්‍ය හඬන්නට වූයේය.



http://e-pusthakalaya.blogspot.com



"මං දන්නවා මං නිසා මුළු රටක් ඔයාට අපහාස කළා. මිනිහට අතුරුදහන් කරල ඇමතිගෙ පුතා එක්ක පැනල ගියා කියලයි පත්තර වල පළවුණේ. මුළු රටම ඔයාට වෛර කළා. කොටින්ම ඔයාගෙ අම්මා තාත්තා රටට මූණ දෙන්න බැරිව මළා. වෙන කිසිම ගැහියෙක්ට ඔයාට තරං දුක හිතෙන දෙයක් තියෙයි කියලා හිතන්නවත් බෑ.... මං අපරාධකාරයෙක්.... මගෙ දරුවන්ට තව දහරී මං දෙන උත්තරේ මොකක්ද?...."

එළිවන තුරාම අරන්‍ය කළේ කියවන එකය. සියලු සත්‍යයන් ඔහු කතා කිරීමෙන් අවසන් කර දමන්නට හිතුවා වන්න ඇත.

පසුදා හිරු නැගෙන්නටත් කලින් අරන්‍ය කාමරයෙන් පිටවී තිබිණි. මම දුක පහව ගිය බැල්මකින් යහනෙන් බැස්සෙමි. උද්යෝගයෙන් සිටිම කුසෙහි වැඩෙන දරුවන්ට යහපතක් වේයැයි හිතුනෙන් දත් මම ඒ ගැන සිතුවෙමි. අතීතයත් ඒ සිදුවූ අවාසනාවන්ත සිදුවීම් පෙළත් අත්හැර අමතක කර අලුත් නැවුම් ජීවිතයක් ගැන මගේ දරුවන්ට කියා දෙන්නට සිතා මම උස් ජනෙල් පියන් හැර දැම්මෙමි.

උදය වරුවේ ගේ දොර පිරිසිදු කර ඉන්පසු මිදුලේ මල් පැල ගැන බැලුවෙමි. ගෙතුල ජීවිතයට වඩා මේ ගෙමිදුලේ වනාහි ජීවිතය සැපතකැයි මට සිතෙන්නේ දැන්ය. හුදෙකලාවේ තනිව දුකින් වැළපෙමින් ජීවත් වූ නිසා මම මේ සුන්දරත්වය නොදුටුවෙමි. ඇත්තටම අරන්‍යයගේ ගෙවත්ත විශාල වගේම සොඳුරුය. මල් ගැන වැඩි දැනුමක් නොවුණු නිසා මේ කුමන වර්ගයේ පැළෑටි දැයි මට වැටහීමක් වූයේ නැත. මලෙහි වර්ගය නොසොයා මා සෙව්වේ එහි සුන්දරත්වය විතරය. කොහොමත් මා ජීවිතයෙන් උකහා

ගත්තේ සුන්දරත්වය විතරය. කම්මැලිකමක් ඇති නොවන්නට ජීවිතය පවත්වා ගන්නට කළකිරීමෙන් තොරව ජීවිතය ගෙන යන්නට මම ජීවිතයට අලුත් මුහුණුවරක් දුන්නෙමි. හැන්දෑවේ මල් කඩා බුදු පහන තියා භාවනා කළෙමි. මම ආනාපාන සති භාවනාව වැඩිමි. එය නිවැරදිව සිදු කරන්නට මා උගෙන ගත්තේ අම්මා හා තාත්තා එක්ක බොහෝ විට පන්සල ඇසුරේ හැදී වැඩුණු නිසාය. එයින් මනසට අමුතු සැනසීමක් දැනිණි. ඇස් පියාගත් කළ කළුවට කරුවලේ විටෙක මම අමුතු ආලෝකයක් දුටුවෙමි. මා භාවනාව වැඩුවේ ඒ ආලෝකය දිගේය. අරනාය රාත්‍රියේ ගෙදර එනතුරුම මම දවසේ ආස්වාදය එක මොහොතකින් ලබමින් උන්නෙමි. ඇඟපත සෝදාගෙන අරනාය රූපවාහිනිය දමනා තුරාම මගේ සැනසීම තිබිණි.

"ශානුක කියන්නෙ මේ නිකම්ම නිකම් පත්තර කාරයෙක් නෙමේ.... ශානුක රටට අවශ්‍ය කරන මාධ්‍යවේදියෙක්.... අදටවත් ඒ කොල්ලට වුණු දෙයක් නෑ. ශානුකගෙ බිරිඳ ඉන්නෙ හුපති ඇමතිතුමාගෙ පුතා ළඟ. දන් මං හිතන්නෙ ඇය ගැබිනියක්. විවාහ වෙලාද කියන්න මං දන්නෙ නෑ...."

අරනාය වහා රූපවාහිනිය ක්‍රියා විරහිත කළේය.

"ඡන්දය ළඟ නිසා මුං මඩ ගහ ගන්නවා. ඔය අපේ තාත්ත එක්ක තරහට, ඇමති සෙනෙවිරත්න නෙ...."

අරනාය එහෙම කියා කාමරයෙන් පිට විය. මා මුලු දවසේම එකතු කරගත් ආලෝකය 'ධුම්' ගා ශබ්දයකින් බිඳී විසිර යන විදුරු විදුලි බල්බයක් වාගේ බිම වැටී විසිරී ගියා නොවේද? හදවතේ ඉතිරි වන්නේ හිස් බවකි. මම කැඩපත ඉදිරියේ හිටගෙන මගේ





රූපය දෙස බලා උන්නෙමි. මා සොඳුරුය. දෙවියන් මහුගේ කැමැත්තට මා සොඳුරුවට මවා තිබේ. කියන්නට අඩුවක් නැත. දිග කොණ්ඩය, කහ පාට සම, නිල් පාට ඇස් දෙක සියල්ල සුන්දරය. මගේ ජීවිතය හැරෙන්න සියලු දේ සුන්දරය.

"ආයු...."

අරනාය මගේ පිටුපසිනි. ඔහුද දන් කැඩපතින් මට පෙනේ. දෙවියන් ගලපා දුන්නේ නම් මගේ රූපයට සමාන මගේ රූපයට සැහෙන්න සිටියේ අරනායය. ඔහු එතරම්ම කඩවසම්ය.

අවිවාක අරනාය....

විවාහක ආයු....

අප දෙදෙනාගේ දරුවන් මේ ඉදිරියට එන අනාගතයට.... අනාගතයේදී හමුවන මිනිසුන්ට... අප දරුවන් ඉදිරියේ ඉතිර කර දමා යන ජීවිතය.... මම ඒ සියලු දේ මිටින් මොලවා ගත්තෙමි. දිග සුසුම පිට විය.

"ඇයි ඔහොම බලන්නෙ...."

අරනාය ඇසුවේය. මා වැරදියට බලා උන්නාද නොදනිමි. ආදරයකින්, රාගයකින්.... නොහොබිනා කළකිරීමකින්.... පසුතැවීමකින් ඔහු දෙස බලා උන්නාද නොදනිමි.

"මං ඔයාට හුගක් ආදරෙයි ආයු.... මේ නැමදේම විසදෙනව අපි කසාද බැන්ද නම්.... අපේ දරුවන්ට අනාගතයක් තියෙන්න ඕන නේද?"



http://e-pusthakalaya.blogspot.com

අරනා කීවේය. මම කැඩපත දෙස බලා උන්නෙමි. අරනා ගැන ප්‍රේමයක් උපදින හැම වෙලාවේම ඊට එහා ගිය කළකිරීමක් ඉතිරි වන්නේ ඇයි?.

"ඔයාට ඕන මාව කසාද බඳින්න. එතකොට ඔයාගෙ තාත්තට මඩ ගහන එක නතර වෙයි නේද?"

"ආයු...."

"ඔයා හිතන්නෙ මාව කසාද බැන්දම ඔයාගෙ තාත්තගෙ දේශපාලන ජීවිතේ රැකෙයි කියල නේද? වැරදි වහ ගන්න පුළුවන්. එතකොට පත්තර වල පොල් ගෙඩි අකුරුවලින් ලියවෙයි භූපති ඇමතිගෙ පුතා ආයු එක්ක විවාහ වුණා. භූපති ඇමතිතුමා මොනතරම් සාධාරණ මනුස්සයෙක්ද? ආයුව තමන්ගෙ ලේලි විදිහට පිළිගත්තා."

"ආයු....ආයු...."

අරනා තදින් මගේ නම කීවේය. මේ මගේ හදවත ඇතුලාන්තයේ වෙන් කරගත් තරහ සමග මිශ්‍ර වී තිබූ විෂබීජයක් මිස අරනා ගැන සත්‍ය නොවන බව මම දන උන්නෙමි. මා පෙර කී කිසිවක් මගේ හැඟීම් මිස ඒවා අරනාගේ හැඟීම් නොවන බව මම දන උන්නෙමි. ඒත් මේ වෙලාවේ මට උවමනා වුණේ ඒවා කියා හෝ අරනා රිදවීමටය. භූපති රිදවන්න බැරි කමට අරනා රිදවන්නටය.

"ඔයා මා ගැන මෙහෙම ද හිතුවේ..."

අරනා ඇසුවේ මගේ දෙඋරින් ඔහු දෙසට හරවාය. මම



කතා නොකළෙමි. මට අරනාට එකඟ වන්න බැරිය. එය කරන්නේ කොහොමද?. එවිට ශානුක අසරණ ශානුක විනාශ වී යයි. මා ඔහුගේ බිරිඳ වී ඔහුගේ ජීවිතයට කරන්නාවූ මහා විනාශය නොවේ. එය වන්නට බැරිය. එය ශානුකගේ මාධ්‍ය ජීවිතය කිලුටු වූවක් නොවේ. ඔහු සාධාරණය දුටු මිනිසෙකි. ඔහුගේ මනුෂ්‍යත්වය එක හා සමානව සෑම මිනිසෙකු කෙරෙහිම විය. බිරිඳටත් ඔහුගේ අම්මාටත්, සාමාන්‍ය මිනිසුන්ටත් ඔහු එකසේ සාධාරණ විය. එකම මිම්මෙන් එකම කෝණයෙන් ඔහු කාටත් පොදු ප්‍රතිපත්තියක හිඳ සැලකුවේය. සර්ව සාධාරණ මිනිසකු වූ ඔහුට සදාකාලික වංචාකරියක වීමට හැකිද?.

ඒත් යමක් කියමි. මේ සර්ව සාධාරණ මිනිසා මගේ සැමියා වීම ගැන මම දන් හෝ මීට ඉහත දුක්විමි. මට උවමනා වූයේ රටටම සර්ව සාධාරණ විද.... සමාන විද.... ඒ සියල්ලටම වඩා එකම එක අංශු මාත්‍රයක් මා ගැන සිතනා.... මට වැඩියෙන් සලකනා.... මට වැඩියෙන් ආදරේ කරනා.... මා ගැන, මා ගැන වැඩියෙන් සිතනා.... මාව විෂය කරගත් පෙම්වතෙකි. සියලු දේ මා නිසා.... මා කරණකොටගෙන අත් හළ හැකි පෙම්වතෙකි. සැමියෙකි. ශානුක එහෙම කෙනෙකු නොවීම ගැන දන් මම උදහස් වෙමි. ඊට හේතුව අරනා නොවේද?.

අරනාගේ ප්‍රේමය මා බලාපොරොත්තු වූ මා අපේක්ෂා කළාවූ ප්‍රේමය වීමද? මා සෙවූ පෙම්වතා අරනා වීමද..........?

යුවතියකට පෙම්වතකු නම් ඒ අරනා විය යුතුය...

බිරිඳකට සැමියකු නම් ඒ අරනා විය යුතුය.



http://e-pusthakalaya.blogspot.com

ගැහැනියකට පිරිමියෙකු නම් ඒ අරනා විය යුතුය.

අරනා මා නිසා එකම මොහොතක් වත් දුක්වනවාට මා සතුටු නැත. ඇත්තම නම් ඇත්තම නම්.... ඇත්ත නම් එයයි. ඒත් අරනා මා නිසා දුක් නොවුනාට.... මා හා අරනා නිසා ශානුකගේ විනාශය සිදුවනවාට හෝ භූපති සූරියපෙරුමගේ දේශපාලන ජීවිතයට මා කුටුපඬුරක් වනවාට මා කැමති නැත.



## 09

ඊනි.... දවස්.... මාස.... ඡන්දය.... ජය.... පරාජය.... ඔය සියලු දේ දෙස මම උපේක්ෂාවෙන් බලා උන්නෙමි. භූපති සූරියපෙරුම මා එළවා ගන්න බැරි වූ තැන මා ළඟ තබා ගන්නට යන්න දුරුවේය.

"රටවු හිනස්සන්න එපා අරනා.... එක්කො මේ ගැනිව මෙහෙන් එලවල දාපං... නැත්නම් මේ ගැනිව කසාද බැදපං...."

භූපති ඇමතිතුමා කෑ ගැසුවේය.

"ඔයා ඔය ගැනි කිය කිය කෑ ගහන්නෙ ඔයාගෙ පුත්තු හතර දෙනාටම වඩා වයසින් බාල කෙනෙකුට.... හොඳ ආත්ම ගෞරවේකට හැදුනු දුවෙකුට.... ශිලාචාර කෙල්ලෙකුට.... ඔයාමයි මේ කෙල්ලගෙ ජීවිතේ විනාශ කළේ. ඒකට මාවත් හවුල් කරගත්තා.... මගෙ හිතේ අම්මා ගැන තිබුණු ආදරේ වෛරයකට



The Reader's Place
The Spirit of Sri Lankan e-community
http://e-pusthakalaya.blogspot.com

ගැහැනියකට පිරිමියෙකු නම් ඒ අරනා විය යුතුය.

අරනා මා නිසා එකම මොහොතක් වත් දුක්වනවාට මා සතුටු නැත. ඇත්තම නම් ඇත්තම නම්.... ඇත්ත නම් එයයි. ඒත් අරනා මා නිසා දුක් නොවුනාට.... මා හා අරනා නිසා ශානුකගේ විනාශය සිදුවනවාට හෝ භූපති සූරියපෙරුමගේ දේශපාලන ජීවිතයට මා තුටුපඩුරක් වනවාට මා කැමති නැත.



## 09

පීනි.... දවස්.... මාස.... ඡන්දය.... ජය.... පරාජය.... ඔය සියලු දේ දෙස මම උපේක්ෂාවෙන් බලා උන්නෙමි. භූපති සූරියපෙරුම මා එළවා ගන්න බැරි වූ තැන මා ළඟ තබා ගන්නට යත්න දරුවේය.

"රට්ටු හිනස්සන්න එපා අරනා.... එක්කො මේ ගෑනිව මෙහෙන් එලවල දාපං... නැත්නම් මේ ගෑනිව කසාද බැඳපං...."

භූපති ඇමතිතුමා කෑ ගැසුවේය.

"ඔයා ඔය ගෑනි කිය කිය කෑ ගහන්නෙ ඔයාගෙ පුත්තු හතර දෙනාටම වඩා වයසින් බාල කෙනෙකුට.... හොඳ ආත්ම ගෞරවේකට හැදුනු දුවෙකුට.... ශීලාචාර කෙල්ලෙකුට.... ඔයාමයි මේ කෙල්ලගෙ ජීවිතේ විනාශ කළේ. ඒකට මාවත් හවුල් කරගත්තා.... මගෙ හිතේ අම්මා ගැන තිබුණු ආදරේ වෛරයකට



http://e-pusthakalaya.blogspot.com
The Spirit of Sri Lankan e-community

හරවල මා ලව්වා පලි ගත්තා.... දේශපාලනේ කලේ ඔයයි.... ශාහුකයි වගේ අය.... ඒත් අන්තිමට වන්දි ගෙවන්න වුනේ... අසරණ කිසිම වැරදක් නොකළ ආයුටයි.... මටයි.... අපි දෙන්නගෙ දරුවන්ටයි...."

අරනා බොහෝ සංවේදීව කතා කළේය. භූපති ඇමතිතුමා කපටි බැල්මක් හෙලුවේය.

"ඒකනෙ පුතේ.... වැරදි වුණා.... දැන් ඒව පස්සෙ එලවල වැඩක් නෑ.... ඔයාටත් අනාගතයක් ඕන.... මේ දූවටත් ඕන.... ඔය දෙන්නා කසාද බඳින්න.... රටවු හිනස්සන් නැතුව. බලන්න හැම දේශපාලන වේදිකාවකම ඔය දෙන්නගෙ නම කියනවා.... නින්දා අපහාස කරනවා...."

භූපති ඇමතිතුමා කීවේය.

බොහෝ දේ කියන්න හිතට ආවත් මම එකම වචනයක් හෝ නොදෙඩිමි. තාත්තාත් පුත්තා මැදට නොයන්නට මට හිතුනා වන්න ඇත.

'ඔයා ඔය කතා කරන්නෙ අපි ගැන වේදනාවකින්ද නැත්නම් ඔයා ගැන බයෙන්ද?. ශාහුකගෙ අතුරුදන්වීම ගැන තමයි හැම තැනම කතා කරන්නෙ. ඔයා දන්නවා මේක නිසා ඔයා පරාද වෙනවා. ඒකට ඔයා බයයි...."

"මම යකෙකුටවත් බය ඇති මිනිහෙක් නෙමෙ. මං හොඳින් හරි නරකින් හරි ඡන්දෙ දිනනවා. තේරුණාද?...."

භූපති ඇමතිතුමා යන්නට ගියේ එහෙම කියාය.





"ඔයා මාව කසාද බඳින්න අකමැති හේතුව මට තේරෙනවා නෙමෙ. ඒත් තාත්තා ඡන්දෙන් පරාද වෙනවා. ඊට පස්සෙවත් ඔයා මාව බඳිනවද? අපේ දරුවො ගැන හිතලවත්...."

අරනා ඇසුවේය. මම කිසිවක් නොකීවෙමි.

දරුවන්ගේ මුහුණු දකින්නට තිබුණේ තව දවස් දෙක තුනක කාලයකි. මට මගේ ගෙදර යන දොළක් ඇතිවිණි. එය කී වහාම අරනා මා ගෙදර එක්ක ගියේය. ගෙදර උන්නේ විවාහපත් නොවුනු අම්මාගේ වැඩි මහලු සහෝදරියකි. මා දක මුලදී වාගේ ඇ කිපුණේ නැත. මගේ හැටි දක ඇගේ ඇස් දෙක කඳුළින් පිරිනි.

"එන්න එන්න පුතේ.... ප්‍රවේසමෙන්"

ඈ මා එහෙම පිළි ගැනීමම මට මහත් දුකක් විය. මම ලොකු අම්මාගේ දෙපා පළමුව වැන්දෙමි.

"අපේ පරම්පරාවෙ උඹ තරං ලස්සනට වැදගත්කමට හැදුනු දරුවෙක් නෑ. ඒක කවුරුත් දන්නවා. පුතේ.... මේ වෙච්ච දේවල් විශ්වාස කරගන්න බැරුව මං නං ඉන්නෙ.... නංගියි මල්ලියි මැරුනෙ ලැජ්ජාවට. එයාලා ඔයාව හැදූ විදිහට ගමට රටට මූණ දීගන්න එයාලට බැරිවුණා."

අරනා මහා වේදනාවකින් මදෙස බලා උන්නේය. මම මුළු ගේ පුරාම ඇවිද ගියෙමි. මගේ කාමරයට ගොස් බොහෝ වෙලා උන්නෙමි. මගේ ළමා කාලය තරුණ විය ගෙවුණු ඒ කාමරය තවමත් එලෙසම වේ. නිදහස් ජීවිතය සොඳුරු සිතුම් පැතුම්



http://e-pusthakalaya.blogspot.com

ජීවිතය මහා නැවුම් සිහින වෙතට ගෙන ගිය යොවුන් විය මම මේ කාමරයේ ගෙවා දැමීමෙමි. ඒ සා විසල් බලාපොරොත්තු තිබූ මගේ අනාගතය පොඩි පට්ටම් කළ දේශපාලනයට සාප වේවා.

හදවත කිලුටු විය. අපිවත්‍ර විය. මම මගේ කාමරය පුරා සක්මන් කළෙමි. සක්මන් කරමින් භාවනා කළෙමි. එය කෙතරම් සාර්ථක භාවනාවක් දැයි මා දන්නේ නැත. ඒත් දෙපා රිදෙන තුරු මා කාමරයේ සක්මන් කළෙමි.

"ආයු දුව"

"දෝණී...."

"රත්තරණේ...."

අම්මාත් තාත්තාත් කතා කළේ එහෙමය.

"වෙලාවට කන්න ඕන.... නැත්නම් ලෙඩ වෙනවා.... සෝ කට අරින්න....."

අම්මා මා ලොකු වූ පසුත් මා වටකොට ආදරයේ පවුරු බැන්දාය. අම්මාටත් තාත්තාටත් මා හැරුණු කොට වෙනත් අනිවාර්යයම වූ විෂයක් වූයේ නැත. ඔවුන් ලෝකය දුටුවේ මා කරණ කොටගෙනය. දෙමාපියන්ට දරුවන් කෙතරම් වටිනවාදැයි දරුවකු තේරුම් ගන්නේ ඔහු හෝ ඇය දෙමාපියන් වෙද්දී හෝ වූවාට පසුය. ඒත් මම මගේ ප්‍රේමයද දෙමාපියන්ගේ සතුට වෙනුවෙන් සතුටින් අත්හළෙමි. ඒ මගේ දෙමාපියන් ගැන දන්නා නිසාය. මා නැතිව ඔවුන්ට හුස්මක් වැටුනාදැයි මම නොදන්නෙමි. දෙමාපියන්.... සියලු දෙමාපියන් එහෙමද මා දන්නේ නැත. ඒත්





මට පුංචි සීරීමක්වත් වූවෝතින් මගේ තාත්තා කලබල විය. මගේ අම්මා ඒ ගැන හඬා වැටුණාය.

"උඹව උඹේ තාත්තා හැදුවෙ මලක් වගේ...."

අම්මාගේත් තාත්තාගේත් මළ ගෙදරිදී ලොකු අම්මා හැඩුවේ එහෙමය. මම සියළු දේ මගේ දෙමාපියන් වෙනුවෙන් කළෙමි. මා ජීවත් වූයේ ඔවුන්ගේ සතුට පතාය. ඒත් හදිසියේ මගේ ජීවිතයට ගොඩ බැස්සා වූ සුනාමියෙන් මම වැනසුනෙමි. ගෞරවයෙන්.... නම්බුවෙන් ඉහළම තලයක තබා තම දියණි හැදූ වැඩූ දෙමාපියන්ට ලැබුනේ මහා දඬුවමකි. මට ඉකිගැසිණි. මගේ දෙමාපියන් මේ කාමරය දෙස බල බලා කෙතරම් වේදනා විඳින්න ඇත්ද? තමන්ගේ දියණිය.... නම්බුව.... අවනම්බුවක් කළ.... ගෞරවය අවමානයක් කළ බව දසින් දැක දැක ඔවුන් කෙතරම් විඳවන්න ඇත්ද? ඒත්....... මා කළ වරද කිම.

මගේ සැමියා අතුරුදන් විය.

තරුණයෙක් ගෙට වැද මා දූෂණය කළේය.

ඔහු මා ඔහුගේ ගෙදර රැගෙන ගියේය.

සියලු අවමන් විඳින්නට සිදුවූයේ ගැහැනියක වූ නිසාය. නෘපති ඇමතිතුමාගේ පෝස්ටර් යටවන්නට විපක්ෂයෙන් ශානුකගේ පිංතූර අලවා තිබිනි. ශානුකගේ පෝස්ටර් ළඟින් මාගේත් අරනාගේත් පිංතූර තිබිණි. මගේ පිංතූරයට බුලත් කහට ගා තිබිණි. සමරුත් එය ඉරා තිබිණි. නොහොබිනා දේ ලියා තිබිණි.

අම්මේ.... තාත්තේ.... මේ ඒ දේශපාලනයයි. අම්මේ තාත්තේ නුඹලා මා ආදරයෙන් සෙනෙහසින් රැකබලාගෙන....



http://e-pusthakalaya.blogspot.com

දූවිල්ලකින්වත් අපවිත්‍ර වන්නට නොදී ආරක්ෂා කළා නොවේද.... ඡම් ඒ පවිත්‍රත්වය කෙළෙසුවාවූ දේශපාලනයයි. ඒ පවිත්‍ර දෝණිට අවමන් අපහාස ගෙනාවූ දේශපාලනයට සාප වේවායි කියා නොකියන්නේ කොහොමද?. මගේ අහිංසක දෙමාපියන්ගේ ජීවිත උදුරා ගත්තේ මේ දේශපාලනයයි කියා නොහිතා ඉන්නේ කොහොමද?.

"ආයු"

අරනය කතා කරයි. මම කතා නොකළෙමි. මම සක්මන් කරමින් භාවනා කළෙමි. මේ කුමන භාවනාවක්ද? අනාපාන සති භාවනාව නොවේ. මා ගත් හුස්මක් නැත.... මෛත්‍රී භාවනාව නොවේ. සියලු සත්වයින්ට මෛත්‍රී කරන්නට මට මේ වෙලාවේ ලෙහෙස වූයේ නැත. මම හයියෙන් හඬන්න ගත්තෙමි. බොහෝ කල් හදවතේ වූ වේදනාව දඩස් ගා අත්හළෙමි. විලාප දී හැඬුවෙමි.

"ආයු..."

"ආයු......."

"දුවේ..."

"සුදූ නෝනේ..."

ගැහැනියක සතු සියලුම අයිතීන් ගැහැනියක සතු සියලුම ශක්තීන් දෝලන්‍ය වූ ගැහැනු හිත එක් නිමේශයකදී මෙහෙම කඩා බිඳ වැටීම අරුමයක්ද?. මම හිසකෙසින් ඇදගෙන බිම ඇද වැටුනෙමි. කුසෙහි හුන් දරුවන් වේගයෙන් සැලෙනවා.... හඬාවැටෙනවා මට දැනිණි. ඇඳ යට වූ විසල් කැත්ත මට හසුවිය.



http://e-pusthakalaya.blogspot.com



"අම්මේ.... අපේ අයිතිය...." එතකොට ඔවුන් මගෙන් විමසනවා මට ඇසිණි.

"අම්මේ අපට අයිතියක් නැද්ද?"

මේ ලෝකය දකින්න....

මේ ජීවිතය ගෙනියන්න.

මා අතින් කැත්ත බිම අතෑරුනා නොවේ. මා එයින් බිමට.. සුදු ටයිල් කල බිමට එක දිගට ගැසුවෙමි.

"ආයු.... මගෙ ආයු...."

"රත්තරන් දුවේ.... දොර ඇරපං...."

නොවේ.... යටිගිරියෙන් කෑගසා හඬමින් මම බිම ඇද වැටුනෙමි. මගේ දරුවන් දේශපාලනයේ දූෂනයෙන් උපදිනා වුං හෙට ලෝකය ඉදිරියට යන්නා වූ මගේ දරුවන් මරා දමන්නට.... දේශපාලනය නොකල මේ අම්මාට.... අම්මා කෙනෙකු වූ මේ අම්මාට නොහැකි හින්දා මම කැත්ත අත්හළෙමි.

ඒත් පපුවෙන් නැගෙන අඳෝනාව....

ආත්මය නගන අඳෝනාව....

ඔය දූෂණයේ දරුවන්....

ඔය දේශපාලන දූෂිත කාලේ ප්‍රතිඵලයක්....

ඇඳල දාපන් බොටුවෙන්....



The Spirit of Sri Lankan e-community

පෙන්නපත් භූපති වගේ අධමයන්ට මං වාල් නොවුනු බව....

කාලය පැමිණෙන තුරු බලා හිටියා විතරයි. දේශපාලනය නොදන්නා පාලකයෙකුගේ අත කොලුවක් නොවුනු බව.

"පෙන්නපං...."

මං වැනසුවා මේ දූෂණය....භීෂණය

අතුරුදහන්වූ ඝාතුක වෙනුවෙන් ඝාතුකගේ බිරිදට....

ජයවේවා..........

විපක්ෂයේ ලකුණු.... පැසසුම් එපාද?.

"අම්මෙ."

කුසින් නැගෙනා ඒ මියුරු සංගීතයක් වන් හඬ....

"බේරුවට පිං අපේ ජීවිත.... අම්මේ පිං...."

මම මගේ කුස වැළඳගෙන බිම පොළොවේ දිගා වූයෙමි. එකදිගට දොරට ගසන හඬ.... දෙඅත්... දෙපා වෙව්ලන හඬ... දරුවන් දඩිං බිඩිං ගා කුසට පා තබා දඟලන හඬ, මේ සියලු හඬවල්...

මහා ශක්තියක් වී... රේසින් කාරයක් වාගේ... අධික වේගයකදී පවා ස්ථායීතාවය බිඳ නොවැටී පවත්වාගෙන යන රේසින් කාරයක් වගේ මම ඉදිරියට ඇදියෙමි...





වසර දහස් ගණනකට ඉහතදී මිනිසා ශක්තිය ලබා ගැනීම සඳහා ජලය භාවිතා කරන ලදී. ගලායන ජලයට උදම් ශක්තිය... මුහුදු රළ ශක්තිය වන්නට තරම් හැකියාවක්... ප්‍රබල ශක්තියක් වන්ට හැකිනම්. මව් කිරෙහි කෙතරම් ප්‍රබල ශක්තියක් තිබෙන්නට පුළුවනිද? සියලු ජීවීන්ගේ පැවැත්ම ආරම්භය මව් කිරිය. මම එවන් ශක්තියක් සොයායන මගේ නිවුන්දරු දෙදෙනා එක්ක ආලෝක ශක්තිය නැති ගමන් මගක ඇවිදගෙන ගියෙමි.

"ආයු..."

"ආයු..."

"මගේ රත්තරන්..."

මම ඇස් හැර ඉතිං බැලුවෙමි. සියල්ල නොදින්ද?

කුස හිස්ය... වහා කුසට අත තබා බියවී මම නැගී උන්නෙමි.

"දරුවො..."

"පුතයි... දුවයි... ඉන්න අරන් එනකන්."

හෙදිය හිනහුනාය. අරනාඃ රතුපාට වී හිදියි. ඒ නෙත් සෙනෙහසින් උතුරා යයි. මා ඉපදුණු විට මගේ තාත්තාගේ ඇසුත් එහෙම වන්ට ඇත.

දෙන්නම හොඳ බර... සීසර්වත් නොකර ගන්න පුළුවන් වුණා."



http://e-pusthakalaya.blogspot.com

වෛද්‍යවරිය අප වෙත ආවේ ඉන්පසුවය. පුංචි ඇස් පියවා ගත් අයිය නගෝ මා ඉදිරියේය. මව් සෙනෙහසින් මා උතුරා නොගියෙම්ද? මම වහා දරුදෙදෙනා උදුරා ගත්තෙමි.

"කිරි දෙන්න..."

වෛද්‍යවරිය මගේ හිස අත ගෑවාය.

"මං හොඳින්..."

මම දරුවන්ට කිරි දුන්නෙමි. රෝස පාට දෙතොල් උල් කර, කිරි බී දරුවන් ළදරු ඇදෙහි තැබුවේ හෙදියයි. ඇයත් රෝහල් කාමරයෙන් ඉවත්ව ගිය පසු මමත් අරනායත් විතරක් තනි වූයෙමු.....

"ආයු..."

කී අරනාය ඉකිබිඳ බිඳ හඬන්න වූයේය. මම තිගැස්සී බලා උන්නෙමි. මගේ දෙපා තදට අල්ලාගෙන අරනාය පොඩි දරුවකු වාගේ හඬන්න වූයේය.

"මට වැඳල සමාව ගන්න ඕන මගෙ දරුවන්ගෙ අම්මගෙන්. මට ටිකක් ඉඩදෙන්න..."

මට දෙපා අදින්න ඉඩ ලැබුණේ නැත. ඔහු මගේ දෙපා වැඳ බදා හඬන්න වූයේය.

"මං මං හිතුවෙ සේරම ඉවර වුණා කියල... මේ පවුකාරයට සමාව දෙන්න. මම එදා ඒ ඔයාට කරදර කරද්දි ඔයා වෙව්ල වෙව්ල... ගැහි ගැහී ඇඬපු හැටි මතක්වුණා... ඔය අත්දෙකෙන්



http://e-pusthakalaya.blogspot.com



මාව මරල දාන්න ආයු... ඒත් මගෙ දරුවෙ දෙන්න... ඒ ඔයාගෙ දරුවො... ඔයා තමයි මේ ලෝකෙ හොඳම අම්ම...."

"හොඳම..."

මම මගේ දරුවන් දෙස බැලුවෙමි.

"ඔයා බෙහෙත් බිව්වට මං හිතුවෙ මගෙ දරුවො විරූපි වෙයි කියල ඒ කොහොම උනත් මං මගෙ දරුවො භාර ගන්න හිතාගෙනයි හිටියෙ. මගේ මුළු ජීවිතේම ඔයයි. දරුවොයි."

අරනාය හඬයි... මගේ හිත විලාප දෙයි... මම මේ අහිංසක අසරණ දරුවන් මරා දමන්නට බී බෙහෙත්... දෙවියනි එදා කැප්ත කුස ළඟදි හතර නොවුනා නම්... මම වහා යහනින් බැස්සෙමි.

"එපා... ඔයාට අමාරුයි..."

අරනාය එපා කියද්දිත් මම යහනින් බැස දරුවන් ළඟට ගියෙමි. මගේ පුතා... මගේ දෝණී... මම දැහින්ම මගේ දරුවන් වඩා ගත්තෙමි.

"වැටෙයි..."

අරනාය ද දරුදෙදෙනාට අත තැබුවේය. මට දරුවන්ගේ මුහුණු බලන්න ශක්තියක් වූයේ නැත.

"දන්නවද ආයු... භූපති ඇමතිතුමා මේ සැරේ ඡන්දෙත් පරාදයි..."

අරනාය කීවේය. මම වහා අරනාය දෙස බැලුවෙමි. දරුවන් යහනේ තබා මගේ යහනට වීමි.

"පරාදයි..."

"ඔව්... කියා අරනාථයට හැරෙන්නට ඉඩ ලැබුණේ නැත. කාමරයේ දොර හැරිනි. භූපති ඇමති තොවේ... නිකම්ම නිකම් භූපති කාමරයට ඇතුලු විය. මුහුණේ ලේ බිඳක් වූයේ නැත.

"ඇයි..."

ඇසුවේ අරනාථය.

"ඇයි... ඇයි..." කී භූපති වහා මගේ දිග කොණ්ඩයෙන් අල්ලා මා යහනෙන් බිමට දැම්මෙ අරනාථයව හිතන්නවත් නොතබාය.

"ඒයි... ගා අරනාථ මැදට පැන්නත් භූපතිගේ ආරක්ෂකයින් අරනාථයටත් මටත් තුවක්කු දිගු කලේය.

"පර... පාහර බැල්ලි... මං පරාද වුණේ තෝ නිසා... අහපිය... උඹ... මගෙ පුතාගෙන් අයින් වෙලා යන්න ඕන... දරුවො දෙන්නව දාල යන්න ඕන... නැත්නං උඹව මරල හංගනව තෝරුනාද?"

"මං ආයුව කසාද බඳිනව..."

අරනාථ කෑ ගැසුවේය.

"ඒක කලින් කරපං කිව්වා. මේකිට ඕන උනේ මාව නැති කරන්න. දැන් මං මේකිව නැති කරනව."

"අහපිය... උඹේ මිනිහා මට විරුද්ධව වැඩ කළ නිසයි මං ඌව අතුරුදන් කළේ. හැබැයි මගෙ හොඳ කමට මං ඌව මැරුවෙ





නෑ. ඌ තවමත් ජීවත් වෙනව. ඉතිං උඹට ඌ ඉද්දි මගෙ පුතාව බඳින්න පුළුවන්ද?"

"ඔය බොරු ආයූ..."

අරනාථ කෑගැසුවේය.

"බොරු... බොරු නෙමේ... එහෙනං බැඳපන්... එදාට මං ගාත්‍රුකව එවනව උඹලගෙ කසාදෙ බලන්න."

භූපති මගේ ගෙල අතැර යන්න ගියේය. රෝහල් කාර්යය මණ්ඩලය බියවී බලා උන්හා විතරය. අප ජීවත් වන්නේ මෙවන් සමාජයකය. මෙවන් රටකය. අප අපේ ඡන්දයෙන් පාලකයන් පත් කරන්නේ මෙවන් අනාගතයක් දකින්නටද?.



The Spirit of Sri Lankan e-community
http://e-pusthakalaya.blogspot.com

10

මගේ මුහුණේ හසරැලුත් තිබිණි. දුකත් තිබිණි. සතුටට කාරණානම් ශානුකගේ ජීවත් වීමය. භූපතිගේ ඇත්තත් බොරුවත් මට දැන් ඔහුගේ මුහුණෙන් හිතා ගන්නට පුළුවන. ශානුක අනිවාර්යයෙන්ම ජීවත්වන බව විශ්වාසය. එය මගේ හසරැලිවලට හේතුවයි. දුකට කරුණ වූයේ... මගේ දරුවන් මට අත්හරින්නට වීමයි.

"ආයු..."

අරනා 'ආයු' කියා මගේ නම කීවරක් කීවේද? මම නැසුකණ්ව උන්නෙමි. දරුවන්ට නම් දුම්මේ අරනාය. එය අගට අරනා ඔහුගේ වාසගම යෙදුවේය. මම හැගීම් ගොන්නක් එකතු කරගෙන මගේ දරුවන් දෙස බලා උන්නෙමි.

"තීරණ ගන්න පුළුවන්... මේ දැන් ගැන හිතල සතුටින් ඉන්න"





අරනා කීවේය. එය සත්‍යයක් සේ සලකා මම දරුවන්ට කිරි දුන්නෙමි. ජීවිතයේ සියලු යසඉසුරු අම්මාගේ තනය යැයි සිතා වාගේ දරුවන් මාරුවට කිරි උරයි. අම්මාට වැඩියෙන් කිසි දිනෙක තාත්තාට නම් දරුවන්ට ආදරේ කරන්න බැහැ යැයි මට හිතුණේ දැන්ය. ඒත් අරනා ගැන කියනවානම් මා දුටු හොඳම පිරිමියා ඔහු යැයි කියා කියන්නට තිබිණි. ඔහු දේශපාලන අතකොළුවක් වී මගේ ජීවිතය විනාශ නොකලා නම්...

එතරම්ම සංවේදී පිරිමියකු අතින් ඒවගේ බරපතල වරදක් වීම මට විශ්වාස කළ නොහැකි තරම්ය. ගැහැනියකගේ ගෙට ඇතුළු වී ඈ දූෂණය කරන්නට පෙළඹීමත් සාමාන්‍ය තරුණයෙකුට කළ හැකිද?. කිසිදා වෙනත් ගැහැනියක ළඟට නොගිය වෙනත් ගැහැනියක ඇසුරු නොකල අරනා වාගේ තරුණයෙකු එතරම් විසල් වරදකට සම්බන්ධවීම ඔහුගේ වරදක්ද?. නොවේ නම් එයත් දේශපාලනයේ මහා ගැටයක්ද? මට තේරුම් ගන්න බැරිය. අරනා ගැන මා දන්නා අබැටක තරම් දේවිද ඔහු ඇසුරේ ගෙවි ජීවිතයට ජීවිතයක් කියන්න පුළුවන් කමක් නැති මගේත් දරුවන්ගේත් සියලු ඕනෑ එපාකම් සොයා බැලුවේ ඔහුය. එය මහා සතුටක් ලෙස සලසා නොවේ නම් ඔහු එය කළේ මා බිරිඳ හැටියටත් දරුවන් ඔහුගේ දරුවන් හැටියටත් සළකාය.

"භූපති කිව්වෙ ඇත්ත වෙන්න බෑ ආයු..."

අරනා එක් හැන්දෑ වරුවක කීවේය. මම අරනාගේ මුහුණ බලා උන්නෙමි.

"ඒක ඇත්තක්..."



http://e-pusthakalaya.blogspot.com

මම කීවෙමි. අරනා‍ය වහා ඇස් ඔසවා මදෙස බැලුවේය.

"භූපති කියන ඇත්තයි බොරුවයි මට තේරුම් ගන්න පුළුවන්. ශාත්‍රුක ජීවත් වෙනවා... මට එයාව කොහොම හරි ගෙනත් දෙන්න..."

මම කීවෙමි. අරනායගේ ඇස් තෙත්වනවා මම දුටුවෙමි. එත් මේ වෙලාවේ වැදගත් වූයේ ශාත්‍රුක දකිමයි.

"බලමු..."

"ඇයි බලමු කියන්නෙ... කොහොම හරි මට ශාත්‍රුක ඕනෙ. එයා කොහේ හරි ඉන්නවා. ඒක ඔයාගෙ තාත්තා දන්නවා... මට ශාත්‍රුකව ඕනෙ අරනාය. ඔයා කරපු පව් හෝද ගන්නද ඕනෙ. ඒ පවෙන් නිදහස් වෙන්නද ඕනෙ... එහෙනං මට එයාව ගෙනත් දෙන්න..."

මම කියවාගෙන ගියෙමි. අරනාය 'හා' 'හ්ම්' නොකීවේය. එය කෙතරම් අපහසු දැයි... අමාරුදැයි මා නොදැන උන්නා නොවේ... ඒත් අරනාය හැකි හැම උත්සාහයක්ම ගනීවියැයි මට සිතිණි. මම සුරතල් දරුපැටව් දෙන්නා දෙස බලා උන්නෙමි. මේ දරුවන්ගේ හෙට දවස ගැන හදවතේ කඳුලක් නැතිද? නැවත ශාත්‍රුක මා ඉදිරිට පැමිණි විට මා ගන්නා තීරණය කුමක්ද? ඔහු මගේ විවාහක සැමියාය. හදවතින් ම මම ඔහු සමග යමි. ඔහු දකීමත් මට සතුටකි.

ඒත් ඔහු ජීවත් වනවා මිස ඉන් එහා කිසිම තොරතුරක් මා දන්නේ නැත. මා නීතියේ පිළිසරණ නොපතන්නේ ඇයි? නොවේ එවිට ශාත්‍රුකට ජීවත්වීමේ අයිතියත් නැතිව යනු ඇත. භූපති ඔහු මරා සඟවා දමනු ඇත. නොවේ... කෙසේ හෝ ශාත්‍රුක ජීවත් කර





ගත යුතුය. මා මෙතරම් කල් ජීවත් වූයේ ඔහු ජීවත් කරනු වස්ය. නින්දා අපහාස, අවමාන ලැබුවේ ඔහු වෙනුවෙන්ය. සියලු දේ කලේ ඔහු වෙනුවෙන්ය. ඒත් සියලු දේ ඔහු වෙනුවෙන් කළද ඔහු පැමිණි කළ ඔහු මා පිළිගනීවිද?. ලෝකයා වාගේ ඔහුද මා නන්නත්තාරේ ගිය ගැහැනියක ලෙස හංවඩු ගසාවිද?... ඔහු මා පිළි නොගත් කළ මගේ ඉදිරි ජීවිතය කෙබඳු වේවිද? හැමදාමත් නිසිද්‍ය අර්ථයක් පදනමක් නැති ජීවිතයක් අරනාය සමගින් ගෙවනවාද?.

ශාත්‍රුක සියලු දේ ඔබ අතේය. මගේත් දරුවන්ගේත් ජීවිතය ඔබ අතේය.

මගෙ හිත ගැන මට හිතෙන දේ ගැන මට කතා කරන්න කෙනෙක් හිටියෙ නෑ. පුංචිම කාලෙදින් අම්මා කියනවා මං රවුම් කණ්ණාඩි මේසෙ ඉස්සරහට වෙලා තනියම කතා කළාලු. අක්කලා... නංගිලා... අයියලා... මල්ලිලා කවුරුත් නැතිව තනියම හැදුනු මට ආශ්‍රය කරන්න කියලා පුංචි යාළුවෙක්වත් හිටියෙ නෑ... මං නරක් වෙයි කියලයි අම්මයි තාත්තයි හිතුවේ. ඒක මගෙ ළමා මනසට මොන තරම් වදයක් උනාද කියනවනම් මං තනිවුණා. මං තනිකම දරා ගන්න බැරි වුණාම තනියම කියෙව්වා. කණ්ණාඩිය මගෙ හොඳම යාළුවා උනා. පුංචිම කාලෙදි මං කණ්ණාඩියෙන් පේන මගෙම රූපෙ මගෙ එකම යාළුවා කියල හිතුවා... ඒ යාළුවාට හැම දේම කියන්න මං පුරුදු වුණා. මගෙ දුක සැප බෙදාගන්න මං පුරුදු වුණා.

"මේ ළමයට පිස්සුද මංද... කණ්ණාඩිය එක්ක කතා කර කර ඉන්නවා."



http://e-pusthakalaya.blogspot.com

මගෙ මේ පාලුව තනිකම නැති කරන කතා බහ අම්මා දක්කෙ පිස්සුවක් විදිහට. මොනතරම් මට අම්මගෙන් තාත්තගෙන් ආදරේ ලැබුනත් ඒ අය මගේ ළමා කාලය ගැන හිතුවෙ නෑ. වත්ත පහල ගීතා නැන්දගෙ ළමයි අහල පහල ළමයි එක්ක සෙල්ලම් කරන හඬ මං අහගෙන හිටියෙ උස තාප්පෙට මෙහා පැත්තෙ ඉඳන්. අන්න හිතාවෙන්න... කතා කරන්න මට කවුරුවත් හිටියෙ නෑ... ඒ පුංචි කාලෙ වාගෙම අදත් මට කවුරුත් නෑ... අදත් මං ගමෙන් රටෙන් හැංගිලා. මං කණ්ණාඩි රවුම ඉදිරියේ අදත් හිටගෙන...

"කියන්න ආයු..."

මගේම රූපය මට කතා කරනවා...

"වෙනස් වුනේ කාලය විතරයි..."

"ඔව්... ඔයා එතනමයි ආයු..."

"මට දුක හිතෙනව මගේ ජීවිතේ ගැන...

"ඔයාට ඔයාගෙ ජීවිතේ ගැන තීරණයක් ගන්න කාලය ඇවිත්. ශානුක ජීවත් වෙනවනං එයත් එක්ක එකතු වෙලා ජීවිතේ ඉතිරි ගමන යනවද නැත්නං ඒ යට ගියාව අතීතයට එකතු කරල ඔයාගෙ දරුවෝ දෙන්නගෙ තාත්ත කසාද බැඳල ඉදිරි ජීවිතේ ගෙනියනවද..."

"මට ශානුකව ඕන..."

"ඔය හදවතින්මද ආයු..."





"ඔව්..."

"ඔය හදවතට හොඳට අත තියන්න. ඒ හදවත ගැහෙනව ඇහෙනවද? ඒ හද ගැස්ම වෙනදට වඩා වෙනස් වෙනව නේද? ශානුක ඔයාගෙ මහත්තය කවදාවත් පවුල් ජීවිතේදී ඔයාට වරදක් නොකල ඔයාගෙ සැමිය. අරනා බලහත් කාරයෙක් ඒත්... අරනායගෙන් ඉගෙන ගත්ත ආදරේ... අරනා ළඟ තියෙන ආදරේ... අරනා ළඟ තියෙන සංවේදී කම... හදවතින්ම ඔයා ගැන හිතන තරම... ඒ දේවල් අමතක කරන්න ලේසිද? ඒ තරං ලොකු ආදරයක් ශානුක ළඟ දකින්න හැකියාව තිබෙනවද?"

"නවත්තා ගන්න. අරනාගෙ ආදරෙන් මට වැඩක් නැහැ."

මම කෑගැසුවෙමි.

"අන්න හොඳයි ආයු. පසුතැවිලි නොවී ජීවත් වෙන්න."

මම වහා වටපිට බැලුවෙමි. කිසිවකු මා දුටුවේය යන ලැජ්ජාවෙන් හෝ ඊට සමාන හැඟීමක් මට ඇතිවී තිබිණි. ඒත් කිසිවකුත් උන්නේ නැත. මා විතරය. කැඩපත විතරය.

* * * * *

අරනා ආවේ හිස් අතිනි. ඔහු මට මුහුණ නොදී උන්නේය. මා සමඟ වචනයක් දෙඩුවේද නැත. මට ශානුක වෙතට ගියෙමි.

"ශානුක ඉන්න තැන කිව්වද ඔයාගෙ තාත්තා..."



http://e-pusthakalaya.blogspot.com

මම ඇසුවෙමි.

"නැහැ..."

එපමණකි. ඔහු තවත් මා සමඟ දොඩන්න ආවේ නැත. ශානුක ගැන කිසිදු තොරතුරක් නොතිබුණේය. මම නොසංසුන් වී උන්නෙමි. ඇත්තටම මා මෝඩියකි. අරනායගේ උදව් පැතීම වැරදිය. ඔහු මට ආදරේ කරයි. මා ළඟින් තබා ගැනීම ඔහුගේ අරමුණයි. ඉතිං ඔහු ශානුක සොයා දෙන්නට ඉදිරිපත් වේවිද? මෙය මාම විසදා ගත යුතුය. මම භූපති සොයා ඔහුගේ නිවසට යන්න තීරණය කළෙමි.

"කොහේ යන්නද නෝනෙ..."

මේ කාලය පුරා මා තනිව ගෙයින් එළියට නොබැස්ස බැව් දන්නා කිරි අම්මා ඇසුවාය.

"මං යනවා භූපති හම්බ වෙන්න..."

"දෙයියනේ..."

"මේක මංම විසඳගන්නවා..."

මම භූපති ඇමතිගේ ගෙදර පළමු වරට ගියෙමි. භූපති ඇමති, ඇමති නොවේ. මන්ත්‍රීද නොවේ. ඔහු නිකම්ම නිකම් භූපතිය. මා ගියේ ත්‍රී රෝද රියකිනි. එය විසල් නිවසකි. ඉදිරි ආරක්ෂක කවුළුවෙන් මම කතා කළෙමි.

"ඇයි..."



"භූපති මහත්තයට කියන්න ආයු කියල කෙනෙක් ඇවිත් කියල."

කවුළුව වැසිණි. පැය කාලක් පමණ ගිය පසු මට පුංචි ගේට්ටුව හැරිණි.

"එන්න කිව්ව..."

මට පුදුමත් හිතිණි. ඒ ලෙසට බියකුත් සිතිණි. ඒත් බිය නොපෙන්වා මම ඒ පිළිවෙළට සැකසූ තණ බිමෙහි ඇවිද ගියෙමි. භූපති උන්නේය.

"මොකද?"

ඔහු කෙලින්ම ඇසුවේමි.

"ශානුක කෝ?"

මම ඇසුවෙමි. භූපති මා දවා හළුවන බැල්මක් හෙළුවේය. මගේ හිසේ සිට පාදාන්තයටම ඔහු බලා උන්නේ කෑදර හිවලකු සේය.

"නෝනලත් නෑ. නුවර ගිහින්. ගෙට ආවනං..."

"නෑ... මෙහෙම හොඳයි."

"මගෙන් උදව් ඕන නං මටත් උදව් කරන්න ඕනි."

භූපති මනමාල ලෙසින් කීවේය.

"ශානුක ජීවත් වෙනව. ඒක මට දනෙනවා. භූපති

http://e-pusthakalaya.blogspot.com

ඇමතිතුමාට ලබන පාරවත් ඇමතිකම ගන්න පුළුවන් ශානුකව එළියට දැම්මොත්''

මම කීවෙමි. භූපති ඇස් විදහා බැලුවේය.

''ඒ කොහොමද?...''

''ශානුක දන්නවද මේක පිටිපස්සෙ ඉන්නෙ භූපති ඇමති කියලා...''

''කොහොමටවත් නෑ...''

''ඉතිං ශානුකව එළියට දාන්න... ඇමතිතුමාට මාවත් කරදරයක් වුණා. මං ශානුකත් එක්ක වෙන රටකට යන්න...''

''අර ළමයි දෙන්නව කවදාවත් අරන්‍ය දෙයිද? ඒක නඩුවක් වෙයි...''

''නැහැ... මං දරුවො දෙන්නව අරන්‍යගෙන් ඉල්ල ගන්නං. අරන්‍ය මට ඇහුම්කන් දෙනවා... මං කැමතියි මේ ඇමති පවුලෙන් අපේ ජීවිත ඈත් කරන් යන්න. එතකොට ඇමතිතුමාට පුළුවන් [illegible] පාර දිනන්න. මේ ප්‍රශ්නෙ දිගින් දිගට ගියොත් ඇමතිතුමාගෙ දේශපාලන ජීවිතේ අවසන් වෙයි.''

මම බොහෝ කරුණු කාරණා පැහැදිලි කළෙමි.

''මං ශානුකව එළියට දාන්නං. හැබැයි මට මඩ ගහන්න ඌ ලංකාවෙ ඉන්න බෑ. පිට රටකට යන්න ඕන...''

''හා''



http://e-pusthakalaya.blogspot.com



''සඳහටම යන්න ඕන''

''යන්නං... අනිවාර්යයෙන්ම''

''මං මගේ දේශපාලන ජීවිතේදි කරපු ලොකුම ගොන්කම තමයි ඔය ශානුකව හිර කරල දාපු එක. ඔය ළමය යන්න. මං ශානුකව එවන්නං...''

මට විශ්වාස නොවූ තරමිය. ආයේ මා ගෙදරට ආවේ කෙතරම් ඉස්පාසුවක් නැතිවද.. මට සතුට දරා ගන්න බැරිව තිබිණි. ඇස්වලින් කඳුළු පැන්නේ අරන්‍යගේ ගෙදර දොරටුව ඉදිරියේදීය.

''කොහෙද ගියේ...''

ඒ අරන්‍යය.

''භූපතිගෙ ගෙදර...''

මම කීවෙමි.

''ආයු... ඔයා...''

''ඔව් මට ශානුකව ගේන්න ඕන දෙයක් කරනවා...''

''ඕන දෙයක්... ඕන දෙයක්...''

''ඕන දෙයක් කිව්වේ මිනිහෙක් එක්ක නිදා ගන්න එක නෙමෙ නේ. තේරුණාද... ඔයා ශානුකව ගෙනාවද... මොනාද ඔයා ඒ වෙනුවෙන් කළේ...?''

මම කෝපයෙන් කෑ ගැසුවෙමි. අරන්‍ය පසෙකට වූයේය.

මම කාමරය වෙත දිව ගියෙමි. අරනාගේ දෙපා ගැටෙන හඬ ඇසින් මම හැරී නොබැලීමි. ඔහුගේ හිත රිදවීම යුතු නොවේ. ඔහු ගැන වේදනාවක් නැතුවත් නොවේ. සමහර ප්‍රශ්න වලදී තරුණයකු හැටියට ඔහු වේදනා වින්දා වැඩිය.

"මං ශානුකව හෙව්වා... ඔයා විශ්වාස නොකලට මං ශානුක ගැන ඔයා හරිමටම වද වුණා. මුලදී ශානුක ගැන වෛරයක් තිබුණු එක ඇත්ත. ඒත් පස්සෙ මං තේරුන් ගත්තා මෙතනදී ශානුක වැරදි නෑ. එයා ලිව්වෙ එයාට ජේන දේ... සමහර වෙලාවට තාත්තාට මඩ ගහද්දී අම්මව නිකම්ම ඒකට ඇදෙනවා... හරියට ඔයාට වුණා වගේ. මං හිතට එකඟ නැති උනත් භූපතිව හම්බවෙන්නත් ගියා... භූපති කිව්වා ඔයාට බොරුවටයි කිව්වෙ එයා ළඟ ශානුක නෑ කියලා... මං බොරුකාරයෙක් වංචාකාරයෙක් නෙමෙයි. මං දන්නව ආයු මං මොන තරම් ආදරේ කළත් ඔයා ශානුකගෙ. ඔයා කවදාවත් මට ආදරේ කරන්නෙ නෑ... ඒත් මං මගෙ ජීවිතකාලෙටම ආදරේ කළේ ඔයාට විතරයි. ඒක මං මැරෙනතුරුත් එහෙමමයි.

තිගැස්මෙන් වේදනාවෙන් මම ඔහු කියන දේ අසා උන්නෙමි. මේ කොහේ හෝ බොරුවකුත්, මේ කොහේ හෝ ඇත්තකුත් තිබේ. භූපති මට ශානුකව ගෙනත් දෙන බවට පොරොන්දු වූයේය. මේ කරදර කාර ජීවිත කතාවෙන් අයින් වී යන්නට දැන් කාලය හරිය. මම දුකක් නැතිව අරනාගේ ජීවිතෙන් මිදෙන්නට බලා ඉන්නෙමි. මට දුක නැත්තේ ඇයි? හදවත ගලවා බලන්නට මට හිතේ. කිසිම ලෙසකින් මා ඔහුට පෙම් නොකළේද?.

විවාහය...



විවාහක බිරිඳ...

අරනාට පෙම් කරනවාදැයි යන ප්‍රශ්නය එතනින් අහවර වී යයි. අප මිනිසුන්ය. ඇත්තය. පෘතග්ජන මිනිසුන්ය. ආදරය, සෙනෙහස, විරහව, දුක, සන්තාපය අපට දනෙන්නේ ඒකය. අරනා හදවතට කොහෙන් හරි රිංගා ගන්න ඇත. ඒ කොතනදැයි ශුද්ධ පවිත්‍ර කර බලන්න හිතක් මට නැත. මේ රවටා ගැනීමක් බව දන්නෙමි. ඒද කම්නැත. රවටා ගන්නේ මාව නම් මා කිසිවකුට වංචාවක් සිදු කර නැත.

තත්පර...

මිනිත්තු...

පැය...

ගෙවෙන්නේ කාලයයි. භූපති සූරිය පෙරුමගේ පිළිතුර කුමක් වේවිද? ශානුක ජීවත් නොවන බව ඔහු අරනාගේට කීවේ සැබෑවක්ද? නොවේ. ශානුක ජීවත්වනවා නියතය. මට කිසි දිනක වරදක් නොකළ මගේ සැමියා ඔහු ජීවත් විය යුතුය. ඔහු මටත් වඩා රටට අවශ්‍ය මිනිසෙකි. මගේ දුරකතනය හැඬිණි.

"හෙලෝ..."

"මං භූපති... දැන් අරනාව නැතුව අපේ ගෙදර එන්න..."

"හ්... හා..."

මට කියන් දැනුණේ නැත. ඒත් සොඳුරු කෙල්ලක... ගැහැනියක භූපති වාගේ තම නම කැත කරගත් අධම සල්ලාල



http://e-pusthakalaya.blogspot.com

මිනිසකු ඉදිරියට යාමේදී කල්පනාකාරී විය යුතුය. බිය විය යුතුය. ඒත් මම බියෙන් තොර වීමි. ඒත් නිකම්ම යා නොහේ.. මට සිහිවූයේ අරනායගේ රහස් ලාච්චුවේ වූ රිවෝල්වරයයි. මම එතනට ගියෙමි. පපුව ගැහෙයි. මෙය ආයුධයකි. කෙනෙකුගේ ජීවිතය නැසිය හැක්කකි. එක මොහොතකින් සියල්ල විනාශ කර දමන්නට පුළුවන. මෙය පෙන්වා අරනාය මා බිය ගැන්වූ හැටි මතකය. හුපති තම පුතා ලවා මා දූෂණය කළේ මේ ආයුධ වලින් මා බිය ගන්වාය. ඔහු බළලුන් ලවා කොස්ඇට බැවූවා නම් මා ඌරා ගේ මාලු ඌරාගේ පිටෙහි තබා කැපීමේ ඇති වරද කිම...

"මේක හුපති සූරියපෙරුමගෙ. මට අයිති දෙයක් නෙමෙ..."

දවසක් අරනාය කීවේය. මම එය අතට ගත්තෙමි. එළෙසට එය කැඩපතින් පෙනෙන මගේම රූපය දෙසට යොමු කළෙමි. අරනාය එන්නට කලින් පිටවිය යුතුය.

අල්මාරිය පෙරලා මම ශානුක ආසම වූ සුදට හුරු දිග ගවොමක් ඇඟලා ගත්තෙමි. හදවත ගැහෙයි. මෙය කුමන හමුවීමක්ද? මෙය කුමන පිළිගැනීමක්ද? මට හැඬෙන්නට එයි. ශානුක ජීවිතයේ කිසි දිනක මා නොරිදවූ මගේ සැමියා ඔහු නොවේද? මම ඉක්මනට ගෙදරින් පිටවීමි. ත්‍රීරෝද රියකට නැගී හුපති සූරියපෙරුමගේ ගෙදර ගියෙමි. පසුගියදාක වාගේ නොවේ. මට ඒ දොරටු හැරදා තිබිණි. හුපති රියට නගින පෙරමග උන්නේය.

"වෙලාවට එන්න කිව්වනං එන්න ඕන"

හුපති කීවේය. ඒත් ඒ වචන වල ඉස්සර වාගේ තරහක් තිබුණේ නැත. උඹ බං කියා කතා කළ හුපති මේමදැයි මට සිතිණි.





එයටත් කුමක් හෝ හේතුවක් හෝ යටි අරමුණක් ඇතැයි මම දන්නෙමි. ඕනෑම දෙයකට සූදානමින් මම හුපති දෙස බැලුවෙමි. හුපති මදෙස බර බැල්මක් හෙලුවේය.

"නගින්න..."

මම නැංගෙමි. බිඳක බියක් තිබුණේ නැත. නැතිවන්නට දෙයක් තිබුණේ නැති නිසා නැතිවන දෙයක් ගැන සොවක් තිබුණේ නැත. බොහෝ දුර සැප පහසු රිය ඉගිල ගියත් හුපති කතා නොකළේය. මමද ගොළුව උන්නෙමි. ප්‍රධාන මාර්ගවලින් ඈත් වී ගියාට පසුව ඉතාම පැරණි නිවසක ප්‍රධාන පිවිසුම් දොරටු හැරුණි. රිය ඇතුළු විය. නතර වූ රියෙන් හුපති බැස්සේ 'එන්න' කියමිනි. මම ද බැස්සෙමි. කෙලින්ම ඔහු ගෙතුලට ගියේය. මමද ගියෙමි.

"මේ මගේ පරණ ගේ."

"එහෙමද?"

"ඔව්... කාලෙකින් ආවෙ. මේක බලාගන්න මනුස්සයෙක් ඉන්නවා. මං අද මිනිහට වෙන ගමනක් යැව්වා."

"ඉතිං... අපි කෙලින් කතා කරමු..."

"ඔව්..."

මමද කීවෙමි.

"ශානුක ජීවත් වෙනවා. දැන් එයාව මගෙ කට්ටිය අරන් එනවා. මෙහෙට නෙමේ. අරනායගෙ ගෙදරට... ආයු... නමුත් ඔයාට රටින් පිටවෙන්න ඕන ශානුක එක්ක. ශානුක ඉදිරියට



http://e-pusthakalaya.blogspot.com

ලියන්න බෑ... ඒ වගකීම ගන්නවද?"

එය කළ නොහැකි බව දන දනත් මම බොරුවට එයට එකඟ වීමි.

"අභික නමයි.., මං ඔයාට ලොකු උපකාරයක් කළා ඒකට ඔයත් ඉතිං මට සලකන්න ඕනේ..."

ඔහු කියන දේ මට වැටහුණි.

"කියන්න..."

ඒන් මම කීවෙමි.

"මාත් එක්ක ගිවිස කියල අමුතු දෙයක් වෙන්නෙ නෑ මොකද කියන්නෙ. ගනුදෙනුවට එකඟද?"

"ඔව්... හැබැයි එකදෙයක් තියෙනව..."

"මොකක්ද?"

"මම ඉන්නෙ ශානුක අරනාගෙ ගෙදරට ගියාට පස්සෙ. ඒවගේම අරනාගෙ ගෙදර ඉඳන් ශානුකයි... අරනායි දෙන්නම මට කෝල් කරන්න ඕන."

"ඒක මහ දෙයක්ද? ඔය එන්නෙ කෝල් එක..."

භූපති වහා තම දුරකතනය කණෙහි රුවා ගත්තේය.

"ඔව්... අරනාගෙ ගෙදරද? මං ගැන මුකුත්ම කියන්න එපා. ඔය ෆෝන් එක දෙනව ශානුකට."





භූපති කීවේය. මගේ පපුව තදින් ගැහිනි.

"ආ මෙන්න මහත්තයා එක්ක කතා කරන්න."

මම වහා දුරකතනය ගත්තෙමි.

"හෙලෝ..."

"ශානු"

"ආයු... මගේ ආයු..."

"ඔයා හොඳින් නේද ශානු"

"ඔව් කෙල්ලෙ ඔයා කොහෙද?"

"මං දුන් එනවා. අරනා ඉන්නවද?"

"අරනා"

"ඔව්"

"අරනාව අහනව..."

ශානුක කාටද කීවේය.

"හෙලෝ ඔයා දුන් කොහෙද කියන්න ආයු..."

ඒ අරනාය.

"මං එනවා. හැමදේම විසඳගෙන"

"ඔයා එහෙම කෙනෙක් වෙන්න එපා. ඔයා ඉන්නෙ කා එක්කද කියල මං දන්නවා."



http://e-pusthakalaya.blogspot.com

මම දුරකතනය විසන්ධි කළෙමි.

"දූන් හරිද?"

"හරි..."

"එහෙනං යං..."

හුපති මගේ කරට අත දමා ගත්තේය. අවංකවම හුපති ජීවත් විය යුතු කෙනෙකු නොවේ. හුපති ඇමතිවරයකු කාලයේ ඔහුට තිබුනේ මිනීමරුම් චෝදනා පමණක් නොවේ. ඔහු සල්ලාලයෙකි. සොඳුරු ගැහැනියක දුටුවොත් ඔහු ඒ ගැහැනිය තමන් යටතට ගත්තේය. බාල වයස් දැරියන් පවා දූෂණය කළා යැයි ඔහුට චෝදනා තිබිණි. වියපත් විද ඔහුගේ ලිංගික ආශාවන් සුළු පටු ඒවා වූයේ නැතැයි ශානුක එක්තරා ලිපියක ලියා තිබිණි.

"මං ඕන තරං ගෑනු එක්ක නිදාගෙන තියෙනවා. ඒත් මං දැක්ක ලස්සනම ගෑනි ඔයා... ආයු. ශානුක වගේ වැඩකට නැති මිනිහෙක් එක්ක ඉන්නෙ. මං එක්ක ඉන්න හැම සැපම දෙන්නං."

මම කතා නොකළෙමි. තරුණ කතා බහ මිස ඔහු ළඟ තරුණකම තිබුණේ නැත. පිරිමියෙකුට ආදරේ කරන්නේත් තව පිරිමියෙකුව අප්පිරියා කරන්නත් පිළිකුල් කරන්නත් ගැහැනියක පෙළඹෙන හැටි අපූරුය.

"මොනවද කල්පනා කරන්නෙ. එන්න මගෙ කෙල්ලෙ..."

තවත් බලා ඉන්න බැරිය. මම ගවොමේ සාක්කුවේ සඟවා උන් රිවොල්වරය පෑවෙමි.





"ඕක අහකට ගන්න. මං මැරෙයි..."

"ඔව් තමුසෙ මැරෙනවා තමයි"

"ආයු..."

"දුව කියපං... උඹ දන්නවද උඹෙයි මගෙයි වයස"

මම කෑගැවෙමි.

"අනේ දුවේ මට සමාවෙන්න..."

මම ඉලක්කය ගත්තෙමි. හුපති වාගේ තිරිසන් මිනිසුන්ට මරණ දණ්ඩනය ක්‍රියාත්මක විය යුතුය. නොවේ නම් ගල් ගසා මරන්නට උවමනාය.

"මං ශානුකව නිදහස් කළානෙ..."

ඔහු එහෙම කියද්දී මම කැසට් රෙකෝඩරයට සියල්ල පටිගත කර ගත්තෙමි.

"තමුසෙ ශානුකව කොච්චර කල් හංගගෙන හිටියද?"

"මං පිලිගන්නවා දුවේ. මං එහෙම කළා. මං අපරාධ කළා. දුවගෙ ජීවිතේ විනාශ කළා..."

"තමුසෙ චන්ඩියෙක් දම්මලා මාව දූෂණය කළා. ඇයි කියන් නැත්තෙ..."

"ඔව් මං එහෙම කළා. ශානුකගෙන් පළිගන්නයි ඕන වුණේ..."

http://e-pusthakalaya.blogspot.com

ඔහු දිගින් දිගටම කල කී දේ කීවේය. මම ඔහුගේ දෙපාත් දෙඅතුත් ඇදේ කකුල් වලට තබා බැන්දෙමි. ඊළඟට ඔහුගේ දුරකතනය ඔහුට හසුනොවන තැනකින් තැබුවෙමි.

"අර අවුරුදු දහතුනක මලී කුමාරිව දූෂණය කළෙත් තමුසෙ නේද?"

භූපති කතා කළේ නැත.

"ඇයි කියන්න බැරිද?"

මම වෙඩි තියන්නට වාගේ හැදුවෙමි.

"ඔව් ඔව් මමයි කළේ... මං මහා අපරාධකාරයෙක්..."

තවත් ඔහු යමක් කියන්න කලින් මම එතනින් පිටවීමි. කෙලින්ම ත්‍රීරෝද රියක නැග අරන්‍යගේ නිවස වෙත ආවෙමි. ශානුක දකින තුරු ඉස්පාසුවක් නොවූයේය. ත්‍රීරෝද රියෙන් බැස මම දිව ආවෙමි. ශානුකත් අරන්‍යත් දෙදෙනාම සාලයේ හිඳගෙන උන්හ.

"ආයු..."

ශානුකගේ ඇස්වලින් කඳුළු කඩා වැටෙයි. මම ඔහු වෙතට දුව ගොස් ඔහුට තුරුළු වී හඬන්න වූයෙමි.

"අඬන්න එපා. සේරම මං දන්නවා... මං ඉන්නවා ආයු..."

මේ තරම් ආදරයෙන් එදවස ඔහු හැසිරුණේ නැත.

"මට කියන්න ආයු..."





"මුකුත් කියන්න කලින් අපි පොලීසියට යමු..."

"ඒත්..."

"යං භූපති හැමදේම පාපොච්චාරනය කරල ඉවරයි..."

මම සිදුවූ සියලු දේත් කැසට් රෙකෝඩරයත් ශානුක අත තැබුවෙමි.

"ඔයා ඉන්න ආයු... මං පොලීසියට යන්නං..."

ශානුක කීවේය.

"මගෙ වාහනේ යන්න..."

අරන්‍ය කීවේය. දරුවන් හඬන හඬ ඇසී මම කාමරයට ගියෙමි. අරන්‍යද මා පිටුපසින් ආවේය. ඒ ඇස්වල කඳුළුය. මහා වේදනාවකින් ඔහු මදෙස බලා උන්නේය. මම දරුවන්ට කිරි දුන්නෙමි.

අපට අපගැන කතා කරනවාට වඩා අප කළයුතු අත්‍යවශ්‍යම රාජකාරී කීපයක් තිබිණි. පොලීසිය විසින් භූපති සූරිය පෙරුම අත්අඩංගුවට ගෙන තිබිණි.

"ශානුකව හිර කරල මං විතරක් නෙමේ. මං දඬුවම් විඳිනව නං ඔය තව ඇමති පුටුවල ඉන්න උනුත් මේකට වගකියන්න ඕන."

ඔහු උසාවිය ඉදිරියේ තම වැරදි පිළිගත්තා විතර නොවේ. පාපොච්චාරණයද කළේය.



http://e-pusthakalaya.blogspot.com

ඉතිං සියල්ල අවසන්......

හුපති ගිරේ......

ශානුක මං ළඟ...

සතුටුද...?

මං මගෙන් අහනවා. මට පේන්නෙ හිනාවෙන... අඬන මගෙ අහිංසක දරුවො...



## 11

අලුතින්ම ජීවිතය පටන් ගත යුතුව තිබිණි. ඒත් එය අරඹන්නේ කොහේ කොහොම කා සමගද කියා මට තේරුණේ නැත. ශානුක මගේ සැමියාය, අරනය මගේ දරුවන්ගේ තාත්තාය. මා වැඩි තැන දෙන්නේ කාටද? මගේ ජීවිතය භාර දෙන්නේ කාටද?.

"මං නිසා ඔයාට වුණු දේවල් ගැන දුකයි...උන් මාව අවුරුදු දෙකක් හිරකරගෙන හිටියා... මං ඒ කාලෙදි ජීවිතේ ඉගෙන ගත්තා. මං ඔයාට ආදරේ කළේ නෑ නේද කියල හිතුණා. මට ඔයා නැතුව පාලුයි... ඔයා නැතුව ජීවත් වෙනව කියන්නෙ මොනතරන් අමාරු දෙයක්ද කියල හිතුණා. මං ආයෙ පත්තර කාරයෙක් වෙන්නෙ නෑ."

"ඔයා මේ රටට සේවය කරන්න ඕන..."

http://e-pusthakalaya.blogspot.com

"නැහැ ආයු. මේ රට ගැන මං කළකිරුණා. කවදාවත් කුරා කුඹියෙකුට වරදක් නොකළ මගෙ ගෑනිට මාධ්‍ය මඩ ගැහුවා. අපහාස කළා. ඒව විඳව ගන්න බැරුව ඔයාගෙ අම්මයි තාත්තයි මැරුණා."

ශානුක දෙස මම බලා උන්නෙමි. ඔහු පරිනත වී තිබේ. ඒ දෑස්වල ඉස්සර තිබුණු තියුණු බව වෙනුවට දැන් සංවේදී කමක් පිහිටයි. ඔහු ජීවිතය තේරුම් ගත්තාද? කළකිරුණාද?

"මාව අතුරුදන් වුණාට මාව හොයාගන්න තනි සටන කළෙ ආයු. මගෙ වයිෆ්. මට මාධ්‍යට කියන්න තියෙන්නෙ එච්චරයි. මාධ්‍ය වේදියෙක් වුණු මට, මං නැතිවුණු වෙලාවෙ මගෙ වයිෆ්ට මුහුණ දෙන්න වුණු අති අමානුෂීය මඩ හිංසා ගැන දුකක් නෙමේ තියෙන්නේ. මං මාධ්‍ය ජීවිතයෙන් සමුගන්නව. ඒ ගැන මං කලකිරුණා."

ශානුක මාධ්‍ය වෙත තම අදහස් දක්වූයේය.

සැමියා බේරාගත් දිරිය බිරිඳ යනුවෙන් පුවත් පත්වල මා ගැන පලවුණි. මේ තිරිසන් දූෂණය කළ භූපතිගේ පුතා අත්අඩංගුවට නොගන්නේ ඇයි.

"ඔව්..."

"පළවෙනි වතාවට මං මාධ්‍යට කතා කරන්න කැමතියි. මං කිසිම දේශපාලනයකට අයිති නෑ. කිසිම දේශපාලන පාක්ෂිකයෙක් නෙමේ මං. ඒ වගේම මං මාධ්‍යවේදියෙක්වත්, මාධ්‍යවේදියෙක් එක්ක සම්බන්ධයක්වත් මට නෑ. මගේ සැමියා





මාධ්‍යවේදියෙක් උනත්. මං එයාව මාධ්‍යවේදියෙක් විදිහට දැක්කෙ නෑ. එයා මගෙ සැමියා කියලයි හිතුවෙ..."

"ඔව්... අරනාය... වැරදි වැටහීමක් මත මාව දූෂණය කළා. ඒ භූපති ඇමති තුමා තමයි තමන්ගෙ දරුවව ඒකට පෙළඹෙව්වෙ. මං මුලදී අරනායට වෛර කළා. ඊත් දේශපාලනය. දේශපාලනකයො, මාධ්‍ය වේදීන් සියළු මාධ්‍ය මාව පාරට ඇදල දාද්දී, කොටින්ම මාව වදාපු හදාපු දෙමාපියන් මාව පිළිනොගද්දී, මට වෛර කරද්දී, මාව පිළිගත්තෙ අරනාය. මට මගෙ සැමියාව සොයා ගන්න පුලුවන් වුනේ මං ජීවත් වුනු නිසා. මං ජීවත් වුනේ අරනාය නිසා. ඒ නිසා එයාට දඬුවම් දෙනවට මං කැමති නෑ. එයාට එයා කළ වැරද්දට දඬුවම් ලැබෙනව. ඒ නීතියෙන් නෙමෙයි. එයාට දඬුවම් දෙන්නෙ මමයි."

මම මාධ්‍ය වෙත මගේ අදහස් දැක්වීමි. ඇස්වලින් හෝ ගා කඳුළු වැටිණි. වසර ගණනක් තිස්සේ වසන් කරගෙන උන් කඳුළු දෝරේ ගලා ගියේය.

"ආයු..."

ශානුක මා තුරුලු කරගත්තේ ආදරයෙනි.

"ඔයා තීරණය කරන්න. ඔයා මොනව කිව්වත් මේ දරුවො දෙන්න අරනායගෙ දරුවො දෙන්න. අරනායගෙන් උදුර ගන්න බෑ. ඔයා තීරණය කරන්න ඔයා මේ දරුවො එක්ක සතුටින් ඉන්නවද නැත්නම්."

ශානුක කීවේ කියවෙන්න ගිය දෙයින් භාගයකි. අරනාය පසෙක බලා හිඳී.



http://e-pusthakalaya.blogspot.com

"සිද්ද වුණු කිසිදෙයක් සිද්ද වුණේ නෑ කියල මං හිත හදාගන්නව. ඔයා සතුටෙන් ජීවත් වෙන්න කොහේ හිටියත්.

"ශානුක මං ආදරේ කළේ ඔයාට විතරයි..."

"ආයු... ඔයා ගත්ත තීරණේ ගැන පසුතැවෙන්න එපා. මේ දරුවන්ට ඔයා ඕන. මගෙ තීරණේ ලංකාවෙන් යන්න."

"ඔයා යන තැනක මාත් එනවා..."

එය මගේ තීරණය විය. අරනා පෙනෙන්න උන්නේ නැත. සියල්ල අසා හිඳ ඔහු යන්න ඇත. මම දරුවන් සොයා ගියෙමි. අරනා ඉකි බිඳ බිඳ හඬමින් උන්නේය.

"මේකද මට දඬුවම..."

අරනා ඇසුවේ මගෙනි. දිය යුතු හෝ දිය හැකි පිළිතුරක් නැත. මම ආයාසයෙන් දරා ගෙන දරුවන් දෙස බලා උන්නෙමි.

"මේ දෙන්න මට දුන්නට පින්... ඒත්... මං ඔයාට හුගක් ආදරෙයි..."

අරනා කීවේය.

"ඔයා නැතුව ජීවත් වෙන්න මටත් බෑ ආයු..."

ඒ සියලු කතා ඇසුනත් මම මගේ තීරණය ගත්තෙමි.

ශානුක මා ඔහුගේ දෙමාපියන් වෙත රැගෙන ගියේය.

"අපට සමාවෙන්න පුතේ..."



http://e-pusthakalaya.blogspot.com



ශානුකගේ දෙමාපියන් කීහ. මම ඔවුන්ගේ දෙපා නැමැද්දෙමි. ඒද හිත කකියයි. මේ තරම් පසුව පිළිවෙන්නේ ඇයි...?

මම ගෙදර ආපසු කැඩපතට එබුනෙමි.

"සතුටුද?"

"ඔව්..."

"නෑ... ඔයා හිටියටත් වැඩි දුකින්..."

මම කතා නොකළෙමි.

"අරනාට ආදරෙයි නේද?"

මම ඒත් කතා නොකළෙමි. ශානුක ඔයා නැති වුනත් ජීවිතේ හදා ගනී. ඒත් අරනාටයි පොඩි උන්ටයි ඔයාව ඕන.

"මං තීරණේ අරන් ඉවරයි.:."

මම කැඩපතින් සමුගත්තෙමි. ආයේ කවදාවත්ම කැඩපතට මා අමතන්න අවස්ථාවක් නොදෙන්නෙමි.

"කොහේ යන්නෙද
කොහේ ඉන්නෙද
ඔබත් ඇසුවා මගෙන්
මමත් ඇසුවා ඔබෙන්"

මමත් ශානුකත් පිටරට ගමනට සූදානම් වී උන්නෙමු. දරුවන් ඉදිරියේ හඬා වැටෙන්නේ නැතිව ඉන්නට බැරි විය.

"තාමත් වෙලාව තියෙනවා. මං තරහ නෑ. මානුෂීය පැත්තක් තියෙනවා. දරුවන්ට ඔයා ඕන"

"මගෙ තීරණේ වෙනසක් නෑ..."

මම ගානුකගේ අතක එල්ලී දරුවන්ගෙන් ඉවත් වීමි.

"ආයු..."

අරනාථ කතා කලේය.

"මට සමාවෙන්න..."

මම කිසිවක්ම නොකීවෙමි. අරනාථ ගානුක ගැනවත් නොසිතා මා තුරුලු කරගත්තේය. ඉතිරි වූයේ වේදනාවය. ජීවිතය පුරා විඳවන්නට වන්නේය. ඒත් කළ හැකි දෙයක් හෝ කළ යුතු දෙයක් නොවේ.

"තව සැරයක් හිතන්න... මට පාලුයි... මට කවුරුත් නෑ... ඔයා ඇරෙන්න කවුරුවත්ම නෑ..."

අරනාථ කීවේය.

"මට ජීවත්වෙන්න ඕන ගානුක එක්ක. සමාවෙන්න අරනාථ..."

අරනාථ කරබා ගත්තේය. සියල්ල හොඳිනි. ඒත් සුදු හා පැටව් වාගේ හිනැහෙන දරුවන් දකිද්දී මහා වේදනාවක් දුනේ. මෙතරම් රළු අම්මා කෙනෙකු වන්නේ කොහොමද? දරු දෙන්නා නැතිව ජීවත් වෙන හෙට දවසක් ගැන හිතන්නටවත් බැරිය. ඒත්



http://e-pusthakalaya.blogspot.com



දරු දෙන්නා අරනාථගෙන් ඉල්ලා සිටින්නටත් බැරිය. ඔහු තවත් තනි කිරීම, ඔහු තවත් තනි වීම දරා ගන්නටත් බැරිය.

"මං හිතන්නේ භුපතිට ජීවිත කාලෙටම හිරේ ඉන්න වෙයි...."

"ඔච් කරල තියෙන ඒව සේරම එළි උනානෙ. ඔයා නිසයි සේරම එළිවුණේ. මගෙ වයිෆ්ට මෙච්චර ලොකු මොලයක් තියෙනව කියල මං දන්නැතෙ."

ගානුක හිනැහිණි. මම ද හිනහුනෙමි. අපි සිනාසුනෙමු. ඒත් මේ හිනාවේ අරුථය කුමක්ද? අප හිනා වන්නේ හදවතින්මද? මම හදවත ඇතුලාන්තයට අතු පතු ගා පිරිසිදු කරමි. මේ දවස් කීපයේ අප උන්නේ අරනාථගේ නිවසේය. මමත් දරුදෙදෙනාත් පුරුදු විදිහට එක කාමරයකද, අරනාථ ඔහුගේ කාමරයේද, ගානුක තවත් කාමරයකද රැය ගත කලෙමු. ඒත අපේ හදවත් වල කෙබඳු දුකක් ඒ රෑ පුරා හැඟෙන්නට ඇත්ද?. මා යා යුත්තේ කුමන කාමරයටද? මගේ අයිතිකරුවා කවුද? මට වාගේම මේ ප්‍රශ්නය ඔවුන්ටත් ඇති බව මම දන උන්නෙමි. ගානුක එක්ක ආයේ තිබුද විදිහට ජීවත්වීම ලේසිද? සිදුවූ සියලු දේ සිදු නොවූ සේ නොසලකා හරින්නට පුළුවන්ද?. මම රැය පුරා කඳුළු නොසැලුවෙම්ද?...

"ආයු..."

උදෑසනක අරනාථ මා වෙත ආවේය.

"කියන්න..."

"දරුවො දෙන්නත් එක්ක අපි පන්සලට ගිහින් එමුද?"

දූවිල්ලකින්වත් අපවිත්‍ර වන්නට නොදී ආරක්ෂා කළා නොවේද.... ඒ පවිත්‍රත්වය කෙළෙසුවාවූ දේශපාලනයයි. ඒ පවිත්‍ර දෝණිව අවමන් අපහාස ගෙනාවූ දේශපාලනයට සාප වේවායි කියා නොකියන්නේ කොහොමද?. මගේ අහිංසක දෙමාපියන්ගේ ජීවිත උදුරා ගත්තේ මේ දේශපාලනයයි කියා නොහිතා ඉන්නේ කොහොමද?.

"ආයු"

අරනා කතා කරයි. මම කතා නොකළෙමි. මම සක්මන් කරමින් භාවනා කළෙමි. මේ කුමන භාවනාවක්ද? අනාපාන සති භාවනාව නොවේ. මා ගත් හුස්මක් නැත.... මෛත්‍රී භාවනාව නොවේ. සියලු සත්වයින්ට මෛත්‍රී කරන්නට මට මේ වෙලාවේ ලෙහෙස වූයේ නැත. මම හයියෙන් හඬන්න ගත්තෙමි. බොහෝ කල් හදවතේ වූ වේදනාව දඩස් ගා අත්හළෙමි. විලාප දී හැඬුවෙමි.

"ආයු...."

"ආයු......."

"දූවේ...."

"සුදු නෝනේ...."

ගැහැනියක සතු සියලුම අයිතීන් ගැහැනියක සතු සියලුම ශක්තීන් දෝලනය වූ ගැහැනු හිත එක් නිමේශයකදී මෙහෙම කඩා බිඳ වැටීම අරුමයක්ද?. මම හිසකෙසින් ඇදගෙන බිම ඇද වැටුනෙමි. කුසෙහි හුන් දරුවන් වේගයෙන් සැලෙනවා.... හඬාවැටෙනවා මට දනිණි. ඇඳ යට වූ විසල් කැත්ත මට හසුවිය.



http://e-pusthakalaya.blogspot.com



"අම්මේ.... අපේ අයිතිය...." එතකොට ඔවුන් මගෙන් විමසනවා මට ඇසිණි.

"අම්මේ අපට අයිතියක් නැද්ද?"

මේ ලෝකය දකින්න....

මේ ජීවිතය ගෙනියන්න.

මා අතින් කැත්ත බිම අතෑරුනා නොවේ. මා එයින් බිමට.. සුදු ටයිල් කල බිමට එක දිගට ගැසුවෙමි.

"ආයු.... මගෙ ආයු...."

"රත්තරන් දුවේ.... දොර ඇරපං...."

නොවේ.... යටිගිරියෙන් කෑගසා හඬමින් මම බිම ඇද වැටුනෙමි. මගේ දරුවන් දේශපාලනයේ දූෂනයෙන් උපදිනා වුං හෙට ලෝකය ඉදිරියට යන්නා වූ මගේ දරුවන් මරා දමන්නට.... දේශපාලනය නොකල මේ අම්මාට.... අම්මා කෙනෙකු වූ මේ අම්මාට නොහැකි හින්දා මම කැත්ත අත්හළෙමි.

ඒත් පපුවෙන් නැගෙන අදෝනාව....

ආත්මය නගන අදෝනාව....

ඔය දූෂණයේ දරුවන්....

ඔය දේශපාලන දූෂිත කාලේ ප්‍රතිඵලයක්....

ඇදල දාපන් බොටුවෙන්....

පෙන්නපන් භූපති වගේ අධමයන්ට මං වාල් නොවුනු බව....

කාලය පැමිණෙන තුරු බලා හිටියා විතරයි. දේශපාලනය නොදන්නා පාලකයෙකුගේ අත කොලුවක් නොවුනු බව.

"ඉපන්නපං...."

මං වැනසුවා මේ දූෂණය....භීෂණය

අතුරුදහන්වූ ගාත්‍රක වෙනුවෙන් ගාත්‍රකගේ බිරිඳට....

ජයවේවා..........

විපක්ෂයේ ලකුණු.... පැසසුම් එපාද?.

"අම්මේ."

කුසින් නැගෙනා ඒ මියුරු සංගීතයක් වන් හඬ....

"බේරුවට පිං අපේ ජීවිත.... අම්මේ පිං...."

මම මගේ කුස වැළඳගෙන බිම පොළොවේ දිගා වූයෙමි. එකදිගට දොරට ගසන හඬ.... දෙඅත්... දෙපා වෙව්ලන හඬ... දරුවන් දඩිං බිඩිං ගා කුසට පා තබා දඟලන හඬ, මේ සියලු හඬවල්...

මහා ශක්තියක් වී... රේසින් කාරයක් වාගේ... අධික වේගයකදී පවා ස්ථායිතාවය බිඳ නොවැටී පවත්වාගෙන යන රේසින් කාරයක් වගේ මම ඉදිරියට ඇදියෙමි...





වසර දහස් ගණනකට ඉහතදී මිනිසා ශක්තිය ලබා ගැනීම සඳහා ජලය භාවිතා කරන ලදී. ගලායන ජලයට උදම් ශක්තිය... මුහුදු රළ ශක්තිය වන්නට තරම් හැකියාවක්... ප්‍රබල ශක්තියක් වන්ට හැකිනම්. මව් කිරෙහි කෙතරම් ප්‍රබල ශක්තියක් තිබෙන්නට පුළුවනිද? සියලු ජීවීන්ගේ පැවැත්ම ආරම්භය මව් කිරිය. මම එවන් ශක්තියක් සොයායන මගේ නිවුන්දරු දෙදෙනා එක්ක ආලෝක ශක්තිය නැති ගමන් මඟක ඇවිදගෙන ගියෙමි.

"ආයු..."

"ආයු..."

"මගේ රත්තරන්..."

මම ඇස් හැර ඉතිං බැලුවෙමි. සියල්ල නොදින්ද?

කුස හිස්ය... වහා කුසට අත තබා බියවී මම නැගී උන්නෙමි.

"දරුවො..."

"පුතයි... දුවයි... ඉන්න අරන් එනකන්."

හෙදිය හිනහුනාය. අරනඃ රතුපාට වී හිදියි. ඒ නෙත් සෙනෙහසින් උතුරා යයි. මා ඉපදුණු විට මගේ තාත්තාගේ ඇසුත් එහොම වන්ට ඇත.

දෙන්නම හොඳ බර... සීසර්වත් නොකර ගන්න පුළුවන් වුණා."



http://e-pusthakalaya.blogspot.com

වෛද්‍යවරිය අප වෙත ආවේ ඉන්පසුවය. පුංචි ඇස් පියවා ගත් අයිය නගෝ මා ඉදිරියේය. මට සෙනෙහසින් මා උතුරා නොගියෙම්ද? මම වහා දරුදෙදෙනා උදුරා ගත්තෙමි.

"කිරි දෙන්න..."

වෛද්‍යවරිය මගේ හිස අත ගෑවාය.

"මං හොඳින්..."

මම දරුවන්ට කිරි දුන්නෙමි. රෝස පාට දෙතොල් උල් කර, කිරි බී දරුවන් ළදරු ඇඳෙහි තැබුවේ හෙදියයි. ඇයත් රෝහල් කාමරයෙන් ඉවත්ව ගිය පසු මමත් අරනාත් විතරක් තනි වූයෙමු......

"ආයු..."

කී අරනාථ ඉකිබිඳ බිඳ හඬන්න වූයේය. මම තිගැස්සී බලා උන්නෙමි. මගේ දෙපා තදට අල්ලාගෙන අරනාථ පොඩි දරුවකු වාගේ හඬන්න වූයේය.

"මට වැඳල සමාව ගන්න ඕන මගෙ දරුවන්ගෙ අම්මගෙන්. මට ටිකක් ඉඩදෙන්න..."

මට දෙපා අදින්න ඉඩ ලැබුණේ නැත. ඔහු මගේ දෙපා වැඳ බදා හඬන්න වූයේය.

"මං මං හිතුවෙ සේරම ඉවර වුණා කියල... මේ පවුකාරයට සමාව දෙන්න. මම එදා ඒ ඔයාට කරදර කරද්දි ඔයා වෙව්ල වෙව්ල... ගැහි ගැහී ඇඬපු හැටි මතක්වුණා... ඔය අත්දෙකෙන්





මාව මරල දාන්න ආයු... ඒත් මගෙ දරුවෙ දෙන්න... ඒ ඔයාගෙ දරුවො... ඔයා තමයි මේ ලෝකෙ හොඳම අම්ම...."

"හොඳම..."

මම මගේ දරුවන් දෙස බැලුවෙමි.

"ඔයා බෙහෙත් බිව්වට මං හිතුවෙ මගෙ දරුවො විරූපි වෙයි කියල ඒ කොහොම උනත් මං මගෙ දරුවො භාර ගන්න හිතාගෙනයි හිටියෙ. මගේ මුළු ජීවිතේම ඔයයි. දරුවොයි."

අරනාථ හඬයි... මගේ හිත විලාප දෙයි... මම මේ අහිංසක අසරණ දරුවන් මරා දමන්නට බී බෙහෙත්... දෙවියනි එදා කැප්න කුස ළගදි හතර නොවුනා නම්... මම වහා යහනින් බැස්සෙමි.

"එපා... ඔයාට අමාරුයි..."

අරනාථ එපා කියද්දීත් මම යහනින් බැස දරුවන් ළඟට ගියෙමි. මගේ පුතා... මගේ දෝණී... මම දෑතින්ම මගේ දරුවන් වඩා ගත්තෙමි.

"වැටෙයි..."

අරනාථ ද දරුදෙදෙනාට අත තැබුවේය. මට දරුවන්ගේ මුහුණු බලන්න ශක්තියක් වූයේ නැත.

"දන්නවද ආයු... භූපති ඇමතිතුමා මේ සැරේ ඡන්දෙන් පරාදයි..."

අරනාථ කීවේය. මම වහා අරනාථ දෙස බැලුවෙමි. දරුවන් යහනේ තබා මගේ යහනට වීමි.



http://e-pusthakalaya.blogspot.com

"පරාදයි..."

"ඔව්... කියා අරනාගයට හැරෙන්නට ඉඩ ලැබුණේ නැත. කාමරයේ දොර හැරීනි. භූපති ඇමති නොවේ... නිකම්ම නිකම් භූපති කාමරයට ඇතුලු විය. මුහුණේ ලේ බිඳක් වූයේ නැත.

"ඇයි..."

ඇසුවේ අරනාගය.

"ඇයි... ඇයි..." කී භූපති වහා මගේ දිග කොණ්ඩයෙන් අල්ලා මා යහනෙන් බිමට දැම්මේ අරනාගයට හිතන්නවත් නොතබාය.

"ඒයි... ගා අරනාග මැදට පැන්නත් භූපතිගේ ආරක්ෂකයින් අරනාගයටත් මටත් තුවක්කු දිගු කලේය.

"පර... පාහර බැල්ලි... මං පරාද වුණේ තෝ නිසා... අහපිය... උඹ... මගෙ පුතාගෙන් අයින් වෙලා යන්න ඕන... දරුවෝ දෙන්නව දාල යන්න ඕන... නැත්නං උඹව මරල හංගනව තෝරුනාද?"

"මං ආයුව කසාද බඳිනව..."

අරනාග කෑ ගැසුවේය.

"ඒක කලින් කරපං කිව්වා. මේකිට ඕන උනේ මාව නැති කරන්න. දැන් මං මේකිව නැති කරනව."

"අහපිය... උඹේ මිනිහා මට විරුද්ධව වැඩ කළ නිසයි මං ඌව අතුරුදන් කලේ. හැබැයි මගෙ හොඳ කමට මං ඌව මැරුවේ





නෑ. ඌ තවමත් ජීවත් වෙනව. ඉතිං උඹට ඌ ඉද්දි මගෙ පුතාව බඳින්න පුළුවන්ද?"

"ඔය බොරු ආයු..."

අරනාග කෑගැසුවේය.

"බොරු... බොරු නෙමේ... එහෙනං බැඳපන්... එදාට මං ගානුකව එවනව උඹලගෙ කසාදෙ බලන්න."

භූපති මගේ ගෙල අතැර යන්න ගියේය. රෝහල් කාර්යය මණ්ඩලය බියවී බලා උන්නා විතරය. අප ජීවත් වන්නේ මෙවන් සමාජයකය. මෙවන් රටකය. අප අපේ ඡන්දයෙන් පාලකයන් පත් කරන්නේ මෙවන් අනාගතයක් දකින්නටද?.



http://e-pusthakalaya.blogspot.com
The Spirit of Sri Lankan e-community

10

මගේ මුහුණේ හසරැලුත් තිබිණි. දුකත් තිබිණි. සතුටට කාරණානම් ශානුකගේ ජීවත් වීමය. භූපතිගේ ඇත්තත් බොරුවත් මට දූන් ඔහුගේ මුහුණෙන් හිතා ගන්නට පුළුවන. ශානුක අනිවාර්යයෙන්ම ජීවත්වන බව විශ්වාසය. එය මගේ හසරැලිවලට හේතුවයි. දුකට කරුණ වූයේ... මගේ දරුවන් මට අත්හරින්නට වීමයි.

"ආයු..."

අරන්‍ය 'ආයු' කියා මගේ නම කීවරක් කීවේද? මම නැසුකණ්ව උන්නෙමි. දරුවන්ට නම් දම්මේ අරන්‍යය. එය අගට අරන්‍ය ඔහුගේ වාසගම යෙදුවේය. මම හැඟීම් ගොන්නක් එකතු කරගෙන මගේ දරුවන් දෙස බලා උන්නෙමි.

"තීරණ ගන්න පුළුවන්... මේ දූත් ගැන හිතල සතුටින් ඉන්න"





අරන්‍ය කීවේය. එය සත්‍යයක් සේ සලකා මම දරුවන්ට කිරි දුන්නෙමි. ජීවිතයේ සියලු යසඉසුරු අම්මාගේ තනය යැයි සිතා වාගේ දරුවන් මාරුවට කිරි උරයි. අම්මාට වැඩියෙන් කිසි දිනෙක තාත්තාට නම් දරුවන්ට ආදරේ කරන්න බැහැ යැයි මට හිතුණේ දූන්ය. ඒත් අරන්‍ය ගැන කියනවානම් මා දුටු හොඳම පිරිමියා ඔහු යැයි කියා කියන්නට තිබිණි. ඔහු දේශපාලන අතකොළුවක් වී මගේ ජීවිතය විනාශ නොකලා නම්...

එතරම්ම සංවේදී පිරිමියකු අතින් ඒවගේ බරපතල වරදක් වීම මට විශ්වාස කළ නොහැකි තරම්ය. ගැහැනියකගේ ගෙට ඇතුළු වී ඈ දූෂණය කරන්නට පෙළඹීමත් සාමාන්‍ය තරුණයෙකුට කළ හැකිද?. කිසිදා වෙනත් ගැහැනියක ළඟට නොගිය වෙනත් ගැහැනියක ඇසුරු නොකළ අරන්‍ය වාගේ තරුණයෙකු එතරම් විසල් වරදකට සම්බන්ධවීම ඔහුගේ වරදක්ද?. නොවේ නම් එයත් දේශපාලනයේ මහා ගැටයක්ද? මට තේරුම් ගන්න බැරිය. අරන්‍ය ගැන මා දන්නා අබැටක තරම් දේවිද ඔහු ඇසුරේ ගෙවූ ජීවිතයට ජීවිතයක් කියන්න පුළුවන් කමක් නැති මගේත් දරුවන්ගේත් සියලු ඕනෑ එපාකම් සොයා බැලුවේ ඔහුය. එය මහා සතුටක් ලෙස සලසා නොවේ නම් ඔහු එය කළේ මා බිරිඳ හැටියටත් දරුවන් ඔහුගේ දරුවන් හැටියටත් සලකාය.

"භූපති කිව්වෙ ඇත්ත වෙන්න බෑ ආයු..."

අරන්‍ය එක් හැන්දෑ වරුවක කීවේය. මම අරන්‍යගේ මුහුණ බලා උන්නෙමි.

"ඒක ඇත්තක්..."



http://e-pusthakalaya.blogspot.com

මම කීවෙමි. අරනා වහා ඇස් ඔසවා මදෙස බැලුවේය.

''භූපති කියන ඇත්තයි බොරුවයි මට තේරුම් ගන්න පුළුවන්. ශාතුක ජීවත් වෙනවා... මට එයාව කොහොම හරි ගෙනත් දෙන්න...''

මම කීවෙමි. අරනාගේ ඇස් තෙත්වනවා මම දුටුවෙමි. එත් මේ වෙලාවේ වැදගත් වූයේ ශාතුක දැකීමයි.

''බලමු...''

''ඇයි බලමු කියන්නෙ... කොහොම හරි මට ශාතුක ඕනෙ. එයා කොහේ හරි ඉන්නවා. ඒක ඔයාගෙ තාත්තා දන්නවා... මට ශාතුකව ඕනෙ අරනා. ඔයා කරපු පව් හෝද ගන්නද ඕනෙ. ඒ පවෙන් නිදහස් වෙන්නද ඕනෙ... එහෙනං මට එයාව ගෙනත් දෙන්න...''

මම කියවාගෙන ගියෙමි. අරනා 'හා' 'හ්ම්' නොකීවේය. එය කෙතරම් අපහසු දැයි... අමාරුදැයි මා නොදන උන්නා නොවේ... ඒත් අරනා හැකි හැම උත්සාහයක්ම ගනීවියැයි මට සිතිණි. මම සුරතල් දරුපැටව් දෙන්නා දෙස බලා උන්නෙමි. මේ දරුවන්ගේ හෙට දවස ගැන හදවතේ කඳුලක් නැතිද? නැවත ශාතුක මා ඉදිරිට පැමිණි විට මා ගන්නා තීරණය කුමක්ද? ඔහු මගේ විවාහක සැමියාය. හදවතින් ම මම ඔහු සමග යමි. ඔහු දකීමත් මට සතුටකි.

ඒත් ඔහු ජීවත් වනවා මිස ඉන් එහා කිසිම තොරතුරක් මා දන්නේ නැත. මා නීතියේ පිළිසරණ නොපතන්නේ ඇයි? නොවේ එවිට ශාතුකට ජීවත්වීමේ අයිතියත් නැතිව යනු ඇත. භූපති ඔහු මරා සඟවා දමනු ඇත. නොවේ... කෙසේ හෝ ශාතුක ජීවත් කර ගත යුතුය. මා මෙතරම් කල් ජීවත් වූයේ ඔහු ජීවත් කරනු වස්ය. නින්දා අපහාස, අවමාන ලැබුවේ ඔහු වෙනුවෙන්ය. සියලු දේ කලේ ඔහු වෙනුවෙන්ය. ඒත් සියලු දේ ඔහු වෙනුවෙන් කළද ඔහු පැමිණි කළ ඔහු මා පිළිගනීවිද?. ලෝකයා වාගේ ඔහුද මා නාන්නත්තාරේ ගිය ගැහැනියක ලෙස හංවඩු ගසාවිද?... ඔහු මා පිළි නොගත් කළ මගේ ඉදිරි ජීවිතය කෙබඳු වේවිද? හැමදාමත් නිසිදු අර්ථයක් පදනමක් නැති ජීවිතයක් අරනා සමගින් ගෙවනවාද?.

ශාතුක සියලු දේ ඔබ අතේය. මගේත් දරුවන්ගේත් ජීවිතය ඔබ අතේය.

මගෙ හිත ගැන මට හිතෙන දේ ගැන මට කතා කරන්න කෙනෙක් හිටියෙ නෑ. පුංචිම කාලෙදින් අම්මා කියනවා මං රවුම් කණ්ණාඩි මේසෙ ඉස්සරහට වෙලා තනියම කතා කළාලු. අක්කලා... නංගිලා... අයියලා... මල්ලිලා කවුරුත් නැතිව තනියම හැදුනු මට ආශ්‍රය කරන්න කියලා පුංචි යාළුවෙක්වත් හිටියෙ නෑ... මං නරක් වෙයි කියලයි අම්මයි තාත්තයි හිතුවේ. ඒක මගෙ ළමා මනසට මොන තරම් වදයක් උනාද කියනවනම් මං තනිවුණා. මං තනිකම දරා ගන්න බැරි වුණාම තනියම කියෙව්වා. කණ්ණාඩිය මගෙ හොඳම යාළුවා උනා. පුංචිම කාලෙදි මං කණ්ණාඩියෙන් පේන මගෙම රූපෙ මගෙ එකම යාළුවා කියල හිතුවා... ඒ යාළුවාට හැම දේම කියන්න මං පුරුදු වුණා. මගෙ දුක සැප බෙදාගන්න මං පුරුදු වුණා.

''මේ ළමයට පිස්සුද මංද... කණ්ණාඩිය එක්ක කතා කර කර ඉන්නවා.''





http://e-pusthakalaya.blogspot.com

මගෙ මේ පාලුව තනිකම නැති කරන කතා බහ අම්මා දක්ෂෙක පිස්සුවක් විදිහට. මොනතරම් මට අම්මගෙන් තාත්තගෙන් ආදරේ ලැබුනත් ඒ අය මගේ ළමා කාලය ගැන හිතුවෙ නෑ. වත්ත පහල ගීතා නැන්දගෙ ළමයි අහල පහල ළමයි එක්ක සෙල්ලම් කරන හඬ මං අහගෙන හිටියෙ උස තාප්පෙට මෙහා පැත්තෙ ඉඳන්. අන්න හිතාවෙන්න... කතා කරන්න මට කවුරුවත් හිටියෙ නෑ... ඒ පුංචි කාලෙ වාගෙම අදත් මට කවුරුත් නෑ... අදත් මං ගමෙන් රටෙන් හැංගිලා. මං කණ්ණාඩි රවුම ඉදිරියේ අදත් හිටගෙන...

"කියන්න ආයු..."

මගේම රූපය මට කතා කරනවා...

"වෙනස් වුනේ කාලය විතරයි..."

"ඔව්... ඔයා එතනමයි ආයු..."

"මට දුක හිතෙනව මගේ ජීවිතේ ගැන...

"ඔයාට ඔයාගෙ ජීවිතේ ගැන තීරණයක් ගන්න කාලය ඇවිත්. ශානුක ජීවත් වෙනවනං එයත් එක්ක එකතු වෙලා ජීවිතේ ඉතිරි ගමන යනවද නැත්නං ඒ යට ගියාව අතීතයට එකතු කරල ඔයාගෙ දරුවෝ දෙන්නගෙ තාත්ත කසාද බැඳල ඉදිරි ජීවිතේ ගෙනියනවද..."

"මට ශානුකව ඕන..."

"ඔය හදවතින්මද ආයු..."





"ඔව්..."

"ඔය හදවතට හොඳට අත තියන්න. ඒ හදවත ගැහෙනව ඇහෙනවද? ඒ හද ගැස්ම වෙනදට වඩා වෙනස් වෙනව නේද? ශානුක ඔයාගෙ මහත්තය කවදාවත් පවුල් ජීවිතේදි ඔයාට වරදක් නොකල ඔයාගෙ සැමියා. අරනා බලහත් කාරයෙක් ඒත්... අරනායගෙන් ඉගෙන ගත්ත ආදරේ... අරනා ළඟ තියෙන ආදරේ... අරනා ළඟ තියෙන සංවේදී කම... හදවතින්ම ඔයා ගැන හිතන තරම... ඒ දේවල් අමතක කරන්න ලේසිද? ඒ තරං ලොකු ආදරයක් ශානුක ළඟ දකින්න හැකියාව තියෙනවද?"

"නවත්ත ගන්න. අරනායගෙ ආදරෙන් මට වැඩක් නැහැ."

මම කෑගැසුවෙමි.

"අන්න හොඳයි ආයු. පසුතැවිලි නොවී ජීවත් වෙන්න."

මම වහා වටපිට බැලුවෙමි. කිසිවකු මා දුටුවේය යන ලැජ්ජාවෙන් හෝ ඊට සමාන හැඟීමක් මට ඇතිවී තිබිණි. ඒත් කිසිවකුත් උන්නේ නැත. මා විතරය. කැඩපත විතරය.

* * * * *

අරනා ආවේ හිස් අතිනි. ඔහු මට මුහුණ නොදී උන්නේය. මා සමග වචනයක් දෙඩුවේද නැත. මට ශානුක වෙතට ගියෙමි.

"ශානුක ඉන්න තැන කිව්වද ඔයාගෙ තාත්තා..."



http://e-pusthakalaya.blogspot.com

මම ඇසුවෙමි.

"නැහැ..."

එපමණකි. ඔහු තවත් මා සමඟ දොඩන්න ආවේ නැත. ශානුක ගැන කිසිදු තොරතුරක් නොතිබුණේය. මම නොසංසුන් වී උන්නෙමි. ඇත්තටම මා මෝඩියකි. අරනායගේ උදව් පැතීම වැරදිය. ඔහු මට ආදරේ කරයි. මා ළඟින් තබා ගැනීම ඔහුගේ අරමුණයි. ඉතිං ඔහු ශානුක සොයා දෙන්නට ඉදිරිපත් වේවිද? මෙය මාම විසදා ගත යුතුය. මම හුපති සොයා ඔහුගේ නිවසට යන්න තීරණය කළෙමි.

"කොහේ යන්නද නෝනෙ..."

මේ කාලය පුරා මා තනිව ගෙයින් එළියට නොබැස්ස බැව් දන්නා කිරි අම්මා ඇසුවාය.

"මං යනවා හුපති හම්බ වෙන්න..."

"දෙයියනේ..."

"මේක මංම විසදගන්නවා..."

මම හුපති ඇමතිගේ ගෙදර පළමු වරට ගියෙමි. හුපති ඇමති, ඇමති නොවේ. මන්ත්‍රීද නොවේ. ඔහු නිකම්ම නිකම් හුපතිය. මා ගියේ ත්‍රී රෝද රියකිනි. එය විසල් නිවසකි. ඉදිරි ආරක්ෂක කවුළුවෙන් මම කතා කළෙමි.

"ඇයි..."



"හුපති මහත්තයට කියන්න ආයු කියල කෙනෙක් ඇවිත් කියල."

කවුළුව වැසිණි. පැය කාලක් පමණ ගිය පසු මට පුංචි ගේට්ටුව හැරිණි.

"එන්න කිව්ව..."

මට පුදුමත් හිතිණි. ඒ ලෙසට බියකුත් සිතිණි. ඒත් බිය නොපෙන්වා මම ඒ පිළිවෙළට සැකසූ තණ බිමෙහි ඇවිද ගියෙමි. හුපති උන්නේය.

"මොකද?"

ඔහු කෙලින්ම ඇසුවේමි.

"ශානුක කෝ?"

මම ඇසුවෙමි. හුපති මා දවා හළුවන බැල්මක් හෙලුවේය. මගේ හිසේ සිට පාදාන්තයටම ඔහු බලා උන්නේ කෑදර හිවලකු සේය.

"නෝනලත් නෑ, නුවර ගිහින්. ගෙට ආවනං..."

"නෑ... මෙහෙම හොදයි."

"මගෙන් උදව් ඕන නං මටත් උදව් කරන්න ඕනි."

හුපති මනමාල ලෙසින් කීවේය.

"ශානුක ජීවත් වෙනව. ඒක මට දනෙනවා. හුපති

http://e-pusthakalaya.blogspot.com

ඇමතිතුමාට ලබන පාරවත් ඇමතිකම ගන්න පුළුවන් ශානුකව එළියට දැම්මොත්"

මම කීවෙමි. භූපති ඇස් විදහා බැලුවේය.

"ඒ කොහොමද?..."

"ශානුක දන්නවද මේක පිටිපස්සෙ ඉන්නෙ භූපති ඇමති කියලා..."

"කොහොමටවත් නෑ..."

"ඉතිං ශානුකව එළියට දාන්න... ඇමතිතුමාට මාවත් කරදරයක් වුණා. මං ශානුකත් එක්ක වෙන රටකට යන්න..."

"අර ළමයි දෙන්නව කවදාවත් අරනාය දෙයිද? ඒක කපුවක් වෙයි..."

"නැහැ... මං දරුවො දෙන්නව අරනායගෙන් ඉල්ල ගන්නං. අරනාය මට ඇහුම්කන් දෙනවා... මං කැමතියි මේ ඇමති පවුලෙන් අපේ ජීවිත ඈත් කරන් යන්න. එතකොට ඇමතිතුමාට පුළුවන් ලබන පාර දිනන්න. මේ ප්‍රශ්නෙ දිගින් දිගට ගියොත් ඇමතිතුමාගෙ දේශපාලන ජීවිතේ අවසන් වෙයි."

මම බොහෝ කරුණු කාරණා පැහැදිලි කළෙමි.

"මං ශානුකව එළියට දාන්නං. හැබැයි මට මඩ ගහන්න ඌ ලංකාවෙ ඉන්න බෑ. පිට රටකට යන්න ඕන..."

"හා"





"සඳහටම යන්න ඕන"

"යන්නං... අනිවාර්යෙන්ම"

"මං මගේ දේශපාලන ජීවිතේදී කරපු ලොකුම ගොන්කම තමයි ඔය ශානුකව හිර කරල දාපු එක. ඔය ළමය යන්න. මං ශානුකව එවන්නං..."

මට විශ්වාස නොවූ තරම්ය. ආයේ මා ගෙදරට ආවේ කෙතරම් ඉස්පාසුවක් නැතිවද.. මට සතුට දරා ගන්න බැරිව තිබිණි. ඇස්වලින් කඳුළු පැන්නේ අරනායගේ ගෙදර දොරටුව ඉදිරියේදීය.

"කොහෙද ගියේ..."

ඒ අරනායය.

"භූපතිගෙ ගෙදර..."

මම කීවෙමි.

"ආයු... ඔයා..."

"ඔව් මට ශානුකව ගේන්න ඕන දෙයක් කරනවා..."

"ඕන දෙයක්... ඕන දෙයක්..."

"ඕන දෙයක් කිව්වේ මිනිහෙක් එක්ක නිදා ගන්න එක නෙමේ නේ. තේරුණාද... ඔයා ශානුකව ගෙනාවද... මොනාද ඔයා ඒ වෙනුවෙන් කළේ...?"

මම කෝපයෙන් කෑ ගැසුවෙමි. අරනාය පසෙකට වූයේය.



http://e-pusthekalaya.blogspot.com

මම කාමරය වෙත දිව ගියෙමි. අරනාගේ දෙපා ගැටෙන හඬ ඇසීත් මම හැරී නොබැලීමි. ඔහුගේ හිත රිදවීම යුතු නොවේ. ඔහු ගැන වේදනාවක් නැතුවත් නොවේ. සමහර ප්‍රශ්න වලදී තරුණයකු හැටියට ඔහු වේදනා වින්දා වැඩිය.

"මං ශානුකව හෙව්වා... ඔයා විශ්වාස නොකලට මං ශානුක ගැන ඔයා හරමටම වද වුණා. මුලදී ශානුක ගැන වෛරයක් තිබුණු එක ඇත්ත. ඒත් පස්සෙ මං තේරුන් ගත්තා මෙතනදි ශානුක වැරදි නෑ. එයා ලිව්වෙ එයාට පේන දේ... සමහර වෙලාවට තාත්තාට මඩ ගහද්දි අම්මව නිකම්ම ඒකට ඇදෙනවා... හරියට ඔයාට වුණා වගේ. මං හිතට එකඟ නැති උනත් භූපතිව හම්බවෙන්නත් ගියා... භූපති කිව්වා ඔයාට බොරුවටයි කිව්වෙ එයා ළඟ ශානුක නෑ කියලා... මං බොරුකාරයෙක් වංචාකාරයෙක් නෙමේ. මං දන්නව ආයු මං මොන තරම් ආදරේ කළත් ඔයා ශානුකගෙ. ඔයා කවදාවත් මට ආදරේ කරන්නෙ නෑ... ඒත් මං මගෙ ජීවිතකාලෙටම ආදරේ කලේ ඔයාට විතරයි. ඒක මං මැරෙනතුරුත් එහෙමමයි.

තිගැස්මෙන් වේදනාවෙන් මම ඔහු කියන දේ අසා උන්නෙමි. මේ කොහේ හෝ බොරුවකුත්, මේ කොහේ හෝ ඇත්තකුත් තිබේ. භූපති මට ශානුකව ගෙනත් දෙන බවට පොරොන්දු වූයේය. මේ කරදර කාර ජීවිත කතාවෙන් අයින් වී යන්නට දැන් කාලය හරිය. මම දුකක් නැතිව අරනාගේ ජීවිතෙන් මිදෙන්නට බලා ඉන්නෙමි. මට දුක නැත්තේ ඇයි? හදවත ගලවා බලන්නට මට හිතේ. කිසිම ලෙසකින් මා ඔහුට පෙම් නොකළේද?.

විවාහය...





විවාහක බිරිඳ...

අරනාට පෙම් කරනවාදැයි යන ප්‍රශ්නය එතනින් අහවර වී යයි. අප මිනිසුන්ය. ඇත්තය. පෘතග්ජන මිනිසුන්ය. ආදරය, සෙනෙහස, විරහව, දුක, සන්තාපය අපට දැනෙන්නේ ඒකය. අරනා හදවතට කොහෙන් හරි රිංගා ගන්න ඇත. ඒ කොතනදැයි ශුද්ධ පවිත්‍ර කර බලන්න හිතක් මට නැත. මේ රවටා ගැනීමක් බව දන්නෙමි. ඒද කම්නැත. රවටා ගත්තේ මාව නම් මා කිසිවකුට වංචාවක් සිදු කර නැත.

තත්පර...

මිනිත්තු...

පැය...

ගෙවෙන්නේ කාලයයි. භූපති සූරිය පෙරුමගේ පිළිතුර කෙබඳු එකක් වේවිද? ශානුක ජීවත් නොවන බව ඔහු අරනායට කියේවි සැබෑවක්ද? නොවේ. ශානුක ජීවත්වනවා නියතය. මට කිසි දිනක වරදක් නොකල මගේ සැමියා ඔහු ජීවත් විය යුතුය. ඔහු මටත් වඩා රටට අවශ්‍ය මිනිසෙකි. මගේ දුරකතනය නැඩිණි.

"හෙලෝ..."

"මං භූපති... දැන් අරනාව නැතුව අපේ ගෙදර එන්න..."

"හ්... හා..."

මට කියක් දැනුණේ නැත. ඒත් සොඳුරු කෙල්ලක... ගැහැනියක භූපති වාගේ තම නම කැත කරගත් අධම සල්ලාල



http://e-pusthakalaya.blogspot.com

මිනිසකු ඉදිරියට යාමේදී කල්පනාකාරී විය යුතුය. බිය විය යුතුය. ඒත් මම බියෙන් තොර වීමි. ඒත් නිකම්ම යා නොහේ.. මට සිහිවුනේ අරන්‍යගේ රහස් ලාච්චුවේ වූ රිවෝල්වරයයි. මම එතනට ගියෙමි. පප්පුව ගැහෙයි. මෙය ආයුධයකි. කෙනෙකුගේ ජීවිතය නැසිය හැක්කකි. එක මොහොතකින් සියල්ල විනාශ කර දමන්නට පුළුවන. මෙය පෙන්වා අරන්‍ය මා බිය ගැන්වූ හැටි මතකය. හුපති තම පුතා ලවා මා දූෂණය කළේ මේ ආයුධ වලින් මා බිය ගන්වාය. ඔහු බළලුන් ලවා කොස්ඇට බැවූවා නම් මා ඌරා ගේ මාලු ඌරාගේ පිටෙහි තබා කැපීමේ ඇති වරද කිම...

"මේක හුපති සූරියපෙරුමගෙ. මට අයිති දෙයක් නෙමෙ..."

දවසක් අරන්‍ය කීවේය. මම එය අතට ගත්තෙමි. ඒළගට එය කැඩපතින් පෙනෙන මගේම රූපය දෙසට යොමු කළෙමි. අරන්‍ය එන්නට කලින් පිටවිය යුතුය.

අල්මාරිය පෙරලා මම ශානුක ආසම වූ සුදට හුරු දිග ගවොමක් ඇගලා ගත්තෙමි. හදවත ගැහෙයි. මෙය කුමන හමුවීමක්ද? මෙය කුමන පිළිගැනීමක්ද? මට හැඬෙන්නට එයි. ශානුක ජීවිතයේ කිසි දිනක මා නොරිදවූ මගේ සැමියා ඔහු නොවේද? මම ඉක්මනට ගෙදරින් පිටවීමි. ත්‍රිරෝද රියකට නැගී හුපති සූරියපෙරුමගේ ගෙදර ගියෙමි. පසුගියදාක වාගේ නොවේ. මට ඒ දොරටු හැරදා තිබිණි. හුපති රියට නගින පෙරමග උන්නේය.

"වෙලාවට එන්න කිව්වනං එන්න ඕන"

හුපති කීවේය. ඒත් ඒ වචන වල ඉස්සර වාගේ තරහක් තිබුණේ නැත. උඹ බං කියා කතා කළ හුපති මේමදැයි මට සිතිණි.



http://e-pusthakalaya.blogspot.com



එයටත් කුමක් හෝ හේතුවක් හෝ යටි අරමුණක් ඇතැයි මම දන්නෙමි. ඕනෑම දෙයකට සූදානමින් මම හුපති දෙස බැලුවෙමි. හුපති මදෙස බර බැල්මක් හෙලුවේය.

"නගින්න..."

මම නැංගෙමි. බිඳක බියක් තිබුණේ නැත. නැතිවන්නට දෙයක් තිබුණේ නැති නිසා නැතිවන දෙයක් ගැන සොවක් තිබුණේ නැත. බොහෝ දුර සැප පහසු රිය ඉගිල ගියත් හුපති කතා නොකළේය. මමද ගොලුව උන්නෙමි. ප්‍රධාන මාර්ගවලින් ඈත් වී ගියාට පසුව ඉතාම පැරණි නිවසක ප්‍රධාන පිවිසුම් දොරටු හැරුණි. රිය ඇතුළු විය. නතර වූ රියෙන් හුපති බැස්සේ 'එන්න' කියමිනි. මම ද බැස්සෙමි. කෙලින්ම ඔහු ගෙතුලට ගියේය. මමද ගියෙමි.

"මේ මගේ පරණ ගේ."

"එහෙමද?"

"ඔව්... කාලෙකින් ආවෙ. මේක බලාගන්න මිනුස්සයෙක් ඉන්නවා. මං අද මිනිහව වෙන ගමනක් යැව්වා."

"ඉතිං... අපි කෙලින් කතා කරමු..."

"ඔව්..."

මමද කීවෙමි.

"ශානුක ජීවත් වෙනවා. දැන් එයාව මගෙ කට්ටිය අරන් එනවා. මෙහෙට නෙමෙ. අරන්‍යයගෙ ගෙදරට... ආයු... නමුත් ඔයාට රටින් පිටවෙන්න ඕන ශානුක එක්ක. ශානුක ඉදිරියට

ලියන්න බෑ... ඒ විගසම ගන්නවද?"

එය කළ නොහැකි බව දන දනත් මම බොරුවට එයට එකඟ වීමි.

"අතික නමයි... මං ඔයාට ලොකු උපකාරයක් කළා ඒකට ඔයත් ඉතිං මට සලකන්න ඕනක්..."

ඔහු කියන දේ මට වැටහණී.

"කියන්න..."

ඒත් මම කීවෙමි.

"මාත් එක්ක හිටිය කියල අමුතු දෙයක් වෙන්නෙ නෑ මොකද කියන්නෙ. ගනුදෙනුවට එකඟද?"

"ඔව්... හැබැයි එකදෙයක් තියෙනව..."

"මොකක්ද?"

"මම ඉන්නෙ ශානුක අරනාගෙ ගෙදරට ගියාට පස්සෙ. ඒවගේම අරනාගෙ ගෙදර ඉඳන් ශානුකයි... අරනායි දෙන්නම මට කෝල් කරන්න ඕන."

"ඒක මහ දෙයක්ද? ඔය එන්නෙ කෝල් එක..."

භූපති වහා තම දුරකතනය කණෙහි රුවා ගත්තේය.

"ඔව්... අරනාගෙ ගෙදරද? මං ගැන මුකුත්ම කියන්න එපා. ඔය ෆෝන් එක දෙනව ශානුකට."



http://e-pusthakalaya.blogspot.com



භූපති කීවේය. මගේ පපුව තදින් ගැහිනි.

"ආ මෙන්න මනත්තයා එක්ක කතා කරන්න."

මම වහා දුරකතනය ගත්තෙමි.

"හෙලෝ..."

"ශානු"

"ආයු... මගේ ආයු..."

"ඔයා හොඳින් නේද ශානු"

"ඔව් කෙල්ලෙ ඔයා කොහෙද?"

"මං දැන් එනවා. අරනා ඉන්නවද?"

"අරනා"

"ඔව්"

"අරනාව අහනව..."

ශානුක කාටද කීවේය.

"හෙලෝ ඔයා දැන් කොහෙද කියන්න ආයු..."

ඒ අරනාය.

"මං එනවා. හැමදේම විසඳගෙන"

"ඔයා එහෙම කෙනෙක් වෙන්න එපා. ඔයා ඉන්නෙ කා එක්කද කියල මං දන්නවා."

මම දුරකතනය විසන්ධි කළෙමි.

"දූන් හරිද?"

"හරි..."

"එහෙනං යං..."

හූපති මගේ කරට අත දමා ගත්තේය. අවංකවම හූපති ජීවත් විය යුතු කෙනෙකු නොවේ. හූපති ඇමතිවරයකු කාලයේ ඔහුට තිබුනේ මිනීමරුම් චෝදනා පමණක් නොවේ. ඔහු සල්ලාලයෙකි. සොඳුරු ගැහැනියක දුටුවොත් ඔහු ඒ ගැහැනිය තමන් යටතට ගත්තේය. බාල වයස් දැරියන් පවා දූෂණය කළා යැයි ඔහුට චෝදනා තිබිණි. වියපත් විද ඔහුගේ ලිංගික ආශාවන් සුළු පටු ඒවා වූයේ නැතැයි ශානුක එක්තරා ලිපියක ලියා තිබිණි.

"මං ඔන තරං ගෑනු එක්ක නිදාගෙන තියෙනවා. ඒත් මං දැක්ක ලස්සනම ගෑනි ඔයා... ආශු. ශානුක වගේ වැඩකට නැති මිනිහෙක් එක්ක ඉන්නෙ. මං එක්ක ඉන්න හැම සැපම දෙන්නං."

මම කතා නොකළෙමි. තරුණ කතා බහ මිස ඔහු ළඟ තරුණකම තිබුණේ නැත. පිරිමියෙකුට ආදරේ කරන්නේත් තට පිරිමියෙකුව අප්පිරියා කරන්නත් පිළිකුල් කරන්නත් ගැහැනියක පෙළඹෙන හැටි අපූරුය.

"මොනවද කල්පනා කරන්නෙ. එන්න මගෙ කෙල්ලෙ..."

තවත් බලා ඉන්න බැරිය. මම ගවොමේ සාක්කුවේ සඟවා උන් රිවොල්වරය පැවෙමි.



http://e-pusthakalaya.blogspot.com



"ඕක අහකට ගන්න. මං මැරෙයි..."

"ඔව් තමුසෙ මැරෙනවා තමයි"

"ආශු..."

"දුව කියපං... උඹ දන්නවද උඹෙයි මගෙයි වයස"

මම කෑගැවෙමි.

"අනේ දුවේ මට සමාවෙන්න..."

මම ඉලක්කය ගත්තෙමි. හූපති වාගේ තිරිසන් මිනිසුන්ට මරණ දණ්ඩනය ක්‍රියාත්මක විය යුතුය. නොවේ නම් ගල් ගසා මරන්නට උවමනාය.

"මං ශානුකව නිදහස් කළානෙ..."

ඔහු එහෙම කියද්දී මම කැසට් රෙකෝඩරයට සියල්ල පටිගත කර ගත්තෙමි.

"තමුසෙ ශානුකව කොච්චර කල් හංගගෙන හිටියද?"

"මං පිලිගන්නවා දුවේ. මං එහෙම කළා. මං අපරාධ කළා. දුවගෙ ජීවිතේ විනාශ කළා..."

"තමුසෙ චන්ඩියෙක් දම්මලා මාව දූෂණය කළා. ඇයි කියන් නැත්තෙ..."

"ඔව් මං එහෙම කළා. ශානුකගෙන් පළිගන්නයි ඕන වුණේ..."

ඔහු දිගින් දිගටම කල කී දේ කීවේය. මම ඔහුගේ දෙපාත් දෙඅතුත් ඇඳේ කකුල් වලට තබා බැන්දෙමි. ඊළඟට ඔහුගේ දුරකතනය ඔහුට හසුනොවන තැනකින් තැබුවෙමි.

"අර අවුරුදු දහතුනක මලී කුමාරිව දූෂණය කළෙත් තමුසෙ නේද?"

භූපති කතා කළේ නැත.

"ඇයි කියන්න බැරිද?"

මම වෙඩි තියන්නට වාගේ හැදුවෙමි.

"ඔව් ඔව් මමයි කළේ... මං මහා අපරාධකාරයෙක්..."

තවත් ඔහු යමක් කියන්න කලින් මම එතනින් පිටවීමි. කෙලින්ම ත්‍රීරෝද රියක නැග අරනායගේ නිවස වෙත ආවෙමි. ශානුක දකින තුරු ඉස්පාසුවක් නොවූයේය. ත්‍රීරෝද රියෙන් බැස මම දිව ආවෙමි. ශානුකත් අරනායත් දෙදෙනාම සාලයේ හිඳගෙන උන්හ.

"ආයු..."

ශානුකගේ ඇස්වලින් කඳුළු කඩා වැටෙයි. මම ඔහු වෙතට දුව ගොස් ඔහුට තුරුළු වී හඬන්න වූයෙමි.

"අඬන්න එපා. සේරම මං දන්නවා... මං ඉන්නවා ආයු..."

මේ තරම් ආදරයෙන් එදවස ඔහු හැසිරුණේ නැත.

"මට කියන්න ආයු..."





"මුකුත් කියන්න කලින් අපි පොලීසියට යමු..."

"ඒත්..."

"යං භූපති හැමදේම පාපොච්චාරනය කරල ඉවරයි..."

මම සිදුවූ සියලු දේත් කැසට් රෙකෝඩරයත් ශානුක අත තැබුවෙමි.

"ඔයා ඉන්න ආයු... මං පොලිසියට යන්නං..."

ශානුක කීවේය.

"මගෙ වාහනේ යන්න..."

අරනාය කීවේය. දරුවන් හඬන හඬ ඇසී මම කාමරයට ගියෙමි. අරනායද මා පිටුපසින් ආවේය. ඒ ඇස්වල කඳුළුය. මහා වේදනාවකින් ඔහු මදෙස බලා උන්නේය. මම දරුවන්ට කිරි දුන්නෙමි.

අපට අපගැන කතා කරනවාට වඩා අප කළයුතු අත්‍යවශ්‍යම රාජකාරි කීපයක් තිබිණි. පොලිසිය විසින් භූපති සූරිය පෙරුම අත්අඩංගුවට ගෙන තිබිණි.

"ශානුකව හිර කරල මං විතරක් නෙමේ. මං දඬුවම් විඳිනව නං ඔය තව ඇමති පුටුවල ඉන්න උනුත් මේකට වගකියන්න ඕන."

ඔහු උසාවිය ඉදිරියේ තම වැරදි පිළිගත්තා විතර නොවේ. පාපොච්චාරණයද කළේය.



http://e-pusthakalaya.blogspot.com

ඉතිං සියල්ල අවසන්......

,හුපති හිරේ......

ශානුක මං ළඟ...

සතුටුද...?

මං මගෙන් අහනවා. මට පේන්නෙ හිනාවෙන්... අඩන මගෙ අහිංසක දරුවො...



## 11

අදුනින්ම ජීවිතය පටන් ගත යුතුව තිබිණි. ඒත් එය අරඹන්නේ කොහේ කොහොම කා සමගද කියා මට තේරුණේ නැත. ශානුක මගේ සැමියාය, අරන්‍ය මගේ දරුවන්ගේ තාත්තාය. මා වැඩි තැන දෙන්නේ කාටද? මගේ ජීවිතය භාර දෙන්නේ කාටද?.

"මං නිසා ඔයාට වුණු දේවල් ගැන දුකයි...උන් මාව අවුරුදු දෙකක් හිරකරගෙන හිටියා... මං ඒ කාලෙදි ජීවිතේ ඉගෙන ගත්තා. මං ඔයාට ආදරේ කළේ නෑ නේද කියල හිතුණා. මට ඔයා නැතුව පාලුයි... ඔයා නැතුව ජීවත් වෙනව කියන්නෙ මොනතරන් අමාරු දෙයක්ද කියල හිතුණා. මං ආයෙ පත්තර කාරයෙක් වෙන්නෙ නෑ."

"ඔයා මේ රටට සේවය කරන්න ඕන..."

http://e-pusthakalaya.blogspot.com

"නැහැ ආයු. මේ රට ගැන මං කළකිරුණා. කවදාවත් කුරා කුහුඹියෙකුට වරදක් නොකළ මගෙ ගැනිට මාධ්‍ය මඩ ගැහුවා. අපහාස කළා. ඒව විඳව ගන්න බැරුව ඔයාගෙ අම්මයි තාත්තයි මැරුණ."

ශානුක දෙස මම බලා උන්නෙමි. ඔහු පරිනත වී තිබේ. ඒ දෑස්වල ඉස්සර තිබුණු තියුණු බව වෙනුවට දුන් සංවේදී කමක් පිහිටයි. ඔහු ජීවිතය තේරුම් ගත්තාද? කළකිරුණාද?

"මාව අතුරුදන් වුණාට මාව හොයාගන්න තනි සටන කළෙ ආයු. මගෙ වයිෆ්. මට මාධ්‍යට කියන්න තියෙන්නෙ එච්චරයි. මාධ්‍ය වේදියෙක් වුණු මට, මං නැතිවුණු වෙලාවෙ මගෙ වයිෆ්ට මුහුණ දෙන්න වුණු අති අමානුෂීය වධ හිංසා ගැන දුකක් නෙමෙ තියෙන්නෙ. මං මාධ්‍ය ජීවිතයෙන් සමුගන්නව. ඒ ගැන මං කලකිරුණ."

ශානුක මාධ්‍ය වෙත තම අදහස් දැක්වූයේය.

සැමියා බේරාගත් දිරිය බිරිඳ යනුවෙන් පුවත් පත්වල මා ගැන පලවුණි. මේ තිරිසන් දූෂණය කළ භූපතිගේ පුතා අත්අඩංගුවට නොගත්තේ ඇයි.

"ඔව්..."

"පළවෙනි වතාවට මං මාධ්‍යට කතා කරන්න කැමතියි. මං කිසිම දේශපාලනයකට අයිති නෑ. කිසිම දේශපාලන පාක්ෂිකයෙක් නෙමේ මං, ඒ වගේම මං මාධ්‍යවේදියෙක්වත්, මාධ්‍යවේදියෙක් එක්ක සම්බන්ධයක්වත් මට නෑ. මගේ සැමියා



http://e-pusthakalaya.blogspot.com



මාධ්‍යවේදියෙක් උනත්. මං එයාව මාධ්‍යවේදියෙක් විදිහට දැක්කෙ නෑ. එයා මගෙ සැමියා කියලයි හිතුවෙ..."

"ඔව්... අරනාථ... වැරදි වැටහීමක් මත මාව දූෂණය කළා. ඒ භූපති ඇමති තුමා තමයි තමන්ගෙ දරුවව ඒකට පෙළඹෙව්වෙ. මං මුලදී අරනාථයට වෛර කළා. ඒත් දේශපාලනය. දේශපාලනඥයො, මාධ්‍ය වේදීන් සියළු මාධ්‍ය මාව පාරට ඇදල දාද්දී, කොටින්ම මාව වදාපු හදාපු දෙමාපියන් මාව පිළිනොගද්දී, මට වෛර කරද්දී, මාව පිළිගත්තෙ අරනාථ. මට මගෙ සැමියාව සොයා ගන්න පුලුවන් වුනේ මං ජීවත් වුනු නිසා. මං ජීවත් වුනේ අරනාථ නිසා. ඒ නිසා එයාට දඬුවම් දෙනවට මං කැමති නෑ. එයාට එයා කළ වැරැද්දට දඬුවම් ලැබෙනව. ඒ නීතියෙන් නෙමෙයි. එයාට දඬුවම් දෙන්නෙ මමයි."

මම මාධ්‍ය වෙත මගේ අදහස් දැක්වීමි. ඇස්වලින් හෝ ගා කඳුළු වැටිණි. වසර ගණනක් තිස්සේ වසන් කරගෙන උන් කඳුළු දෝරෙ ගලා ගියේය.

"ආයු..."

ශානුක මා තුරුලු කරගත්තේ ආදරයෙනි.

"ඔයා තීරණය කරන්න. ඔයා මොනව කිව්වත් මේ දරුවො දෙන්න අරනාථගෙ දරුවො දෙන්න. අරනාථගෙන් උදුර ගන්න බෑ. ඔයා තීරණය කරන්න ඔයා මේ දරුවො එක්ක සතුටින් ඉන්නවද නැත්නම්."

ශානුක කීවේ කියවෙන්න ගිය දෙයින් භාගයකි. අරනාථ පසෙක බලා හිඳී.

"සිද්ද වුණු කිසිදෙයක් සිද්ද වුණේ නෑ කියල මං හිත හදාගන්නව. ඔයා සතුටෙන් ජීවත් වෙන්න කොහේ හිටියත්.

"ශාතුක මං ආදරේ කළේ ඔයාට විතරයි..."

"ආයු... ඔයා ගත්ත තීරණේ ගැන පසුතැවෙන්න එපා. මේ දරුවන්ට ඔයා ඕන. මගෙ තීරණේ ලංකාවෙන් යන්න."

"ඔයා යන තැනක මාත් එනවා..."

එය මගේ තීරණය වීය. අරනා පෙනෙන්න උන්නේ නැත. සියල්ල අසා හිද ඔහු යන්න ඇත. මම දරුවන් සොයා ගියෙමි. අරනා ඉකි බිඳ බිඳ හඬමින් උන්නේය.

"මේකද මට දඬුවම..."

අරනා ඇසුවේ මගෙනි. දිය යුතු හෝ දිය හැකි පිළිතුරක් නැත. මම ආයාසයෙන් දරා ගෙන දරුවන් දෙස බලා උන්නෙමි.

"මේ දෙන්න මට දුන්නට පින්... ඒත්... මං ඔයාට හුඟක් ආදරෙයි..."

අරනා කීවේය.

"ඔයා නැතුව ජීවත් වෙන්න මටත් බෑ ආයු..."

ඒ සියලු කතා ඇසුනත් මම මගේ තීරණය ගත්තෙමි.

ශාතුක මා ඔහුගේ දෙමාපියන් වෙත රැගෙන ගියේය.

"අපට සමාවෙන්න පුතේ..."





ශාතුකගේ දෙමාපියන් කීහ. මම ඔවුන්ගේ දෙපා නැමැද්දෙමි. ඒද හිත කකියයි. මේ තරම් පපුව පිච්චෙන්නේ ඇයි...?

මම ගෙදර ආපසු කැඩපතට එබුනෙමි.

"සතුටුද?"

"ඔව්..."

"නෑ... ඔයා හිටියටත් වැඩි දුකින්..."

මම කතා නොකළෙමි.

"අරනාට ආදරෙයි නේද?"

මම ඒත් කතා නොකළෙමි. ශාතුක ඔයා නැති වුනත් ජීවිතේ හදා ගනී. ඒත් අරනාටයි පොඩි උන්ටයි ඔයාව ඕන.

"මං තීරණේ අරන් ඉවරයි.:."

මම කැඩපතින් සමුගත්තෙමි. ආයේ කවදාවත්ම කැඩපතට මා අමතන්න අවස්ථාවක් නොදෙන්නෙමි.

"කොහේ යන්නෙද

කොහේ ඉන්නෙද

ඔබත් ඇසුවා මගෙන්

මමත් ඇසුවා ඔබෙන්"

මමත් ශාතුකත් පිටරට ගමනට සූදානම් වී උන්නෙමු. දරුවන් ඉදිරියේ හඬා වැටෙන්නේ නැතිව ඉන්නට බැරි විය.



http://e-pusthakalaya.blogspot.com

"තාමත් වෙලාව තියෙනවා. මං තරහ නෑ. මානුෂීය පැත්තක් තියෙනවා. දරුවන්ට ඔයා ඕන"

"මගෙ තීරණේ වෙනසක් නෑ..."

මම ශානුකගේ අතක එල්ලී දරුවන්ගෙන් ඉවත් වීමි.

"ආයු..."

අරනාෂ කතා කලේය.

"මට සමාවෙන්න..."

මම කිසිවක්ම නොකීවෙමි. අරනාෂ ශානුක ගැනවත් නොසිතා මා තුරුලු කරගත්තේය. ඉතිරි වූයේ වේදනාවය. ජීවිතය පුරා විඳවන්නට වන්නේය. ඒත් කළ හැකි දෙයක් හෝ කළ යුතු දෙයක් නොවේ.

"තව සැරයක් හිතන්න... මට පාලුයි... මට කවුරුත් නෑ... ඔයා ඇරෙන්න කවුරුවත්ම නෑ..."

අරනාෂ කීවේය.

"මට ජීවත්වෙන්න ඕන ශානුක එක්ක. සමාවෙන්න අරනාෂ..."

අරනාෂ කරබා ගත්තේය. සියල්ල හොඳිනී. ඒත් සුදූ හා පැටව් වාගේ හිනැහෙන දරුවන් දකිද්දී මහා වේදනාවක් දූනේ. මෙතරම් රළු අම්මා කෙනෙකු වන්නේ කොහොමද? දරු දෙන්නා නැතිව ජීවත් වෙන හෙට දවසක් ගැන හිතන්නටවත් බැරිය. ඒත්



http://e-pusthakalaya.blogspot.com



දරු දෙන්නා අරනාෂගෙන් ඉල්ලා සිටින්නටත් බැරිය. ඔහු තවත් තනි කිරීම, ඔහු තවත් තනි වීම දරා ගන්නටත් බැරිය.

"මං හිතන්නේ හුපනිට ජීවිත කාලෙටම හිරේ ඉන්න වෙයි...."

"ඔව් කරල තියෙන ඒව සේරම එළි උනානෙ. ඔයා නිසයි සේරම එළිවුණේ. මගෙ වයිෆ්ට මෙච්චර ලොකු මොළයක් තියෙනව කියල මං දන්නැනෙ."

ශානුක හිනැහිණී. මම ද හිනහුනෙමි. අපි සිනාසුනෙමු. ඒත් මේ හිනාවේ අරුථය කුමක්ද? අප හිනා වන්නේ හදවතින්මද? මම හදවත ඇතුලාන්තයට අතු පතු ගා පිරිසිදු කරමි. මේ දවස් කීපයේ අප උන්නේ අරනාෂගේ නිවසේය. මමත් දරුදෙදෙනාත් පුරුදු විදිහට එක කාමරයකද, අරනාෂ ඔහුගේ කාමරයේද, ශානුක තවත් කාමරයකද රැය ගත කළෙමු. ඒත අපේ හදවත් වල කෙබඳු දුකක් ඒ රෑ පුරා හැඟෙන්නට ඇත්ද?. මා යා යුත්තේ කුමන කාමරයටද? මගේ අයිතිකරුවා කවුද? මට වාගේම මේ ප්‍රශ්නය ඔවුන්ටත් ඇති බව මම දැන උන්නෙමි. ශානුක එක්ක ආයේ බිරිඳ විදිහට ජීවත්වීම ලේසිද? සිදුවූ සියලු දේ සිදු නොවූ සේ නොසලකා හරින්නට පුළුවන්ද?. මම රැය පුරා කඳුළු නොසැලුවෙමිද?...

"ආයු..."

උදෑසනක අරනාෂ මා වෙත ආවේය.

"කියන්න..."

"දරුවො දෙන්නත් එක්ක අපි පන්සලට ගිහින් එමුද?"

මම අරනාය දෙස බැලුවෙමි.

"අපි වීතර්ක්"

ඔහු ආයේ කීවේය. සිතන්නට බොහෝ දේ තිබුණත් මේ වෙලාවෙ නොවේ. අරනාය රිදවීම පවුය.

"හා යං"

මම කීවෙමි.මම ඇඳගන්න පෙර ශානුක සොයා ගියෙමි.

"ආයු..."

මම ශානුකගේ යහනේ හිඳගත්තෙමි. ශානුකද යහනේ හිඳ ගත්තේය. අප අතර දුස්තර බවක් වූයේය. මේ දුරස්තර බව ජීවිතයේ අපගේ වෙන්වීම සනිටුහන් කරනවා නොවේද? ආයේ අපට එකතු වන්නට බැරි බව කියා පානවා නොවේද?.

"අපි අමුත්තො වගේ..."

මම කීවෙමි. ශානුක සුසුමක් හෙලුවේය.

"මේ ජීවිතේ මොකක්ද? අපි අපේ ගෙදරදී හිටියෙත් කාමර දෙකකද?"

මම ඇසුවෙමි. ශානුකගේ ඇස්වල කඳුළය.

"අපට ආයෙ එක කාමරේක හස්බන්ඩ් ඇන්ඩ් වයිෆ් වගේ ජීවත් වෙන්න බෑ ඒකද ඇත්ත.."

"මෙතන තියෙන ප්‍රශ්නෙ ඒක නෙමේ. ඔයා දකිනවට වඩා ලොකු දෙයක් තියෙනවා ආයු... මං ඔයාට ආදරෙයි. ඒත් ඒ



http://e-pusthakalaya.blogspot.com



ආදරේට පැවැත්මක් නෑ. අරනායගෙ ආදරේට පැවැත්මක් තියෙනවා. අරමුණක් තියෙනවා... මොනව උනත් ඒ දරුවො දෙන්න ඔයාගෙයි. අරනායගෙයි.

"ඔයාට ඒ දරුවොද ප්‍රශ්නෙ..."

"නෑ ළමයො... මට පුළුවන් මගෙ දරුවො වගේ ඒ දරුවො බලාගන්න. ඒත් අරනායගෙන් ඒ දරුවො උදුර ගන්න මට බෑ. ඒ දරුවො දෙන්න අරනාය ළඟ තියල ඔයාට මං ළඟට එන්න පුළුවන්ද? ඒ දරුවන්ගේ අනාගතේ ඔයා...."

ශානුක බොහෝ දුරදිග බලා තීරණ ගන්නෙකි. ඒත් මා ජීවත් වූයේ හැඟීම් එක්කය. මගේ අම්මා තාත්තා මිය ගියේ අසාවෙනි. ඔවුන් ප්‍රාර්ථන කළේ මා ශානුක සමගින් සතුටින් ජීවත් වීමය. ඉතිං මගේ අරමුණ එයින් තොරවිය යුතු නොවේ. අරනාය මගේ ජීවිතයට ආවේ වැරදීමකිනි. වැරදි ආකාරයෙනි. මම සියලු වැරදි අරනාය වෙත පටවා දැම්මෙමි. එවිට හිත නිදහස්ය. මාද නිදහස්ය.

"ඇයි ආවෙ..."

ශානුක ඇසුවේය.

"අරනාය පන්සලට යමුලු... දරුවො එක්ක"

"හා ගිහින් එන්න"

දෙවියනි මා එවන් දෙයක් ශානුකගෙන් ඇසීමත් වැරදිය. ඔහු කෙතරම් අපහසුතාවයකට ලක් වෙනවාද? හදවතේ සතුට නැතිවී ගොසිනි. පුංචි සුදු පුතා දෝතින් අරගෙන මම වාහනයෙන්

බැස්සෙමි. අරනා දියණිය අරගෙන බැස්සේය. ඇස් දෙකට කඳුළු ඇවිත්ය.

"සමහර විට මේ අපි හතර දෙනා එකට ඉන්න මුල්ම දවසත් අන්තිම දවසත් වෙන්න ඇති..."

අරනා කීවේය. මම මල් පූජා කළෙමි. පන්සලේ උන් බොහෝ අය දරුවන් දෙස බැලූහ. එතරම්ම දරුවන් ලස්සනය. සොඳුරුය. අරනා බොහෝ සතුටකින් උන්නේය. අරනාගේ දුක්ගත් මුහුණත් දකින්න මා ආශා නැත. මට දුක හිතෙයි. ඒ මුහුණ බැලූ විට මට තීරණ ගන්න බැරිය.

"මොනවද ප්‍රාර්ථනා කළේ..."

අරනා ඇසුවේය.

"ඔයයි දරුවො දෙන්නයි හුගක් සතුටින් තියන්න කියලා"

මම කීවෙමි. අරනා මගේ අතක් අල්වා අතැරියේය.

"ඔයා නැතිව අපට සතුට කොයින්ද...?"

අරනා ඇසුවේය.

"අරනා..."

"මං ඉල්ලුවෙ ඔයාව අපට දෙන්න කියල... අපට ඔයාව ඕන ආයු... වැරදීමකින් අහම්බෙන් නරක විදිහට හම්බඋනත් ඔයයි මායි පහුගිය ආත්මෙක එකට ඉඳල ඇති. මං ඔයාට දුක් දෙන්න ඇති. ඒකයි ඔයා මාව මෙහෙම අත් ඇරල යන්න ඇත්තෙ..."





ඔහු ඔහේ කියවයි.

ඔය කියවන්නේ දුකට බව දන්නෙමි. මේ ආත්මයේ දී නම් ඔහු හා එක්වන්නට මට බැරිය. ශානුක මගේ සැමියාය.

"හැම මාධ්‍යයක්ම බලා ඉන්නවා. අපට දන් මඩ ගහන්න අකමැති නිසා මේක සංවේදී ප්‍රශ්නයක් නිසා මධ්‍ය නිහඬව ඉන්නවා. ඒත් මං ගන්න තීරණේ ඒ අයට හුගක් වැදගත් වෙයි."

"ඔයා මිනිස්සුන්ටද බය"

"අපි අපට වඩා බයවෙන්න ඕන අපිත් එක්ක ඉන්න මිනිස්සුන්ට තමයි අරනා"

අරනා කතා කළේ නැත. මොහොතකත් අපි දරුවන් දෙස බලා උන්නෙමු. මවක නැති දරුවන්...

"ශානුක රට යනවමද? ඒ තීරණේ වෙනස් උනානං දරුවන්ට ඔයාව දකින්නවත් තිබුණා"

අරනා කීවේය. ඔහු කියනා හැම වචනයකදීම මට දුක දනෙයි. මොන ප්‍රශ්න විසඳුවත් මේ ප්‍රශ්නයට නම් විසඳුම් නැත. මේ වෙලාවේ හොඳම දෙය සියලු ප්‍රශ්න වලින් මිදී දරුවන් එක්ක හිදීමය. ඉතිං මම අනාගතය ගැන නොසිතා උන්නෙමි.

"මේ කිසි දේකට ඔයා වැරදි නෑ..."

අරනා කීවේ රිය පදවන අතරතුරදීය.

"බඩගිනියි..."



http://e-pusthakalaya.blogspot.com

මම හිනැහී කීවෙමි. අරනාවද හිනා ආවේය. ඔහු වහා රිය කඩයක් ළඟ නතර කළේය.

"මොනවද ගේන්න ඕන..."

"බත් අරන් මගදී කමු."

අරනාගෙ ඇස් මදෙස මොහොතක් බලා උන්නේය. එය මහා දුක හිතෙනා බැල්මකි.

"බත් දෙකක් එපා එකක් ගේන්න."

මම ආයේ කීවෙමි. අරනා මා කීදේ එලෙසම කළා මිසක කිසිවක් නොකීවේය. අතරමග සෙවනක් ළඟ මම රිය නතර කරවන්න කීවෙමි. මේ උදයටත් නැති දවාලටත් නැති වෙලාවකි.

"කමුද..."

"මෙතන..."

"ඔව්."

"හා.."

අරනා බත් මුල ලිහා ගත්තේය. දරුවන් නින්දේය.

"මට බත් කවන්න"

මම කීවෙමි. අරනා වහා බත් මුල ලිහා ගත්තේය. ඔහු මට බත් කැව්වේ සතුටිනි. ආශාවෙනි.

"ඔයත් කන්න."



http://e-pusthakalaya.blogspot.com



මම කීවෙමි. අරනා බත් කටවල් දෙක තුනකට වඩා නොකෑවේය.

"ඔයාට මේ දේවල් මතක් වෙද්දි දුක හිතෙයි. ඒ නිසා මට වෛර කර කර යන්න."

අරනා කීවේය.

"ඉන්න ටිකේ සතුටින් ඉමු"

මම අරනාට කීවෙමි.

ශානුක මේ දවස්වල වෙහෙස වූයේ අපේ පිටරට ගමනටය. ඒ සඳහා ඔහු නිතර ගෙදරින් නික්ම ගියේය.

"ශානුක හරිම හොඳ මිනිස්සයෙක්"

අරනා කීවේය.

මට හිතුණේ ශානුකට මේ දරුවන් දැකීමත් වේදනාවක් බවය. දරුවන් දකිද්දී ඔහුගේ හිත වේදනාවට පත් වන්න ඇත. බොහෝ විට ඔහු මුළු දවසේම ගෙදර රැඳුනේ නැත. හදවතට එන සමහර සිතුවිලි වලදී අනාගතය ගැන දැනුණේ බියකි. ඒත් මේ පටලැවිලි ජීවිතය ලිහා ගත යුතුය. ශානුක අත්හැරීම පවක් සේම මට ශානුක අත් හැරීම කළ නොහැක්කකි. අරනාත් මාත් අතර අත්හැරිය නොහැකි තරමේ බැඳීමක් නැත. මම හදවත පිරිසිදු කර ගමි. ඒත් ඇත්තටම එහෙම සම්බන්ධයක් අප අතර නොවූයෙම්ද? අප අතර තිබුනේ කිනම් වූ බැඳීමක්ද? එය ශානුක හා මා අතර වූ විවාහ බැඳීම නොවූ බව සැබෑය. විවාහය යන

තීතිමය බැඳීමක් වුනත් ඊට එහා ගිය සෙනෙහසේ බැඳීමක් අප අතර නොවුනේ යැයි කියන්නේ, හිතන්නේ කොහොමද?.

ඉතිං මම තවත් මා නොරවටන්නෙමි. ශානුක හොඳ යහපත් ගති ඇති මිනිසෙකි. ඔහු මනුෂ්‍යත්වයේ ගුණාංග පිරි අයෙකි. ඒත් ඔහුත් මාත් අතර වූ විවාහයේදී ඔහු මා ඇසුරේ ගෙවූ දිනක් නැති තරම්ය. ඔහුට ඕනෑ තරම් මිතුරන් උන්නේය. ඔහු ඉදිරියේ වෙනමම මාධ්‍ය ලෝකයක් විය. මා වෙනුවෙන් පැයක් නොවේ ඊටත් අඩු කාලයක් ගන්නට ඔහුට බැරි විය. විටෙක ඔහු රැයේත් වැඩ කළේය. ලිපි ලිවේය. ඔහුගේ වැඩ නිමා වද්දී එක්කෝ මා නින්දේය. නොවේ නම් වෙහෙස වී ය. අරනා තුළින් මා දුටුවේ තරුණකම ජවය විතරක් නොවේ. ඔහු හැඟීම්බර මිනිසෙක් වූයේය. මහා ප්‍රේමයක් ඔහුගේ හදවතේ විය. ඔහුගේ ලෝකයේ සියල්ලටම වඩා අගනා වූයේ මාය. සියල්ලටම වඩා ඔහුට වටිනා වූයේ මාය. ඔහුට මා වෙනුවෙන් මුළු ලොවම අත්හළ හැක. ජීවිතයේ මා තරම් සුවිශේෂී වූ යමක් ඔහුට මුළු ලොවම වූයේ නැත. ඒ සිතුම් පැතුම්... ඒ හැඟීම් එක්ක ජීවත් වන්නට අකමැති තරුණියක හෝ ගැහැනියක නැතැයි මට සිතුණු වාර අනන්තය. මා එක සැරයක් ඔහු සිහි කරද්දී ඔහු මා සිය දහස් වාරයක් සිහි කර ඇත්තේය.

ඉතිං මා අතහැර යන්නේ මා දමා යන්නේ එතරම්ම පෙම්වත් මිනිසෙකි. එතරම්ම ප්‍රේමය... ආදරය හඳුනන මිනිසෙකි.

මා මෙහෙම තීරණයක ඉන්නේ ඇයි?...

ඇත්තම නම් එයට හේතුව මා පුංචි දා පටන් හැදුනු වැඩුනු ජීවත් වූ පරිසරයයි. අම්මා තාත්තා මා හැදුවේ ලෝකයෙන්, එහි ඇති විෂම දේවලින් මා ඈත් කර තබාය. මට එපිට ලෝකයේ



http://e-pusthakalaya.blogspot.com

හොඳ දේ වෙනත්.... ඒ හොඳ දෙයෙහි නරක් දේත්....ගැබ්ව ඇති නිසා එය මට පහදා ගන්න බැරියැයි මගේ දෙමාපියෝ සිතූහ. එනිසා ඔවුන් මා තනිව හැදුවේය. සම්පූර්ණයෙන්ම මා තනි ජීවිතයක් විය. මා ශානුක එක්ක විවාහ වූයේ දෙමාපියන්ගේ කැමැත්තටය. සියලු දෙයට වඩා අගනේ ගෞරවයැයි සිතූ මගේ දෙමාපියන් ඒ ගෞරවය මට රැක ගන්නට නොහැකිවූ දා ජීවිතය අතහැර ගියේය. ඉතිං අද මට මගේ දෙමාපියන් නැතිව මගේ ජීවිතය ගැන හොඳම තීරණය ගන්නට සිදුව තියේ. මා මේ වෙලාවේ ශානුක තෝරා ගත්තෙමි. ඇත්තම නම් ඒ මගේ නොවේ දෙමාපියන්ගේ තීරණයය.

තම සැමියා නිසා බොහෝ දුක් ඉඟිලූ බිරිඳක් සියලු කර දුර කර මත තබා ගත් ගැහැනියක්.... තම සැමියා සොයා ගන්නට විතරක් ජීවත් වූ බිරිඳක්. ඉතිං ඒ බිරිඳ අනිවාර්යෙන්ම බාගිර බලවේග අතහැර තම සැමියා සොයා ගත් සතුට භුක්ති විඳිය යුතුය. හදිසියේ අත්වැරදීමකින් උපන් දරුවන්ට වඩා වටින්නේ බොහෝ පෙරුම් පුරා ලබා ගත් සැමියාය. ඒ මගේ දෙමාපියන් මියගියත් ඔවුන්ගේ දර්ශනයකි. ඉතිං මගේ දෙමාපියන් ජීවත්ව හිටියා නම් මෙසේ කියන්නේය.

"අහපං දුවේ.... ඔය දරුවෝ දෙන්නා උඹට ලැබුනෙ උඹේ කැමැත්තෙන්ද.... නෑ අරූ කරපු පාහර වැඩේ නිසා දරුවෝ ලැබුනෙ. ඒ වගේම උඹේ මහත්තයා ශානුක උඹ මේ හැම දේම ඉවසුවෙ දුක්වින්දෙ ශානුකව බේරගන්න. ඒ මනුස්සය රත්තරන්. කවදාවත් උඹේ හිත රිදවල තියෙනවද? ඉතිං... උඹ ශානුක එක්ක සතුටින් ජීවත් වෙයං. දරුවෝ හදපු එකාටම දරුවෝ භාර දීපං..."

අම්මාත් තාත්තාත් එහෙම කියනා බව විශ්වාසය. ඉතිං තවත් මා මගේ දෙමාපියන්ගේ අභිලාෂය... ප්‍රාර්ථනාව සිඳ බිඳ දමන්නේත් ඇයි? ප්‍රංචිම කාලේ පටන් මා වටකොට ගත් මහා පවුර කඩා බිඳ දමන්නට මට උවමනා වූයේ නැත. මේ ප්‍රශ්නයේදී බුද්ධිමත් වන්නට හෝ තර්කානුකූල වන්නට හෝ ඥානවන්ත වන්නට හෝ හැඟීම්බර වන්නටත් මට වුවමනා වූයේ නැත.

"මාත් එක්ක මේ දවස් ටිකේ ඇවිදිමුද? ඒ ඇති වෙයි මට ජීවත් වෙන්න."

අරනාෂ ඉල්ලුවේ එහෙමය. ඒත් ඔහු එක්ක ඇවිදීමේදී මේ බැඳීම තවත් වැඩිවන බව මම දැන උන්නෙමි. ඒත් ඔහු ප්‍රතික්ෂේප කරන්න්නත් බැරිය.

"මගෙ ඔලුව රිදෙනවා.. ටිකක් සනීප මදි"

"බෙහෙත් ටිකක් ගමු..."

"නෑ අඩුවෙයි."

මම බොරු කීවෙමි. අරනාෂයත් දරු දෙදෙනාත් හිතට වදයක් වෙද්දී මට හිතුණේ ඉක්මනටම රට ගමන හරි යනවානම් කියාය. මම එයට ඇඟිලි ගැන්නෙමි. මේ බැඳීම්වලින් ඉවත් විය යුතුය. නොවේ නම් මහා වේදනාවක් මට දරන්න සිදු වේ. මම මාරුවෙන් මාරුවට දරුවන්ට කිරි දෙමි. මාරුවෙන් මාරුවට දරුවන් කකුලේ දමා නිදි ගන්වමි. මේ මා කරනා දේවල් දරුවන් වෙනුවෙන් ඔහු කරන්නේ කොහොමද?. ඔහුගේ ව්‍යාපාරික වැඩ කරගන්න අවශ්‍ය නිසා ඔහුට සේවිකාවක් ගන්නට සිදුවනු ඇත.





ඇය කෙබඳු වේද? මම අසරණ දරු දෙන්නා දෙස බලා උන්නෙමි. පපුව හෝස් ගායි. හදවත හඬා වැටෙයි.

මේ කුමන දුකක්ද? දරුවන් දමා දුර රටකට යන්නේ කොහොමද? අසරණ දරුවන් මා සොයා වැළපෙනු ඇත. අරනාෂ දරුවන් හදා ගන්නේ කොහොමද?. දෙවියනි මා කුමන අම්මා කෙනෙක්ද?.

"ආයු..."

ගානුක ඇවිත් මදෙස බලා හිඳී. ඔහු බොහෝ වේලා මදෙස බලා ඉන්න ඇත.

"දුක් වෙනව නේද?"

ඔහු ඇසුවේය. මම නොදෙඩුවෙමි. දුක සතුට ගැන හැඟීමක් දැන් මට නැති තරම්ය. දුක් වන්නේ දරුවන් ගැන මිස මගේ සතුට හෝ මගේ ජීවිතය ගැන නොවේ.

"තාමත් ඔයා පරක්කු නෑ..."

ගානුක කීවේ මට මුදු සිනා පාය.

"මොකටද..?"

"ඔයා මාත් එක්ක යන්න ඕන නෑ. ඔයා දරුවෝ එක්ක ඉන්න."

"බැහැ"

"ඔයාගෙ හදවත ඔයාට දොස් කියයි."

http://e-pusthakalaya.blogspot.com

"මේ දරුවො මගෙ කැමැත්තෙන් ඉපදුනාද?"

මම හිතක් පපුවක් නැති අම්මා කෙනෙකු වාගේ ඇසුවෙමි.

"ඔයා මං නිසා ඔයාගේ ජීවිතේ නරකම වරද කරන්න එපා. අනික ඔයාගෙ හදවත ඔයාට සමාව දෙන එකක් නෑ."

"ශානු..."

මම ශානුක දෙස බැලුවෙමි.

"කියන්න..."

"ඔයා ඔයාගෙ ජීවිතේ වැඩියම ආදරේ කළේ.. කොටින්ම මටත් වඩා ආදරේ කළේ ඔයාගෙ මාධ්‍ය ජීවිතේට නේද... ලියනවට වඩා ඔයාට වෙන සතුටක් තිබුණේ නෑ නේද?"

ශානුක මදෙස බලා උන්නා මිස නොදෙඩුවේය.

"කියන්න ශානු..."

"වෙන්නැති... වෙන්නැති... ඒත් අද ඒ ගැන මං දුක්වුණා. ඒකයි මං ඒ ජීවිතේ අත් ඇරල රටකට යන්නෙ..."

"මං නිසා නේද ඔයා රටිනුත් යන්නෙ..."

මම ඇසුවෙමි. ශානුක කිසිවක් නොකීවේය. ඒ බර කල්පනාවේ ගිදගෙන මම දුක් වින්දෙමි. අරනය ගැන වගේම ශානුක ගැනත් මම දුක්වූයෙමි.

මගේ සැමියා ශානුකය. මම ඔහුගේ ගතානුගතික සාම්ප්‍රදායානුකූල බිරිඳයි. එයින් එහා ලෝකයක් මට තිබෙන්න විදිහක්





නැත. මම මගේ අතැඟිලි වලින් ඒ ලෝකය බිඳ නොදමමි. සුසාන භූමියට මා ගියේ ඒ බව අම්මාටත් තාත්තාටත් කියන්නටය. අම්මෙ තාත්තේ දිනුම ඔබටයි. පරාජය අනාගතය අත දරා හිඳින මගේ දරුවන්ටයි. ගහ කොළ නිහඬ වී තියේ. දිරාපත් වූ අතු ඉති වලින් සුසාන මිදුල හැඩ වී තියේ. දුක සැප සමව බෙදා ගන්නවුන් ඉන්නේ මෙතනය. මෙහි කෙලෙස් නැත. මම අම්මාගේත් තාත්තාගේත් සොහොන් කොත් දෙස බලා උන්නෙමි.

"දූවත් සමාව දෙන්න. ඔයාලට ලැජ්ජ කරන්නෙ නෑ. මං යන්නම යනවා..."

මම නිවෙමි. දෑස් පියවා මොහොතක් භාවනාවේ උන්නෙමි.

"නැගිටපන්"

මා ඇස් ඇරියේ ඒ හඬටය. දාමරික මුහුණු ඇති පිරිසක් මා ඉදිරියේය.

"ගනිං ඔකිව..."

"කවුද? ඇයි ඇයි මේ..."

මම කෑගැසුවෙමි. ඒත් ඔවුන් මා අත් නොහැර වාහනයකට නංවා ගත්තේය. මම කෑගැසුවෙමි. ලැබුණේ දෙකොපුල් හරහා කම්මුල් පාරකි. එකෙකු මගේ දෑස් බැන්දේය. ජීවිතය ඉතිං අවසන්ය. මම අවසන් වරට කියා මගේ දරුවන් සිහි කළෙමි. අන්ධකාරය මිස වාහනයේ හඬ මිස වෙන කිසිවක් මා ඉදිරියේ නොතිබිණි. රිය නතර වී මා ඇදගෙන ගොස් තල්ලු කර දැම්මේය. ඇස් ආවරණ



http://e-pusthakalaya.blogspot.com

ඉවත් විය. කිසිදිනෙක දක නැති තරුණයකු මා ඉදිරියේය. ඔහු උස් හඬින් හිනැහිනි.

"අඳුරනවද මාව..."

මගෙන් වචන පිට නොවිණි.

"භූපතිගෙ ලොකු පුතා..."

කාරණය පැහැදිලි විය. උගුලකට හසුවූයේ කොහොමද?"

"තමුසෙල එළියෙ ඉන්නවා. මට මෙකි එක්ක ගනුදෙනුවක් තියෙනවා..."

ඔහු රැගෙන ආ අය පිටවූහ. භූපතිගේ පුතා වූ තරංග සූරියපෙරුම හා මා පමණක් කාමරයේ ඉතිරි විය.

"තමුසෙව මෙහෙම ගෙනාව කියල කවුරුත් දන්නෑ. මරල හංගන්න වුණත් මට පුළුවන්. ඒත් අපේ තාත්තා වගේ මඩක් නාගන්න මට ඕන නෑ. මං තමුසෙව ගෙනාවෙ දැනුම් දීමක් කරන්න. තමුසෙ ශානුක එක්ක රට යන ගමනට ලෑස්ති වෙන්න ඕන..."

"හේතුව..."

මම ඇසුවෙමි. තරංග හිනැහුණේය.

"හේතුව... අරූ... අර අරනා... ඌ තමුසෙට මැරිගෙන ආදරේ කරනවා. අපේ තාත්තා එයාගෙ සේරම දේපල උගෙ අම්මට ලියල... ඌ නිසා අපේ පවුල් විනාශ වුණා. මට ඕන ඌ ජීවිත කාලෙම දුකින් ඉන්නවා බලන්න... තමුසෙ ගියොත් උාට ආත්මයක් නෑ..."





මම තරංග දෙස බලා උන්නෙමි.

"මොකෝ කියන්නෙ"

තරංග මගේ හිස කෙසින් අල්වා ගත්තේය.

"නොගියොත් උඹේ දරුවො දෙන්නව මරල හංගනවා. දරුවො දෙන්නව අරනාට තියල උඹ රට පලයං. මට ඕන අරනා විදෝනව බලන්න. අරනාට උඹෙන් තොර ලෝකයක් නැතෙ. ඌ තාත්තාව හිරේ යවන්න සම්පූර්ණයෙන් දායක වුණා. ඒ උඹ නිසා. උඹට ඌ හුගක් ආදරෙයිනෙ. මට ඕන උඹ රට ගියාම ඌ දරුවො එක්ක විදෝනව බලන්න. තාත්තා හිරේ ගියාට වඩා ඌ විදවන්න වෙයි එතකොට..."

දැන් සියල්ල වැටහෙයි. භූපතිගේ ජානය, භූපතිගේ ලේය. මෙ ගැන පුදුම විය යුතු නැත. පුදුමය නම් අරනා මේ ගතිගුණ වලින් සම්පූර්ණයෙන්ම ඉවත් වූ කෙනෙකු වීමය. ඔහුට තියෙන්න ඇත්තේ ඔහුගේ මවගේ යහ ගුණ වන්න ඇත.

"පොරොන්දු වෙයං..."

"පොරොන්දු වෙන්න දෙයක් නෑ. මං කොහොමටත් ශානුක එක්ක යනවා. අරනා භූපතිගෙ පුතා මිසක් තමුසෙගෙ මල්ලි මිසක් මගෙ කවුරුත් නෙමේ..."

මම කීවෙමි. තරංග ඉන් සෑහීමකට පත්විණි. ඔහු ඔහුගේ සගයන් මා ගෙදර ඇරලවා එන්නට කීවේය. මා වාහනයෙන් බහිද්දී අරනා පෙරමග බලා උන්නේය.

"ඒ තරංගගෙ කට්ටිය..."



http://e-pusthakalaya.blogspot.com

අරනාය ඔහුගේ සහෝදරයාගේ පිරිස අඳුනා ගත්තේය.

"උන්ව දන්නෙ කොහොමද? කොහෙද ගියේ?"

අරනාය උන්නේ බියවීය. මම සිදු වූ සියලු දේ ඔහුට කීවෙමි. අරනාය වාගේම ශානුකත් අසා උන්නේය. අරනාය බිය නොවීද ශානුක බිය විය.

"ඔයාට මෙහේ ආරක්ෂාව නෑ ආයු... අපි ඉක්මනටම යමු..."

ශානුක කීවේය.

අරනාය කිසිවක්ම කීවේ නැත. මම අරනායගේ මුහුණ බැලුවෙමි.

"තරංගට හරි.... මැර දේශපාලනයට හරි බයේනම් යන්න එපා. ඔයා වගේ කෙනෙක් කවදාවත් එහෙම කරන්න එපා ශානුක...."

අරනාය කීවේය.

"අපි යනවා....අරනාය. ඒක මගෙ අන්තිම තීරණේ...."

මම අරනායට කීවෙමි. දින ගණනක් ඇතුලතදී පිට රට ගමනේ සියලු කටයුතු සූදානම් වී අවසන් වී තිබිණි.

"හෙට නෙමේ අනිද්දා අපි යනවා...."

ශානුක කීවේ මටය. අරනාය අපහසුවට පත් වන බව මම දැන උන්නෙමි. හේතුවක් නැතිව මමද වේදනාවට පත් වී උන්නෙමි.





අරනායගේ ඇස් දෙක මහා දුකක් මට ඉතිරි කර තබන්නේ ඇයි?.... ඔහු ගැන වේදනාවක් දැනෙන්නේ ඇයි? මා ගිය පසු ඔහු තනිවෙයි. ඔහුට කිසිවකුත් නැත. ඒ දින දෙකත් ගෙවී ගියේය. දැන් ඉතිං අප තික්ම යා යුතුව තියේ.... මම දරු දෙන්නා තුරුළු කරගෙන උන්නෙමි. එකම කඳුළක් ඇස් දෙකෙන් නොසොල්වා බලා උන්නෙමි.

"මා යුතුව ඇත. දරුවනි නුඹේ අනාගතය රැකෙන්නේත් මගේ අභිනිෂ්ක්‍රමනෙන් පසුවය ."

යන්තම් අඳුරු කළ අහස දෙස හැල්මේ බලාගෙන අරනාය සුසුමක් හෙළුවේය. ඔහු ජීවිත කාලයේම විඳවන බව මම දන්නෙමි. අපට කළ හැකි දෙයක් නැත. සමහර විට මේ මා ගත් හොඳම තීරණය නොවන්නත් පුළුවන. මුලු ජීවිත කාලයේම ඔහුට වාගේම මටද විඳවන්න වනු ඇත. හදවත හඬා වැටෙයි. අතැර යන්න හැදුවාට හදවත ආපස්සට අදියි. අරනාය ගැන මෙතරම් ලෝබකමක් සිත ඉතිරි කර ගත්තේ කවදාද?.

"අරනාය...."

මම අරනාය වෙත ගියෙමි. ඔහු හැරී බැලුවේ නැත.

"අරනාය...."

මම කතා කළෙමි.

ඔහු හැරී බැලුවේ ඉන් පසුවය.

"යනවද?"



http://e-pusthakalaya.blogspot.com

"ඔව්"

මම කෙටි පිළිතුරක් දුන්නෙමි. අරනා අත මිට මොලවා වැරෙන් ජනේලය බිත්තියට ගැසුවේය.

"අරනා..."

ශානුක කෑගැසුවේය. මම නොහඬා නොතැවී බලා උන්නෙමි.

"මං හිතනවා මගේ තීරණේ හරියට හරි කියලා..."

බොහෝ සෙමිහිට මම ආයෙ කීවෙමි.

අරනා මගේ ළඟට මගේ ළඟටම ආවේය.

"මට සමාවෙන්න..."

ඔහු කීවේය. මම කිසිවක් නොකීවෙමි. අරනා ශානුක ගැනවත් නොහිතා මා තුරුලු කර ගත්තේය. එහි වූයේ වේදනාවය.

"තව සැරයක් හිතන්න.... මට පාලුයි. මට කවුරුත් නෑ.... ඔයා ඇරෙන්න කවුරුත්ම නෑ...."

"මගෙ දරුවො බලාගන්න..."

මම කීවෙමි.

"ආයු..."

මම අරනාගෙන් ඉවත් වූයෙමි. සදා කාලයටම.... සදා කාලයටම ඉවත් වූයෙමි.



12

## "ආයු"

මේ වර්තමානයයි. ගුවන් ගමන අවසන්ය. ඕස්ට්‍රේලියා බිමට පය තැබුවෙමු. ශානුක මගේ අත් දෙකම අල්වා ගත්තේය.

"මේක සාධාරණ නෑ..."

"ශානුක..."

"අරනා වරද කාරයෙක් නෙමෙ. එයා ඔයාට පණටත් වඩා ආදරෙයි... මං ඔයාට එච්චර ආදරේ කළේ නෑ. කළා නං ඒ අරනා. අරනාගෙ ආදරේ ගැන මට හිතා ගන්නවත් බෑ..."

තවත් නොහඬා ඉන්න බැරි විය. දරුවත් වෙනුවෙන් ගලා යන කිරි තරමටම මම නොවැළපුනෙම්ද? මම ශානුකගේ කමිසයේ එල්ලී හැඩුවෙමි. ඉකි බිඳ බිඳ හැඬුවෙමි.



http://e-pusthakalaya.blogspot.com

"ඔයා අරනාථට ආදරෙයි..."

"ශානු..."

"ඔයා ආදරේ කරන්නෙ අරනාථයට."

"ඔව්. ඒක හොඳ දෙයක්ද මං දන්නෙ නෑ. ඒත් මං අරනාථට ආදරෙයි... මටම තේරෙන්නෙ නෑ..."

"ඒක හරි දරුවො... ඒක තමයි වෙන්න ඕන... ඔයා ආයෙ ලංකාවට යන්න... මං ඩිවෝස් එක දෙන්නං. දෙන්න කසාද බඳින්න. ඊයේ..."

"ඒත් ශානුක මට බෑ ඔයාව අතරමං කරන්න..."

"එහෙම දෙයක් නෑ... ජීවිතේ සමහර වෙලාවට මෙහෙම පරීක්ෂණ කරනවා... මේක පරීක්ෂණයක්... යන්න... කවදාවත් අඬන්න එපා..."

ශානුක කීවේය. ලොකු ලෙංගතුකමකින් මගේ හිස අත ගෑවේය.

* * * * * * *

ඉතිං මම ආයේ ලංකාවී ආවෙමි. මගේ රටට... මගේ දරුවන් වෙත ආවෙමි. ත්‍රීරෝද රියකින් ඇවිත් රහසේම ගෙට ගොඩවීමි.

"දෙයියනේ නෝනෙ..."



http://e-pusthakalaya.blogspot.com



කිරි අම්මාගේ ඇස් වලින් මා දුක කඳුළු පැන්නාය. දරුවන් හඬනා හඬ ඇසෙයි.

"දොයි දොයි දොයි......"

"අම්මා නුඹෙ කිරට ගියා...." අරනාථ වරින් වර ඉකිබිඳියි. මම හෙමින් දොර තිරය ඇත් කළෙමි. දියණිය විලාප තබයි. දියණිය තුරුළු කරගෙන අරනාථ හඬයි.

"නෝනෙ ගිය දවසෙ ඉඳන්ම මෙහෙමයි..."

කිරි අම්මා කඳුළු සැලුවාය. මම දොර තිරය ඇත් කර කාමරයේ හිට ගත්තෙමි. අරනාථ දෑස මසවා බැලුවේය.

"ආයු..."

අරනාථ දියණිය යහනේ තැබුවේය.

"ආයු..."

"මං ඔස්ට්‍රේලියාවට ගිහින් ආයෙ ආවා... ඔයාට දරුවන්ට මාව ඕනෙ..."

අරනාථ මා වැළඳ ගත්තේය.

"ඉන්න දරුවො අඬනවා..."

මං දරුවන්ට කිරි දුන්නෙමි. හඬමින් කිරි දුන්නෙමි. දරුවන් නිදා ගත්තේය.

"ඊ එළිවෙනකම් ඇඬුවා..."

අරනා කීවේය. මම කිසිවක් නොකියා ඔහු දෙස බලා උන්නෙමි.

"අරනා..."

අරනා මගේ හිස අතගා මගේ මුවට අත තැබුවේය. ඊළඟට ඔහු කළේ මා ඔසවා ගැනීමය.

"වැටෙයි අරනා"

ඒත් ඔහු ඇසුවේ නැත. ඔහු කළේ මා ඔසවාගෙන මුළු ගේ පුරාම දිවීමය.

"ශානුකගෙන් කෝල් එකක්. මාව දැන්වත් බිමින් තියන්න..."

"මෙහෙම ඉඳන් කතා කරන්න..."

අරනා කීවේය.

"ශානුක"

"සතුටින් ඉන්න... කෝ අරනා"

මම අරනාගේ කනට දුරකතනය තැබුවෙමි.

"ශානුක... මට ඔයාට කියන්න දෙයක් නෑ........"

"එයාව බලාගන්න අරනා..."

"මගෙ පණ වගේ..."

"මං දන්නවා අරනා. ඔයා තරං එයාව බලා ගන්න කෙනෙක් නෑ... එයාව කසාද බඳින්න..."



http://e-pusthakalaya.blogspot.com



ශානුක කීවේය.

"දැන්වත් මාව බිමින් තියන්න.

අරනා මා බිමින් තැබුවේය.

ජීවිතය දුක් කරදර දුන්නත් සතුටත් ගෙනාවේය. අරනාත් මමත් විවාහ වීමු. කාලය ඉගිල ගොසිනි. දැන් අපේ දරුවන් අවුරුදු හතරක දරුවන්ය. අරනා දරුවන්ට පණ වාගේය. මට ආදරේ කරන්නේද දරුවන්ට වාගේය. එතරම්ම ආදරයක් මේ ජීවිතයේදී ලැබීමත් පිනකි. අරනාගේ තුරුලේ ජීවත් වන්නත්... මිය යන්නත් ඇරෙන්න මට වෙන සතුටක් දැන් නැත.

නිමි.

අරනෘ කීවේය. මම කිසිවක් නොකියා ඔහු දෙස බලා උන්නෙමි.

"අරනෘ..."

අරනෘ මගේ හිස අතගා මගේ මුවට අත තැබුවේය. ඊළඟට ඔහු කළේ මා ඔසවා ගැනීමය.

"වැටෙයි අරනෘ"

ඒත් ඔහු ඇසුවේ නැත. ඔහු කළේ මා ඔසවාගෙන මුලු ගේ පුරාම දිවීමය.

"ශානුකගෙන් කෝල් එකක්. මාව දූන්වත් බිමින් තියන්න..."

"මෙහෙම ඉඳන් කතා කරන්න..."

අරනෘ කීවේය.

"ශානුක"

"සතුටින් ඉන්න... කෝ අරනෘ"

මම අරනෘගේ කනට දුරකතනය තැබුවෙමි.

"ශානුක... මට ඔයාට කියන්න දෙයක් නෑ........"

"එයාව බලාගන්න අරනෘ..."

"මගෙ පණ වගේ..."

"මං දන්නවා අරනෘ. ඔයා තරං එයාව බලා ගන්න කෙනෙක් නෑ... එයාව කසාද බඳින්න..."





ශානුක කීවේය.

"දූන්වත් මාව බිමින් තියන්න.

අරනෘ මා බිමින් තැබුවේය.

ජීවිතය දුක් කරදර දුන්නත් සතුටත් ගෙනාවේය. අරනෘත් මමත් විවාහ වීමු. කාලය ඉගිල ගොසිනි. දැන් අපේ දරුවන් අවුරුදු හතරක දරුවන්ය. අරනෘ දරුවන්ට පණ වාගේය. මට ආදරේ කරන්නේද දරුවන්ට වාගේය. එතරම්ම ආදරයක් මේ ජීවිතයේදී ලැබීමත් පිනකි. අරනෘගේ තුරුලේ ජීවත් වන්නත්... මිය යන්නත් ඇරෙන්න මට වෙන සතුටක් දැන් නැත.

නිමි.



http://e-pusth…a.blogspot.com

Re Upload By
www.sinhalaelibrary.com

තම කාලය, ශ්‍රමය වැය කරමින් අන්තර්ජාලයට මෙම
පොත් එක්කල සියල්ලන්ටම අපගේ හෘදයාංගම
ස්තුතිය පුදකරමි!